SGPC/A/SPC/2022/08

**ආණ්ඩුකාරතුමා,**

**සබරගමුව පළාත.**

**සබරගමුව පළාත් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව**

---

**1.5.11 ශීර්ෂ අංක - 814 - පළාත් පාලන දෙපාර්තමේන්තුව**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්** | **නිර්දේශය** |
|---|---|---|
| පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් ආදායම් ඒකරාශි කිරීමේ සැලැස්මක් හා ආදායම් අයකිරීමේ ප්‍රගතිය කාර්තුමය වශයෙන් විමර්ශනය කිරීමක් සිදුකර නොතිබුණි. මේ නිසා පළාතේ පළාත් පාලන ආයතනවල 2022 දෙසැම්බර් 31 දිනට හිඟ සහ ප්‍රවර්තන ආදායම් අයකිරීමේ ප්‍රගතිය සියයට 50 ට වඩා අඩු ප්‍රතිශතයක පැවැතිණි. | ආදායම් අයකරගැනීමේ ප්‍රගතිය ඉහළ නංවා ගැනීමට කටයුතු කරන බව | ආදායම් ඒකරාශි කිරීමේ සැලැස්මක් සකස් කර ආදායම් අයකිරීමේ ප්‍රගතිය ඉහළ නංවා ගත යුතු ය. |

**1.5.11.1 රත්නපුර මහ නගර සභාව**

**1.5.11.1.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | එකතුව රු.37,248,283ක් වූ ගොඩනැගිලි 15ක්, අක්කර 02 පර්චස් 18.5ක් වූ ඉඩම් 02ක්, ලී බඩු හා සවිකිරීම්, CCTV කැමරා | 2023 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | පද්ධතිය හා පරිත්‍යාග වශයෙන් ලද පුස්තකාල පොත් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | | |
| (ii) | ඉකුත් වර්ෂවල ඉවත් කළ සහ වෙනත් ආයතනවලට පවරා දුන් ඉඩම් හා ගොඩනැගිලි 14ක හා පුස්තකාල පොත්වල වටිනාකම රු.231,025ක් වත්කම් ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම - |
| (iii) | ඉදිකිරීම් කර්මාන්ත සඳහා ඉකුත් වර්ෂවල දී මිල ගත් අමුද්‍රව්‍ය පිරිවැය රු.1,095,610ක් හා ජල ව්‍යාපෘති සඳහා මිල දී ගෙන තිබුණු ජල මීටර්වල පිරිවැය රු.750,000ක් ලී බඩු හා සවිකිරීම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | - එම - |
| (iv) | කර්මාන්ත 02ක් සඳහා රු.591,910ක් වැඩියෙන් හා තවත් කර්මාන්තයක් සඳහා රු.322,944ක් අඩුවෙන් ණයගැති වෙන්කිරීම් සිදුකර තිබුණි. | ලේඛන පරීක්ෂා කර බලා 2023 ගිණුම්වලින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | - එම - |
| (v) | සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත ණයහිමි වෙන්කිරීම් රු.8,114,333ක් වැඩිපුර ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | - එම - |
| (vi) | ඉකුත් වර්ෂයට අදාළ විගණන ගාස්තු රු.972,000ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | - එම - | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (vii) | ඉකුත් වර්ෂවලට අදාළ කර්මාන්ත වෙනුවෙන් රු.11,108,551ක් විවිධ ණයහිමියන් යටතේ වැඩිපුර ගිණුම්ගත | - එම - | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | කර තිබුණි. | | |
| (viii) | සමාලෝචිත වර්ෂයේදී මිල දී ගත් ලී බඩු හා සවිකිරීම් වටිනාකම රු.178,020ක් වැඩියෙන් ප්‍රාග්ධනිත කර තිබුණු අතර ඉකුත් වර්ෂයක වෙන්දේසි කරන ලද මාර්ග තලනයෙහි වටිනාකම රු.1,000,000ක් මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කර නොතිබුණි. | - එම - | - එම - |
| (ix) | සමාලෝචිත වර්ෂයට අදාළ එකතුව රු.2,531,669ක් වූ වියදම් අයිතම 09ක් සඳහා ණයහිමි වෙන්කිරීම් සිදුකර නොතිබුණි. | - එම - | - එම - |
| (x) | දේශීය ණය සහ සංවර්ධන අරමුදලට 2024 වර්ෂයේදී ගෙවිය යුතු ණය වාරික හා පොළී රු.4,948,780ක් ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි. | ඉදිරි ගිණුම් කටයුතුවල දී මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව සටහන් කිරීමට උපදෙස් දෙන ලද බව. | - එම - |
| (xi) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට කොම්පෝස්ට් තොගයේ වටිනාකම රු.631,005ක් ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ සිට කොම්පෝට් තොගයේ වටිනාකම ගිණුම්ගත කිරීමට සටහන් කර ගත් බව. | - එම - |
| (xii) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට පැවති ජල මීටර්වල වටිනාකම රු.270,000ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | - එම - |
| (xiii) | ගිණුම් විෂයයන් 09ක සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ සහ උපයෝගී ලේඛන අනුව එම ශේෂ අතර රු.70,191,607ක වෙනසක් විය. | දිගු කාලයක සිට පවතින ආරම්භක ශේෂවල වෙනසකි. ඉදිරි වර්ෂයේදී හැකිතාක් දුරට නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | වෙනසට හේතු හඳුනාගෙන නිරවුල් කළ යුතු වේ. |

**(ආ) අධිකාරී බලය නොලත් ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ---------------------- | -------------------------- | ----------- |
| වටිනාකම රු.2,079,074,872ක් වූ ජ'නල් සටහන් 100ක් විධිමත්ව අනුමත කර නොතිබුණු අතර, ජ'නල් වවුචර් ද පිළියෙල කර නොතිබුණි. | ජ'නල් සටහන් 100 සඳහා විධිමත් අනුමැතියක් ලබා ගැනීමට කටයුතු කරන බව. | ජ'නල් සටහන් විධිමත්ව අනුමත කළ යුතුය. |

**(ඇ) විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| | ---------------------- | ------------------------- | ---------- |
| (i) | එකතුව රු.101,531,877ක් වූ ගිණුම් විෂයයන් 05ක් තහවුරු කර ගැනීම සඳහා විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකෙරුණි. | ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යාමට නිලධාරීන් වෙත උපදෙස් ලබා දුන් අතර අවශ්‍ය වූ විට ලේඛන ඉදිරිපත් කරන ලෙස සියලු නිලධාරීන් දැනුවත් කර ඇත. ඉදිරියේදී මෙම ගිණුම් විෂයන්ට අදාළව තොරතුරු විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | විස්තරාත්මක උපලේඛන සකස් කළ යුතු වේ. |
| (ii) | ඍජු ශ්‍රම පදනම මත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී ගබඩාවෙන් නිකුත් කරන ද්‍රව්‍ය හා ඒවායේ වටිනාකම හඳුනාගත හැකි වන පරිදි ලේඛනගත කර නොතිබුණි. මේ නිසා සමාලෝචිත වර්ෂය තුළ ඇස්තමේන්තුගත වටිනාකම රු.4,205,032ක් වූ කර්මාන්ත 13ක් සඳහා කළ වියදම් නිවැරදිව තහවුරු | ඍජු ශ්‍රම පදනම මත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ගබඩාවෙන් නිකුත් කරන ද්‍රව්‍ය හා ඒවායේ වටිනාකම හඳුනාගත හැකි වන පරිදි ක්‍රමවේදයක් සකස් කිරීමට කටයුතු කරන අතර කර්මාන්ත 13 සඳහා වියදම් හඳුනාගෙන ඒවා ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | ද්‍රව්‍ය නිකුත් කිරීම් විධිමත්ව ලේඛනගත කළ යුතු වේ. |

කරගත නොහැකි විය.

**(ඇ) අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 371(5)ට පටහැනිව 2022 ජනවාරි 01 දින ලබා දී තිබුණු එකතුව රු.1,699,740ක් වූ අත්තිකාරම් 02ක් පියවා නොතිබුණු අතර 2001 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළ එකතුව රු.5,313,189ක් වූ කල් ඉකුත් වූ විවිධ තැන්පතු මුදල් රෙගුලාසි 571 (2) ප්‍රකාරව නිරවුල් කර නොතිබුණි. | අත්තිකාරම් පියවා ගැනීමට හා තැන්පතු නිරවුල් කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**1.5.11.1.2 ආදායම් පරිපාලනය**

**(අ) ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ වරිපනම් ශේෂය රු.39,878,569ක් වූ අතර, හිඟ ශේෂය සම්බන්ධයෙන් කාල විශ්ලේෂණයක් නොතිබුණි. | වසර 21ක් පැරණි මෘදුකාංගය මඟින් එම හිඟ ශේෂයට අදාළ කාල විශ්ලේෂණයක් ලබා ගත නොහැකි බව. | කාල විශ්ලේෂණ සකස් කළයුතු අතර හිඟ ආදායම් රැස් කළ යුතු වේ. |
| (ii) | රත්නපුර නගරයේ අනුමත වීදිවල රථවාහන නවතා තැබීමේ ගාස්තු අයකිරීම 2022 වර්ෂයේ පළමු මාස 03 තුළ ටෙන්ඩර් ක්‍රමයට ලබා දීමෙන් රු.437,400ක ආදායමක් උපයා ගැනීමට හැකි වී තිබුණි. පසුව, එම ක්‍රමය වෙනස් | රථවාහන නවතා තැබීමේ ගාස්තු අයකිරීමේ ටෙන්ඩරයෙන් ටෙන්ඩර්කරු ඉවත්වීමෙන් අනතුරුව ප්‍රමාණවත් සේවක පිරිසක් සභාව සතුව නොමැති වීම හේතුවෙන් මීට පෙර ලබා දී තිබූ | අනුමත වීදිවල රථවාහන නවතා තැබීමේ ගාස්තු අයකිරීම ටෙන්ඩර් ක්‍රමයට ක්‍රියාත්මක කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| කර එකතු කරන ආදායමෙන් සියයට 50ක් ලබා දීමේ පදනම මත එම කාර්යය පැවරීම නිසා 2022 වර්ෂයේ අවසාන මාස 09 සඳහා ලද ආදායම රු.781,700ක් පමණක් විය. මේ නිසා 2022 වර්ෂය වෙනුවෙන් රු.781,700ක ආදායමක් අහිමි වී තිබුණි. | අනුමැතිය මත සියයට 50 ක්‍රමයට මුදල් අය කිරීම සිදු කරන ලද බව. | |

### 1.5.11.1.3 මෙහෙයුම් සමාලෝචනය

**(අ) මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | නවනගර ළමා උද්‍යානයේ සවිකිරීම සඳහා 2021 වර්ෂයේදී පරිත්‍යාග වශයෙන් ලද ක්‍රීඩා උපකරණ තොගයක් 2022 දෙසැම්බර් මාසයේදී පරිත්‍යාගකරු වෙත නැවත භාරදුන් බව ලිඛිතව දන්වා තිබුණද, 2023 මැයි 02 දින වන විටත් එම උපකරණ ගබඩාව තුළ නිෂ්කාර්යයව පැවැතිණි. | මෙම ළමා උද්‍යාන භාණ්ඩ නැවත භාරදීමට පරිත්‍යාගකරු දැනුවත් කළ ද, ඒ පිළිබඳව නැවත ප්‍රධාන ලේකම් හා ආණ්ඩුකාරතුමා සමග සාකච්ඡා කරන බව. | ආපසු භාර දීමට හෝ ඵලදායී ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ii) | රත්නපුර පරණ වෙරළුප පාරේ මාළු වෙළඳාම් කරන පුද්ගලයින් 06 දෙනෙකු වැරදිකරුවන් ලෙස අධිකරණ තීන්දු ලැබී තිබුණ ද, ඔවුන් ඉවත් කිරීමට 2023 අප්‍රේල් වනවිටත් කටයුතු කර නොතිබුණි. කෙසේ වුවද, මාළු වෙළඳ ස්ථානයේ ඉදිකිරීම් නිම වන තෙක් ඔවුන් ඉවත් නොකිරීමට මහා නගර සභාව තීරණයක් ගෙන තිබීමෙන් නඩු කටයුතු වෙනුවෙන් | මාළු වෙළඳාම උදෙසා ඉදිකරන පරිශ්‍රයේ ඉදිකිරීම් කටයුතු නිම වන තෙක් ඔවුන් ඉවත් නොකිරීමට මහා නගර සභාව මඟින් තීරණයක් ගෙන ඇති බව. | නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට පෙර ඊට අදාළ විසඳුම් මහා සභාව විසින් නිශ්චය කර තිබිය යුතු වේ. |

රු.316,500ක් වැයකිරීම ප්‍රශ්නගත විය.

**(ආ) කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සභාව තුළ වූ නවීකරණය කිරීම් ඇස්තමේන්තු කර නොතිබුණු අතර නොකළ වැඩ සඳහා රු.50,047ක් ද, පිරිවිතරවලට අනුකූල නොවූ වැඩ සඳහා රු.311,700ක් ද ගෙවා තිබුණි. | මෙම වටිනාකම් අවසන් බිල්පතින් අඩුකර ගත හැක. ඇස්තමේන්තුවක් සකස් නොකළ අතර සැලසුම් හා පිරිවිතර පමණක් ඉදිරිපත් කර ඊට අදාලව මිළ ගණන් කැඳවීම සිදුකර ඇති බව. | වැඩිපුර ගෙවීම් අයකර ගත යුතු වේ. |
| (ii) | මහා නගර සභා ගොඩනැගිල්ලේ විදුලි පද්ධතියේ අලුත්වැඩියාවකදී විදුලි උපාංග සඳහා රු.5,265,787ක් හා ශ්‍රමය දින 1046ක් වැයකර තිබුණි. එහෙත්, ඊට විධිමත් සැලැස්මක් (Electric Drawing) හා පිරිවැය ඇස්තමේන්තුවක් සකස්කර වරලත් විදුලි ඉංජිනේරුවරයෙකු ලවා අනුමත කර නොතිබුණි. | පිරිවැය ඇස්තමේන්තුවක් සකස්කර තිබුණද, එය වරලත් ඉංජිනේරු වරයෙකුගෙන් අනුමත කරගෙන නොමැති බව. විදුලි පද්ධතිය සඳහා පසුව සකසන ලද සැලැස්මක් විගණන අවශ්‍යතා සඳහා ඉදිරිපත් කර ඇති බව. | කර්මාන්තයක් ආරම්භ කිරීමට පෙර අදාළ සැලසුම් හා ඇස්තමේන්තු සකස්කර අනුමත කරගත යුතු වේ. |
| (iii) | රත්නපුර පොදු වෙළඳපොළ ගොඩනැගිල්ලේ වහලය ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවකු වෙත පවරා දී තිබුණද, කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම මත ගිවිසුම අවලංගු කර තිබුණි. මේ නිසා ප්‍රසම්පාදන දැන්වීම් පළකිරීම වෙනුවෙන් ගෙවූ රු.151,632ක් නිශ්ඵල වියදමක් වී තිබුණි. | කොන්ත්‍රාත්කරු කර්මාන්තය ඉටු කිරීමට නොහැකි බව දන්වා ඇති බැවින් ගිවිසුම අහෝසි කිරීමට සිදු වූ බව කාරුණිකව දන්වමි. | කොන්දේසි කඩ කළ ලංසුකරු අසාධු ලේඛනගත කර, ඊළඟ ලංසුකරු ලවා කර්මාන්ත ඵලදායී හා කාර්යක්ෂම ලෙස ලෙස ක්‍රියාත්මක කළ යුතු වේ. |
| (iv) | අධිබලැති ට්‍රාන්ස්පෝමර උපාංග සවිකිරීම සඳහා සභා භූමිය ඉදිරිපස ඉදිකර තිබුණු කුටිය භාවිතයට | කොන්ක්‍රීට් පුවරුවක් මත විදුලි තාරා පැවිය සවිකළ යුතු බවට විදුලිබල මණ්ඩලය විසින් දන්වා තිබුණ ද තාරා | අවශ්‍යතා නිවැරදිව හඳුනාගෙන ඉදිකිරීම් සිදුකළ යුතු වේ. |

| | | |
|---|---|---|
| නොගෙනම 2022 වර්ෂයේදී කඩා ඉවත් කර තිබීමෙන් ඒ සඳහා වැය කරන ලද රු.145,155ක් නිෂ්ඵල වියදමක් වී තිබුණි. | පැවිය සවිකර ඇත්තේ අධි ආතති කම්බි කණුව මත වේ.එම නිසා කුටිය ඉවත් කිරීමට තීරණය කළ බව. | |

**(ඇ) වාහන කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ------------------------ | ------------ |
| (i) | සභාව සතු වාහන 09ක, රාජ්‍ය ලාංඡනය හා සභාවේ නම යෙදීමට කටයුතු කර නොතිබුණු අතර ධාවනය කළ නොහැකි තත්ත්වයේ පැවති වාහන 03ක අපහරණ කටයුතු, 2022 දෙසැම්බර් මාසය දක්වාම නිමකර නොතිබුණි. | රාජ්‍ය ලාංඡනය හා ආයතනයේ නම වාහනවල සටහන් කිරීමට ඉදිරියේදි පියවර ගන්නා බවත් අදාළ වාහන වෙන්දේසි කිරීම සඳහා ටෙන්ඩර් කැඳවූ නමුත් අවම තක්සේරුව නොලද බැවින් දෙවනවර ටෙන්ඩර් කැඳවීමට කටයුතු කරනු ලබන බව. | අදාළ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | සභාවට අයත් යතුරුපැදි 09ක් ලිඛිත පැවරීමකින් තොරව සභාවේ සේවකයින් 09 දෙනෙකු වෙත ලබා දී තිබුණි. | ඉදිරියේදි වාර්ෂික ගිවිසුමක් යටතේ අවශ්‍යතාවය සළකා බලා යතුරුපැදි ලබාදීම පිළිබඳ ඉදිරි කටයුතු සිදු කරන බව. | අදාළ යතුරුපැදි ලිඛිතව පැවරීමට කටයුතු කළ යුතු වේ. |
| (iii) | සභාව සතු කම්පැක්ටරය රු.2,410,000ක් ගෙවා 2021 පෙබරවාරි මාසයේ අලුත්වැඩියා කර තිබුණද, 2022 ජනවාරි මාසයේදී එය අක්‍රීය තත්ත්වයට පත්ව තිබුණි. වගකීම් කාලය තුළ ඇති වූ එම දෝෂ සකස් කරදෙන ලෙස අදාළ ආයතනයෙන් ඉල්ලා තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් අලුත්වැඩියා කර නොතිබුණි. | කම්පැක්ටර් රථය වගකීම් කාලය තුළ ඇතිවූ දෝෂයක් හේතුවෙන් ධාවනය කිරීමට නොහැකි තත්ත්වයේ තිබුණි. එබැවින්, මෙම රථය අලුත්වැඩියාව සඳහා යොමු කරන ලද අතර මේ වන විට අලුත්වැඩියා කටයුතු සිදුකරමින් පවතින බව. | අදාළ ආයතනයෙන් කඩිනමින් අලුත්වැඩියා කරගත යුතු වේ. |

**(ඇ) දෘෂ්‍ය අක්‍රමිකතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මිශ්‍ර ආදායම් අංශයේ නිලධාරිනියක විසින් කඩ කාමර කුලී රු.192,000ක් වංචා කර තිබුණු අතර ඇය විසින් වරද පිළිගෙන තිබුණි. | මූලික පරීක්ෂණයක් සබරගමු පළාත් සභාවේ විමර්ශන නිලධාරීන් විසින් සිදු කරන අතර ඉදිරියේදී මෙම මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. | මූල්‍ය අක්‍රමිකතා සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කළ යුතු වේ. |

**1.5.11.2 බලංගොඩ නගර සභාව**

**1.5.11.2.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයට අදාළ උපචිත වියදම් රු.1,315,430ක් හා කොම්පෝස්ට් තොගයේ වටිනාකම ගිණුම්ගතකර නොතිබුණි. | උපචිත වියදම් 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව හා නිෂ්පාදන ගිණුමක් පිළියෙල නොකරන බැවින් අවසන් තොගය ගණනය නොකරන බව | නිවැරදි වටිනාකම් ගිණුම්ගත කළ යුතු වේ. |

**(ආ) විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂයය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| එකතුව රු.504,274,940ක් වූ ගිණුම් ශේෂ 04ක් වෙනුවෙන් විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොවුණි. | මෙම වර්ෂය අවසන් වන විට උපලේඛන ඉදිරිපත් කිරීමට හැකි බව | විස්තරාත්මක උපලේඛන සකස් කළ යුතු වේ. |

**1.5.11.2.2 අනුකූල නොවීම්**

**(අ) නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| අනුකූල නොවීම් | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 සැප්තැම්බර් 29 දින අංක 01/2021 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2.5 වගන්තිය පරිදි එකතුව රු.6,841,637ක් වූ කර්මාන්ත 10ක් ඒවා අයත් බල ප්‍රදේශයෙන් බැහැර ප්‍රජා පාදක සංවිධානවලට පිරිනමා තිබුණි. | වෙනත් වසමක ප්‍රජාපාදක සංවිධානයකට අදාළ කර්මාන්තය ලබා දීමට විරුද්ධත්වයක් නොමැති බවට අදාළ කර්මාන්තය පිහිටි වසමේ ප්‍රජාපාදක සංවිධාන දන්වා ඇති බව. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතු වේ. |

**1.5.11.2.3 ආදායම් පරිපාලනය**

**(අ) ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (i) | සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂවලට අදාළ හිඟ වරිපනම් හා බදු රු.6,156,320ක් අයකරගෙන නොතිබුණු අතර, ඊට අදාළ කාල විශ්ලේෂණයක් ද සකස් කර නොතිබුණි. | හිඟ ශේෂ අයකර ගැනීම සඳහා ඉදිරියේදී කටයුතු කරන බවත් පවතින වරිපනම් වැඩසටහන යටතේ කාළ විශ්ලේෂණයක් සිදුකිරීමට නොහැකි බව. | හිඟ ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ii) | ඉකුත් වර්ෂවලට අදාළ හිඟ කුලී ආදායම් රු.279,809ක් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් අයකරගෙන නොතිබුණි. | අදාළ හිඟ මුදල අය කර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (iii) | ප්‍රදර්ශිත දැන්වීම් පුවරු පිළිබඳ සමීක්ෂණයක් නොකිරීම නිසා ඉන් ලැබිය යුතු ආදායම හඳුනාගත නොහැකි වී තිබුණි. එමෙන්ම, එක් දැන්වීම් පුවරුවක් වෙනුවෙන් | 2023 වර්ෂයේ සමීක්ෂණය සිදුකරමින් පවතී. සභාපති තුමාගේ තීරණයක් මත 2022 වර්ෂයේ අයකිරීම් සිදු කිරීමෙන් සභාවට අහිමි | වාර්ෂික සමීක්ෂණ සිදුකර ආදායම් අයකළ යුතු වේ. |

| | | |
|---|---|---|
| රු.346,560ක් අඩුවෙන් අයකරගෙන තිබුණි. | වූ මුදල රු.346,560.00ක් බව. | |

**1.5.11.2.4 මෙහෙයුම් සමාලෝචනය**

**(අ) මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ටිකට්පත්වල වටිනාකම නොසලකා දින 10ක සැණකෙළියකින් විනෝද බදු ලෙස රු.500,000ක් පමණක් අයකර තිබුණි. එමෙන්ම, ක්‍රීඩාපිටිය හා ක්‍රීඩාගාරය සඳහා එම ගැසට් නිවේදනයට අනුකූලව ගාස්තු අය නොකිරීම නිසා රු.200,000ක ආදායමක් ද අහිමි වී තිබුණි. | සභා තීරණය අනුව කටයුතු කරමින් ගාස්තු අයකළ බව. | 2021 දෙසැම්බර් 03 දිනැති අංක 2257 දරන ගැසට් නිවේදනය පරිදි ගාස්තු අයකළ යුතු වේ. |

**(ආ) මතභේදයට තුඩුදුන් ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභිකයින් දෙදෙනෙකු හා නිලධාරිනියක විසින් රාජකාරීමය නොවන ගමන් සඳහා රු.42,576ක ඉන්ධන වැය කර සභාවේ වැන් රථය භාවිතා කර තිබුණි. | ඉදිරියට සභාව සතු වාහන පෞද්ගලික භාවිතයට නොගන්නා බව. | රාජකාරීමය නොවන ගමන් සඳහා රජයේ වාහන භාවිතා නොකළ යුතු වේ. |

**(ඇ) වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | නගර සභා කාර්යාලය, සභා ආයුර්වේදය, කියවීම් ශාලාව, මහජන ක්‍රීඩාපිටිය හා ප්‍රේක්ෂකාගාරය පිහිටි | ඉඩම් පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතින බව. | වත්කම්වල අයිතිය පවරා ගත යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | ඉඩම්වල අයිතිය පවරා ගෙන නොතිබුණි. | | |
| (ii) | සභාව සතු බවට ලේඛනවල සඳහන් වන අක්කර 05 පර්චස් 35.44ක් වූ ඉඩම් භෞතික වශයෙන් හඳුනාගෙන නිරවුල් කර නොතිබුණි. | නිරවුල් කර නොගත් ඉඩම් භෞතිකව හඳුනා ගෙන නිරවුල් කිරීමේ කටයුතු සිදුකරමින් පවතින බව. | වත්කම්වල අයිතිය පවරා ගත යුතු වේ. |
| (iii) | ක්‍රීඩා පිටියක් සඳහා 2020 පෙබරවාරි 18 දින රු.257,500කට මිලට ගන්නා ලද බල්බ් 50ක් හා 2019 හා 2020 වර්ෂවල දී ලද රු.128,375ක විදුලි උපාංග මේ දක්වාම අභාවිතව පැවැතුණි. | අනෙකුත් උපාංග සපයා ගැනීමට හැකි වූ පසු බල්බ භාවිතා කිරීම සිදු කරන බව. | අවශ්‍යතාවය හඳුනාගෙන භාණ්ඩ මිළ දී ගැනිම් කටයුතු කළ යුතු වේ. |

**(ඈ) වාහන උපයෝජනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | --------------------------- | ------------- |
| (i) | කම්පැක්ටරයක් සහ ගලි ටැංකියක් වසර 05කට වැඩි කාලයක සිට අභාවිතව දිරාපත් වෙමින් පැවතුණි. | ගලි ටැංකිය අබලි ද්‍රව්‍ය යටතේ බැහැර කිරීමට යොමු කර ඇති බව. | වත්කම් ඵලදායි ලෙස උපයෝජනය කළ යුතු වේ. |
| (ii) | සභාව සතු නොවූ වාහන 06ක හිමිකාරීත්වය, පවරා ගැනීමට හෝ ආපසු භාර දීමට හෝ කටයුතු කර නොතිබුණි. | වාහනවල අයිතිය පවරා ගැනීමට අදාළ ලියකියවිලි ප්‍රධාන අමාත්‍යාංශයට යොමු කර ඇත. | අංක 02/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛ පරිදි කටයුතු කළ යුතු වේ. |

**(ඉ) අවිධිමත් ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | -------------------------- | ------------ |
| (i) | 2019 වර්ෂයේ දී ගෝන මස් කිලෝග්‍රෑම් 10ක් ලඟ තබා ගැනීම | මහ සභාවේ තීරණයක් මත මින් ඉදිරියට ගිවිසුම් කොන්දේසි කඩ | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | හා 2022 වර්ෂයේ දී බ්‍රැන්ඩි ලීටර් 2.250ක් ගිණුම් ගත නොකිරීම නිසා අධිකරණය විසින් රු.125,000ක දඩයක් බලංගොඩ තානායම් පාලකට නියම කර තිබුණි. එකඟ වූ ගිවිසුම අනුව, නීතිවිරෝධි ක්‍රියාවක් කළහොත් බදු අයිතිය අහෝසි විය යුතු වුවද, 2023 වර්ෂය සඳහා ද ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව එම බදුකරුටම තානායම බදු දී තිබුණි. | කිරීමක් සිදු වුවහොත් තානායම සභාවට පවරා ගන්නා බවට දන්වා තිබුණි. | |
| (ii) | සභාපතිවරයාගේ අභිමතය පරිදි අනවසර ගොඩනැගිලි 02ක් සඳහා සැලසුම් අනුමත කර අනුකූලතා සහතික නිකුත් කර තිබුණි. එම අනුමැතිය ලබාදීමේ දී සභාවට අයකර ගත යුතු ආදායම් රු.886,301ක් ද අත්හැර දමා තිබුණි. | අයදුම්කරුගේ ඉල්ලීම සලකා, මහ සභාවේ අනුමැතිය මත පදනම්ව සද්භාවයෙන් යුතුව ගොඩනැගිලි සැලසුම් අනුමත කර අදාළ සහතික ලබා දීමට කටයුතු කරන ලද බව. | ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම හා අනුකූලතා සහතික නිකුත් කිරීම ඊට අදාළ නීති රීති හා රෙගුලාසි වලට අනුකූලව සිදුකළ යුතු වේ. |

**1.5.11.3 ඇඹිලිපිටිය නගර සභාව**

**1.5.11.3.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ------------------------- | ------------ |
| (i) | එකතුව රු.13,027,436ක් වූ ට්‍රැක්ටර් 04ක්, මෝටර් ග්‍රේඩරයක් හා පුස්තකාල පොත් ජංගම නොවන වත්කම් ලෙස ගිණුම්ගත නොකර සහ අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ ගිණුම්වල මෙය නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ii) | කරත්ත 07ක් සහ පුස්තකාල පොත් වටිනාකම රු.372,725ක් වැඩියෙන් | 2023 වර්ෂයේ ගිණුම්වල මෙය නිවැරදි කරන බව. | - එම - |

| | | | |
|---|---|---|---|
| | ජංගම නොවන වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | | |
| (iii) | දේශීය ණය සංවර්ධන අරමුදල් ණය ගිණුමේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.5,147,338ක් වැඩියෙන් දක්වා තිබුණි. | ණය වෙනුවෙන් ගෙවිය යුතු පොළිය ඇතුළත්ව ඇත. ඉදිරියේදී එම ණය පොළිය වෙන්කර පෙන්වන බව. | වෙනසට හේතු හඳුනාගෙන නිරවුල් කළ යුතු වේ. |

### 1.5.11.3.2 අනුකූල නොවීම්

**(අ) නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| අනුකූල නොවීම් | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2010-2020 වර්ෂ අතර කාලය තුළ අවස්ථා 08ක දී ලබා දී තිබුණු රු.681,567ක අත්තිකාරම්, මුදල් රෙගුලාසි 371(5) පරිදි පියවා නොතිබුණි. | නොපියවූ අත්තිකාරම් වලින් රු.25,357ක් කපා හැරීම සඳහා ආණ්ඩුකාරවර අනුමැතිය ලැබී ඇත. සෙසු අත්තිකාරම් පියවීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

### 1.5.11.3.3 ආදායම් පරිපාලනය

**(අ) ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට වසර 05කට වඩා පැරණි රු.49,747,851ක වරිපනම් ශේෂයක් පැවැතිණි. | හිඟ අයකර ගැනීමට අවසාන නිවේදන බෙදමින් පවතී. පසුව නගර සභා ආඥා පනතේ 170 වගන්තිය ප්‍රකාරව ඉදිරි කටයුතු සිදු කරන බව. | හිඟ ආදායම් රැස් කළ යුතු වේ. |
| (ii) | සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 02ක රු.156,000ක හිඟහිටි ඉඩම් හා ගොඩනැගිලි බදු ශේෂයක් පැවැතිණි. | හිඟ බදු අයකර ගැනීම සඳහා කටයුතු කරන බව. | හිඟ ආදායම් රැස් කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (iii) | වසර 03ත් වසර 15ත් අතර කාලයක් හිඟහිටි කඩ කාමර කුලී රු.3,843,893ක් හා පෙර ගෙවුම් මුදල් (key money) රු.1,281,200ක් අයකර නොතිබුණි. | මෙම මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | හිඟ ආදායම් රැස් කළ යුතු වේ. |
| (iv) | සභා බල ප්‍රදේශයේ වූ 285ක මුළු ත්‍රීරෝද රථ සංඛ්‍යාවෙන් ත්‍රීරෝද රථ 283ක් ම 2022 වර්ෂය වෙනුවෙන් රු.141,500ක ගාස්තු ගෙවා නොතිබුණි. එමෙන්ම, 2022 වර්ෂය ද ඇතුළුව ඉකුත් වර්ෂ 04ක් වෙනුවෙන් රු.541,000ක ගාස්තු හිඟහිටිව පැවැතිණි. ත්‍රීරෝද රථ සංගමය හා නගර සභාව අතර පැවති සියලු සාකච්ඡා නිශ්චිත එකඟතාවකින් තොරව අවසන් වී තිබීම මෙයට හේතුව වී තිබුණි. | ඇස්තමේන්තු සකස් කිරීමේ දෝෂ නිසා හිඟ මුදල වැඩි වීමක් පෙන්නුම් කරයි. ත්‍රීරෝද රථ සංගමයෙන් ලබාගත් යාවත්කාලීන කරන ලද ලේඛන අනුව ගිණුම් නිවැරදි කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව. | හිඟ ආදායම් රැස් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

### 1.5.11.3.4 මෙහෙයුම් සමාලෝචනය

**(අ) මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | LED දැන්වීම් පුවරුවක් 2019 වර්ෂයේ ස්ථාපනය කර රු.2,689,200ක් වූ එම වියදම මාස 20කින් පියවා ගැනීමට සැලසුම් කර තිබුණි. එහෙත්, දැන්වීම් පුවරුව ස්ථාපිත කර මාස 34ක දී ලද ආදායම රු.35,500ක් පමණක් විය. | මෙම දැන්වීම් පුවරුව බදු දීමට ටෙන්ඩර් කැඳවූවද, කිසිවෙකු ඉදිරිපත් නොවීය. 2023 වර්ෂය සඳහා විවෘත ටෙන්ඩර් කැඳවා බදු දීමට කටයුතු කරන බව. | දරන ලද වියදමට ප්‍රමාණවත් උපයෝජනයක් ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ii) | සමාලෝචිත වර්ෂය තුළ පවත්වන ලද විනෝද ප්‍රසංග 04ක් වෙනුවෙන් එම අයිතිකරු විසින් ඉදිරිපත් කළ ප්‍රවේශ පත්‍ර | විනෝද බදු අයකිරීමේ ප්‍රායෝගික දුෂ්කරතා පවතී. අක්‍රමිකතා වාර්තා වුවහොත් | සභාව වෙත අයවියයුතු ආදායම් රැස්කර ගැනීමට |

| | | | |
|---|---|---|---|
| | සංඛ්‍යාව පදනම් කර ගෙන විනෝද බදු ලෙස රු.246,000ක් පමණක් අයකර තිබුණි. එහෙත්, එම ප්‍රසංගවල දී අලෙවි වූ තථ්‍ය ප්‍රවේශ පත්‍ර සංඛ්‍යාවේ නිවැරදිතාව තහවුරු කර ගැනීමට ක්‍රමවේදයක් සභාව විසින් හඳුනාගෙන නොතිබුණි. | තැන්පතුව සභාව සතු කර ගැනේ. ඉදිරියේදී උපරිම ලෙස බදු අයකිරීමට කටයුතු කරනු ලබන බව. | කටයුතු කළ යුතු වේ. |
| (iii) | අනවසර ඉදිකිරීම් හඳුනා ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් නොතිබුණු අතර, මහජන පැමිණිලි මත පමණක් අනවසර ඉදිකිරීම් හඳුනා ගෙන තිබුණි. එමෙන්ම, අනවසර ඉදිකිරීම් ලේඛනයක් ද නඩත්තු කර නොතිබුණි. | ඉදිකිරීම් ඉවත් කිරීමේදී විවිධ ගැටළු ඇති වේ. ඒ නිසා නාගරික සංවර්ධන අධිකාරියෙන් උපදෙස් ඉල්ලා සිටියද, මේ දක්වා ලැබී නොමැති බව. | අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු වේ. |
| (iv) | දිරාපත් නොවන කසළ විශාල ප්‍රමාණයක් පරිසරයට අහිතකර වන ලෙස දෛනිකව බැහැර කර තිබුණි. නොදිරන කසළ මධ්‍යස්ථානය සඳහා 2022 ජූලි මාසයේ ලබා දී තිබුණු රු.950,000ක් වූ බෙලර් යන්ත්‍රය 2022 දෙසැම්බර් මාසය වන විටත් අභාවිතව පැවතුණි. 2021 වර්ෂයේදී කිලෝග්‍රෑම් 164,280ක් වූ කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය 2022 වර්ෂයේදී කිලෝග්‍රෑම් 6,240ක් දක්වා අඩු වී තිබුණු අතර, අලෙවි ආදායම පසුගිය වසරට සාපේක්ෂව රු.1,580,400කින් අඩු වී තිබුණි. | ආර්ථික හා සෞඛ්‍ය අර්බුදය නිසා අපේක්ෂිත ආදායම උපයාගත නොහැකි විය. කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය වැඩි කිරීමට හා බෙලර් යන්ත්‍රය භාවිතයට ගැනීමට කටයුතු කරමින් සිටින බව. | විධිමත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැසුමක් සකස්කර ක්‍රියාත්මක කළ යුතු වේ. |

**(ආ) වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ----------------------- | ------------------------- | ----------- |

| | | |
|---|---|---|
| ඇඹිලිපිටිය උඩගම පිහිටි මල්වත්ත ඉඩමේ හෙක්ටයාර් 0.1285ක් වූ බිම් කොටසේ මායිම් නිරවුල් කර නොතිබීම හා සභාව සතු ඉඩමක් බවට ප්‍රදර්ශනය කර නොතිබීම නිසා අනවසර අත්පත් කර ගැනීමකට ලක්වීමේ අවදානමක් පැවැතිණි. | මායිම් නිරවුල් කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව. | සභාව සතු දේපළවල පැවැත්ම හා ආරක්ෂාව තහවුරු කළ යුතු වේ. |

**1.5.11.4 කෑගල්ල නගර සභාව**

**1.5.11.4.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ----------------------- | ----------- |
| (i) | කර්මාන්ත 08ක් වෙනුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.1,273,439 ක් සහ රු.701,570 ක තොග ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කර ඇති බව. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. |
| (ii) | ගිවිසුම්ගත නොවූ රු. 1,504,060 ක ඉදිකිරීමක් ණයහිමියන් ලෙස දක්වා තිබුණි. | ඉදිරියේදී මෙය ඉටු කරන බැවින් වෙන්කිරීම් කර ඇති බව. | - එම - |
| (iii) | කර්මාන්ත 04 ක් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන රු.1,915,998ක් වැඩිපුර වෙන් කර තිබුණි. | කර්මාන්ත 02ක් සීමිත ටෙන්ඩර් කැඳවීමටත්, එක් කර්මාන්තයක් ඉදිරි වර්ෂයේදී ඉටුකිරීමටත්, අනෙක් කර්මාන්තය ගිවිසුම් ගත වුවද ගෙවීම් නොකිරීම නිසා ණයහිමි වෙන්කිරීම් කර ඇති බව. | - එම - |

**(ආ) නොසැසඳුණු පාලන ගිණුම්**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ----------------------- | ----------- |

| | | |
|---|---|---|
| ගිණුම් විෂයයකට අදාළව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය හා උපලේඛන අනුව එම ශේෂය අතර රු.6,747,203ක වෙනසක් පැවැතිණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. |

**(ඇ) විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.217,839,779 ක් වූ ගිණුම් විෂයයන් 06ක් වෙනුවෙන් උපලේඛන ඉදිරිපත් කර නොතිබුණි. | උපලේඛන ඉදිරිපත් කිරිමට කටයුතු කරන බව. | විගණනයට අවශ්‍ය තොරතුරු ලබා දිය යුතු වේ. |

**1.5.11.4.2 අනුකූල නොවීම්**

**(අ) නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ | | | |
| මු.රෙ.571 | එකතුව රු.2,462,388ක කල් ඉකුත් වූ තැන්පතු 76ක් නියාදනය කර නොතිබුණි. | අවශ්‍ය තැන්පත් රඳවා ගැනීම හා ඉතිරිය ආපසු ගෙවන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**1.5.11.4.3 ආදායම් පරිපාලනය**

**(අ) ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------ | ----------------------- | ------------ |
| (i) වරිපනම් හා කඩ කුලී යන ආදායම් විෂයයන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට රු.10,623,121ක් අයවිය යුතුව තිබුණි. එම වටිනාකම තුළ වර්ෂ 01ත් වර්ෂ 05ත් අතර රු.618,504ක ශේෂයක්ද, වර්ෂ 05කට වඩා පැරණි රු. 5,944,136 ක ශේෂයක්ද පැවතුණි. | දේපළ තහනම් කිරීම, අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම, කුලීකරුවන් ඉවත් කිරීම ආදී කටයුතු කර ඇති බව. | හිඟ කුලී නොපමාව අයකර ගත යුතු වේ. |
| (ii) 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන පළාත්පාලන චක්‍රලේඛය අනුව වර්ෂ 05කට වරක් සිදු කළ යුතු දේපළ තක්සේරුව 2000 වර්ෂයෙන් පසු සිදුකර නොතිබුණි. | දේපළ තක්සේරු කර දෙන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුවට දැන්වීම් කළ ද එය ඉටුකර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**1.5.11.4.4 මෙහෙයුම් සමාලෝචනය**

**(අ) කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ----------------------- | --------------------------- | -------------- |
| (i) 2012 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා අනුමත කරන ලද සැලැසුම් 1100කින් 996ක් සඳහා අනුකූලතා සහතික නිකුත් කර නොතිබීම නිසා ඒ මත ගාස්තු ලෙස අය කරන රු.3,984,000ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි. | බොහෝ ඉදිකිරීම් අනුමත සැලසුමට අනුකූල නොවන ලෙස ඉදිකර තිබීම, ඉදිකිරීම් අතරමග නවතා තිබීම, නීති කටයුතු සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදුවීම, අධීක්ෂණ නිළධාරීන් නොමැතිවීම ආදී කරුණු මීට හේතු වි ඇති බව. | සැලසුම් අනුමත කළ පසු විපරම් ක්‍රියාවලිය සිදු කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සහ අනුකූලතා සහතික නිකුත් කර වරිපනම් සංශෝධන සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | අනවසර ඉදිකිරීම් 06ක ඉදිකිරීම් අත්හිටුවීමට නියෝග කර තිබුණද, එම නියෝග නොතකා අදාළ ඉදිකිරීම් නිමකර හා කරගෙන යමින් පැවතුණි. | නඩු තීන්දුව අනුව එවැනි ඉදිකිරීම් කඩා ඉවත් කිරීම සඳහා ලිඛිත නියෝග ලබා දී තිබුණද, එම කාර්යය ඉටු වී නොතිබුණි. | අනවසර ඉදිකිරීම් අත්හිටුවීම කළ යුතු වේ. |
| (iii) | නාගරික සංවර්ධන අධිකාරිය විසින් පවරාගත් සභාව සතු තානායම 2009 වර්ෂයේ අංක 1589/20 දරන ගැසට් නිවේදනය පරිදි ආපසු භාර දිය යුතු වුවද, 2022 දෙසැම්බර් වන විටත් පවරා දී නොතිබුණි. එමෙන්ම, 2020 සැප්තැම්බර් සිට 2022 මැයි දක්වා කාලයට අදාළව එම අධිකාරියෙන් රු.1,506,700ක තානායම් කළමනාකරණ ගාස්තුවක් ද අයවිය යුතුව පැවතුණි.තව ද, 2009 වර්ෂයේ සිට 2015 ජුලි දක්වා බාහිර පාර්ශව විසින් එම තානායමෙන් ආදායම් උපදවා ගෙන තිබුණු බැවින්,එම කාලය තුළ හිඟහිටි රු.502,026ක ගාස්තු කපා හැරීමට කරන ලද ඉල්ලීමක යෝග්‍යතාව ගැටළු සහගත විය. | ගෙවීමට ඇති රු.502026 ක මුදල මහ සභා තීරණය අනුව කපා හැරීම් නියෝග සඳහා ඉදිරිපත් කර ඇත. රු.1,506,700ක මුදල අයකර ගැනීම සඳහා අදාළ පාර්ශව වෙත දැනුම් දී ඇත. දේපළ තහනම් කිරීමට හෝ නඩු පැවරීමට නොහැකි වීමද, හිඟ අයකර ගැනීමට නොහැකිවීමට හේතු වී ඇති බව. | නාගරික සංවර්ධන අධිකාරියට පවරා ගැනීමේ කොන්දේසි අනුව හිඟ කුලී අය කර ගත යුතු අතර, ගැසට් නිවේදනය අනුව දේපළ ආපසු ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iv) | විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්ගේ උපදෙස්වලට අනුකූල නොවන ලෙස එම අමාත්‍යාංශ අනුමැතියක් රහිතව 2020 වර්ෂයට පෙර විථී ලාම්පු 1184 ක් සවිකර තිබුණි. | එම අනුමැතිය ලබාගන්නා බව | නව විථී ලාම්පු සවිකිරීමට අමාත්‍යාංශ අනුමැතිය ලබා ගත යුතු වේ. |

**(ආ) මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) ගිණුම් අංශයේ නිලධාරීන් 04 දෙනෙකු වර්ෂ 08 ත් 13 ත් අතර කාලයක් එකම ස්ථානයක සේවය කරමින් සිටී. සභාවේ වූ අංශ 12ක සේවා නියුක්තිකයින්ගේ සේවා කාලය පිළිබඳ තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් නොවුණි. | ස්ථාන මාරුකිරීම් සිදුකරනු ලබන්නේ සබරගමුව පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය හා පළාත් පාලන කොමසාරිස් කාර්යාලය මගින් බව. | අභ්‍යන්තර ස්ථාන මාරු සිදු කළ යුතුය. |
| (ii) කඩ කාමර වෙනුවෙන් ගිවිසුම්ගත නොවීම නිසා රු.243,300ක ආදායමක් අහිමි වී තිබුණි. | මෙම කඩකාමර සඳහා ගිවිසුම් ගතවීමක් සිදුකර නොමැත. | ගිවිසුම්ගත විය යුතු වේ. |
| (iii) සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු රු. 68,432,711ක ණයහිමි ශේෂය තුළ වසර 01ත් වසර 02ත් අතර කාලයක් පැරණි රු.21,720,502ක් ද, වසර 03කට වඩා පැරණි රු.6,900,316 ක් ද පැවතිණි. | වසරක් ඉකුත් වූ ණයහිමි ශේෂයෙන් රු.9,491,116 ක් ගෙවා ඇති බව. | ණයහිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. |

**(ඇ) වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) අවශ්‍යතාව පරිදි මිල දී නොගැනීම නිසා වර්ෂ 02ත් වර්ෂ 12ත් අතර කාලයක් තුළ මිල දී ගත් රු307,265.ක් වූ ටයර් 27ක් අභාවිතව පැවතිණි. | 2022 භාණ්ඩ සමීක්ෂණ අනුව කටයුතු කරන බව. | වත්කම් අභාවිතව නොතැබිය යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ii) | ගිනි නිවීමේ ඒකකයක් නොතිබීම නිසා 2022 මාර්තු මාසයේ ලද ගිනි නිවීමේ රථයක් 2022 දෙසැම්බර් දක්වාම අභාවිතව පැවතුණි. | ගිණි නිවීමේ ඒකකයට ගොඩනැගිල්ලක් ඉදිකර ඇති අතර එකවර ජලය ලබාගැනීම සඳහා ස්ථානයක්ද සකස් කරමින් පවතින බව. | -එම- |
| (iii) | ලොරියක්, අත් ට්‍රැක්ටරයක් හා ටේලර් 02ක් වසර 10 කට වැඩි කාලයක සිට අභාවිතව පවතී. | සුදුසු පරිදි ක්‍රියා කර වාර්තා කරන බව. | -එම- |

**(ඇ) මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ----------------------- | ------------------------- | ------------- |
| අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 51 ක්ද, 02 දෙනෙකුගේ අතිරික්තයක්ද පැවති අතර සේවා ගිවිසුම් මත 14 දෙනෙකු බඳවාගෙන තිබුණි. | පුරප්පාඩු සඳහා ඉල්ලීම් කර ඇත. ඉල්ලීමකින් තොරව සංවර්ධන නිළධාරීන් ලබා දීම නිසා අතිරික්තයක් ඇති වී තිබුණි. | අවශ්‍යතාව මත පුරප්පාඩු සම්පූර්ණ කළ යුතු වේ. |

### 1.5.11.5 අයගම ප්‍රාදේශිය සභාව

### 1.5.11.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ------------------------ | ------------- |
| (i) | උපචිත වියදම් රු.107,300ක් ගිණුම්ගත කර නොතිබුණි. | 2022 අවසන් ගිණුම් සැකසීමේදී එම වටිනාකම් අත්හැරී ඇති බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ii) | කර්මාන්ත වෙනුවෙන් ණයහිමියෝ සහ ණයගැතියෝ රු.18,826,749ක් බැගින් වැඩියෙන් දැක්වුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම් සැකසීමේදී නිවැරදි කරනු ලබන බව. | - එම - |
| (iii) | මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් 06ක ශේෂ සහ උපයෝගී ලේඛන අනුව එම ශේෂ අතර රු.20,130,866ක වෙනසක් විය. | 2020 වර්ෂයට පෙර සිට පවතින වෙනස්කම් බැවින් පරීක්ෂා කිරීම ඉතාමත් අපහසු කාර්යයක් බව. | වෙනසට හේතු හඳුනාගෙන නිරවුල් කළ යුතු වේ. |

**1.5.11.5.2 අනුකූල නොවීම්**

**(අ) නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------- | ------------------------ | ------------- |
| (i) | 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළ එකතුව රු.311,678ක් වූ කල් ඉකුත් වූ විවිධ තැන්පතු මුදල් රෙගුලාසි 571 (2) අනුව නිරවුල් කර නොතිබුණි. | 2023 අවසන් ගිණුම මගින් නිවැරදි කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ii) | ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 08ක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | මේ සඳහා නීති සහය ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. | ප්‍රාදේශීය සභා පනත අනුව කටයුතු කළ යුතු වේ. |

**1.5.11.5.3 ආදායම් පරිපාලනය**

**(අ) ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ------------------------ | ------------ |
| (i) | වසර 03ට වඩා පැරණි රු.176,101ක හිඟහිටි අක්කර බදු ශේෂයක් 2022 දෙසැම්බර් 31 දිනට පැවතිණි. | ඉදිරියේදී හිඟය අය කර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් රැස් කළ යුතු වේ. |
| (ii) | අයගම නගරයේ බස් නැවතුම්පොළ ඉහළ මහලෙහි කඩකාමර 05ක් 2017 වර්ෂයේ සිට පොලිසිය විසින් පරිහරණය කිරීම හේතුවෙන් ආදායම් උපයා ගැනීමට නොහැකි වී තිබුණි. | හිඟ මුදලින් රු.105,000ක් අයකරගෙන ඇති බව. | ගොඩනැගිල්ල අරමුණුගත කාර්යය සඳහා යෙදවිය යුතුය. |

**1.5.11.5.4 මෙහෙයුම් සමාලෝචනය**

**(අ) මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ---------------------- | ----------- |
| (i) | ජල මනු සවි නොකර 507 දෙනෙකු වෙත ජල සැපයුම් ලබා දී මාසික ස්ථාවර ගාස්තුවක් පමණක් අයකර තිබුණි. 2022 වර්ෂය සඳහා බිල්කළ ජල ගාස්තු ආදායම රු.614,100ක් වුවද, එම සේවාව සැපයීමට වැටුප් ඇතුළු පොදුකාර්ය වැය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.1,085,909ක් වැයකර තිබුණි. ජලය ලබා දීමට වැය වන වියදම හෝ පියවීමට, ජල මනු සවිකර ගාස්තු අයකිරීමට 2022 දෙසැම්බර් දක්වාම පියවර ගෙන නොතිබුණි. | සුභ සාධන කර්තව්‍යයක් ලෙස මෙම ජල ව්‍යාපෘති පවත්වාගෙන යනු ලබන බැවින් ජල මීටර සවිකිරීම මගින් වියදමට සාපේක්ෂ ආදායමක් කරා ප්‍රායෝගිකව ළඟාවීමේ හැකියාවක් නොමැති බව. | ජල මනු සවිකර ගාස්තු අයකිරීම විධිමත් කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ii) | කෘෂි බෝග අලෙවි මධ්‍යස්ථානයේ කඩකාමර 05ක් පෙර ගෙවුම් මුදල් (Key Money) ගෙවා නිම වීමට පෙර ගිවිසුම් කොන්දේසිවලට පටහැනිව, බදුකරුවන් | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කරමින් පවතින බව. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | වෙත භාර දී තිබුණි. ඉන් කඩ කාමර 03කින් වසර 03කට වඩා පැරණි පෙර ගෙවුම් මුදල් රු.220,000ක් අයකර නොතිබුණි. ගිවිසුම පරිදි, කඩකාමර 04ක් සඳහා වාර්ෂිකව ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | | |
| (iii) | සමාලෝචිත වර්ෂයේදී ඝන අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 41ක් පමණ බැහැර කිරීම සඳහා කාර්යය මණ්ඩල සේවකයින් 11 දෙනෙකු හා වාහන 03ක් වෙනුවෙන් රු.37,848,367ක් පමණ වැයකර තිබුණ ද, එම අපද්‍රව්‍ය පරිසර හිතකාමීව බැහැර කර නොතිබුණි. | ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීමේ මධ්‍යස්ථානයක් නොමැති බව. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්මක් සකස්කර ක්‍රියාත්මක කළ යුතු වේ. |

**(ආ) වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ----------------------- | ------------------------- | ------------ |
| ප්‍රාදේශිය සභා පනතේ 19(xii) වගන්තිය පරිදි විෂයය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය රහිතව 2022 වර්ෂයේ දී ඉන්ධන පිරවුම්හලක් ඉදිකිරීමට වසර 30ක් සඳහා ඉඩමක් බදු දී තිබුණි. එම ඉඩම සඳහා තක්සේරුවක් ලබාගෙන නොතිබුණු අතර හිඟහිටි බදුකුලී රු.41,332ක් ද අයකර නොතිබුණි. | යෝජිත භූමිය සභාවට පවරා දීමට අවශ්‍ය පැවරුම් සහතිකය ලද පසු හිඟ මුදල් අයකර කරන බව. | ඉඩමේ හිමිකම ලබා ගෙන හිඟ ආදායම් අයකර ගත යුතු වේ. |

**(ඇ) කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ----------------------- | ----------------------- | ---------------- |
| භූමි යෝග්‍යතා සහතිකයක් ලබා ගැනීමකින් තොරව අයගම වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම් ආරම්භ කර | භූමි යෝග්‍යතා සහතිකයක් ඉල්ලුම් කර ඇත. ඉදිකිරීම් ද්‍රව්‍යවල මිල ඉහලයාම නිසා | භූමි යෝග්‍යතා සහතිකයක් ලබා ගත යුතුය. එමෙන්ම |

| | | |
|---|---|---|
| තිබුණි. පසුව අත්තිවාරම හා කුලුනු පාදම (Column Shaft) පමණක් ඉදිකර තිබියදී 2022 වර්ෂයේදී අනෝන්‍ය එකඟතාව මත ගිවිසුම අවසන් කර තිබුණ ද, නිමකළ වැඩ වෙනුවෙන් රු.2,018,645ක් වැඩිපුර ගෙවා තිබුණි. | අනොන්‍යාන්‍ය එකඟතාව මත ගිවිසුම අවසන් කර ඇත. වැඩිපුර ගෙවීම් රඳවුම් මඟින් අය කෙරේ. | වැඩිපුර ගෙවීම් ආපසු අයකළ යුතු වේ. |

**(ඇ)** **වාහන උපයෝජනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ------------------------ | ------------ |
| (i) | ට්‍රැක්ටර් හා ටේලර් 03ක හිමිකාරීත්වය, පවරා ගැනීමට හෝ ආපසු භාර දීමට හෝ කටයුතු කර නොතිබුණි. | මෝටර් රථ පැවරුම් ලේඛන 06ක් ප්‍රධාන ලේකම් වෙත යවා ඇති බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ii) | 2008 වර්ෂයේ දී රු.510,000කට මිල දී ගෙන තිබුණු ට්‍රැක්ටරයක් 2015 වර්ෂයේ සිට අභාවිතව පැවැතුණි. | ඉදිරියේදී ධාවන කටයුතුවලට එක් කිරීමට කටයුතු කරන බව. | අවශ්‍යතාව අනුව කටයුතු කළ යුතු වීම. |

**1.5.11.6** **ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව**

**1.5.11.6.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**(අ)** **ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ------------------------- | ------------ |
| (i) | එකතුව රු. 26,900,777ක් වූ සභාව සතු ඉඩම් 03ක්, ගොඩනැගිලි 07ක් හා ට්‍රැක්ටරයක් ගිණුම්ගත කර නොතිබුණු අතර ආදාහනාගාරයක පිරිවැය රු.4,559,350ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ii) | සමාලෝචිත වර්ෂයට අදාළ සතිපොල ගාස්තු හා කඩකාමර ගාස්තු රු.129,287ක් ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතු වේ. |
| (iii) | කර්මාන්ත ණයහිමියෝ රු.36,950,406ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. එම නිසා සමාලෝචිත වර්ෂයේ රු.9,486,036ක අතිරික්තය, රු.27,464,380ක ඌනතාවක් බවට පත් වී තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මෙය නිවැරදි කළ යුතු වේ. |
| (iv) | ණය ලේඛනය අනුව 2022 දෙසැම්බර් 31 දිනට සේවක ණය ශේෂයට වඩා රු.651,190ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල එම ශේෂය දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වෙනසට හේතු හඳුනාගෙන නිරවුල් කළ යුතු වේ. |

**(ආ) ගිණුම් පිළියෙල කිරීමේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වටිනාකම රු.919,789,010ක් වූ ජ'නල් සටහන් 66ක් විධිමත්ව අනුමත කර නොතිබුණු අතර ජ'නල් වවුචර් ද පිළියෙල කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මෙය නිවැරදි කළ යුතු වේ. |

**(ඇ) විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| | විෂයය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | වටිනාකම රු.93,337ක් වූ ස්ථාවර තැන්පතු සඳහා සහතිකයක් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. | ගම්සභා කාලයේ සිට පැවත එන මෙම ස්ථාවර තැන්පතු ශේෂවලට අදාළ තැන්පතු සහතික නොමැති බව. | බැංකුවෙන් තැන්පතු සහතිකයක් ලබාගැනීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ii) | තිඹොල්කැටිය සතිපොළ ඉඩම රු.1,289,400ක් ලෙස ගිණුම්ගත කර තිබුණ ද, එහි ලිඛිත හිමිකම මෙන්ම, භෞතික පැවැත්ම ද තහවුරු නොකෙරුණි. | ලිඛිත හිමිකම් හා භෞතික පැවැත්ම තහවුරු නොවීම නිසා මෙම වටිනාකම ගිණුම්ගතවීම නිවැරදි කරන බව. | නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

**1.5.11.6.2 අනුකූල නොවීම්**

**(අ) නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2018 මැතිවරණයෙන් තේරී පත් වූ සභිකයින් 07 දෙනෙකු විසින් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් 1988 අංක 74 දරන පනතින් සංශෝධිත 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත ප්‍රකාරව වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි. | වත්කම් බැරකම් ප්‍රකාශ භාර දෙන ලෙසට දැනුවත් කිරීම් සිදු කර ඇති බව. | වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ii) | 1988 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාලය තුළ අවස්ථා 26ක දී ලබා දී තිබුණු එකතුව රු.1,269,079ක් වූ අත්තිකාරම්, මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව පියවා නොතිබුණි. | කපා හැරීමට අනුමැතිය සඳහා ආණ්ඩුකාරවරයා වෙත යොමු කර ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (iii) | ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 11ක් වෙනුවෙන් සභාව විසින් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා 19ක් වැළඳගෙන ඇති අතර ඉතිරි කාරණා 11න් 04ක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා සකස් කරමින් පවතින බව. | ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**1.5.11.6.3 ආදායම් පරිපාලනය**

**(අ) ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | --------------------- | ------------ |
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.9,492,588ක් වූ හිඟ වරිපනම් ශේෂය තුළ වසර 05ට වඩා පැරැණි රු.1,336,099ක ශේෂයක් පැවැතිණි. | 2023.02.28 දින වන විට හිඟයෙන් රු.1,942,492ක් අය කර ඇති බව. | හිඟ ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

**1.5.11.6.4 මෙහෙයුම් සමාලෝචනය**

**(අ) මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------- | ------------------------ | ------------- |
| (i) | සමාලෝචිත වර්ෂය තුළ රු.847,440ක කුලී ආදායමක් උපයා තිබුණු මෝටර් ග්‍රේඩරය, ගලි බවුසරය හා බැකෝ යන්ත්‍රය කුලියට දීමේ දී කිසිදු නිලධාරියෙකුගේ අධීක්ෂණයක් නොතිබුණි. | කාර්මික නිළධාරීවරයකු නොමැති වීම හේතුව විය. දැනට මෝටර් ග්‍රේඩරය කුලියට දීමේදී කාර්මික නිළධාරී අධික්ෂණයක් සිදු කරන බව. | මේ සඳහා මනා අභ්‍යන්තර පාලනයක් තිබිය යුතු වේ. |
| (ii) | බැකෝ යන්ත්‍රය කුලියට දීමෙන් චන්ද්‍රිකා වැව දිසා රෝහලෙන් අයවිය යුතු වර්ෂ 02කට වඩා පැරැණි රු.343,114ක ශේෂයක් පැවැතිණි. | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් මුදල් ගෙවීමට එකග වී ඇති බව. | සභාව වෙත ලැබිය යුතු ආදායම් රැස් කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (iii) | විනෝද ප්‍රසංගයක දී එහි අයිතිකරු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු මත විනෝද බදු අයකර තිබුණි. එහෙත්, එම ප්‍රසංගයේ දී අලෙවි වූ තථ්‍ය ප්‍රවේශ පත්‍ර සංඛ්‍යාවේ නිවැරදිතාව තහවුරු කර ගැනීමට ක්‍රමවේදයක් සභාව විසින් හඳුනාගෙන නොතිබුණි. | කාර්යාලීය නිවාඩු දිනයක පැවැත්වූ සංදර්ශනයක් පිළිබඳ ලේකම් වෙත ලැබුණු දුරකථන ඇමතුමක් අනුව අදාළ කාර්යය නිරීක්ෂණය කර ඒ අවස්ථාවේ අලෙවි වී තිබුණු ටිකට් ප්‍රමාණය අනුව ගණනය කර ගාස්තු අයකළ බව. | ආදායම නිවැරදිව හඳුනා ගැනීමට ක්‍රමවේද සකස් කළ යුතු වේ. |
| (iv) | ජල ව්‍යාපෘති 03කින් 2022 දෙසැම්බර් 31 දිනට රු.791,780ක් අයවීමට තිබුණු අතර එම ශේෂය තුළ වර්ෂ 01කට වඩා පැරණි රු.483,330ක ශේෂයක් පැවැතිණි. | රු.1500 ට වැඩි හිඟ වෙනුවෙන් රතු බිල්පත් යවා ඇත. පාරිභෝගිකයින් සමග සාකච්ඡා කිරීමට කටයුතු කරන බව. | සභාව වෙත ලැබිය යුතු ආදායම් රැස් කළ යුතු වේ. |
| (v) | සමාලෝචිත වර්ෂයේදී ඝන අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 1080ක් පමණ බැහැර කිරීමට සේවකයින් 09 දෙනෙකු හා වාහන හා යන්ත්‍ර උපකරණ 06ක් වෙනුවෙන් රු.11,189,389ක් වැයකර තිබුණ ද, එම අපද්‍රව්‍ය පරිසර හිතකාමීව බැහැර කර නොතිබුණි. | පරිසර හිතකාමීව කසළ බැහැර කිරීමට සුදුසු ඉඩමක් ලබා ගැනීමට කටයුතු සිදු කරමින් පවතින බව. | ඉඩම පවරා ගැනීමේ කටයුතු කඩිනම් කළ යුතු වේ. |

**(ආ) වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | -------------------------- | ----------- |
| (i) | රු.76,451,331ක් වූ ඉඩම්, ගොඩනැගිලි හා මෝටර් වාහන සඳහා ස්ථාවර වත්කම් ලේඛන පිළියෙල කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ස්ථාවර වත්කම් ලේඛන පිළියෙල කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ii) | සභාව සතු සුසාන භූමි 10න් 08ක | ඉතිරි සුසානභූමි නිරවුල් | වත්කම්වල අයිතිය |

| | | |
|---|---|---|
| මායිම් නිරවුල් කර නොතිබුණු අතර ඉතිරි සුසාන භූමි 34හි අයිතිය ලබා ගැනීමට මේ දක්වා පියවර ගෙන නොතිබුණි. මේ නිසා එම ඉඩම් අනවසර භුක්තියකට ලක්වීමේ අවදානමක් පැවැතිණි. | කර ගැනීමට ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව. | පැවැත්ම හා ආරක්ෂාව තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (iii) සභාව භුක්ති විඳින අක්කර 03 රූඩ් 02 පර්චස් 10ක් වූ ඉඩම් 07ක් හා වපසරිය නොදත් තුංකම සතිපොල ඉඩමේ අයිතිය පවරා ගෙන ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | වත්කම්වල අයිතිය පැවැත්ම හා ආරක්ෂාව තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

**(ඇ) වාහන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ------------------------ | ----------- |
| ධාවනය කළ නොහැකි වාහන 04ක් සහ යන්ත්‍රෝපකරණ 02ක් අපහරණය කර නොතිබුණි. | මෙම කටයුතු කඩිනමින් සිදු කිරීමට විෂය නිළධාරීන් දැනුවත් කරන ලද බව. | අංක 05/2020 වත්කම් කළමනාකරණ චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතු වේ. |

**(ඇ) කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ------------------------ | ----------- |
| (i) මුල්ඇඩියාවල විදුහලේ ක්‍රීඩාපිටියට පිවිසෙන මාර්ගයට යෙදූ කුට්ටි ගල් 8,000කට අදාළ තත්ත්ව පරීක්ෂණ වාර්තා ලබා නොගෙන | කුට්ටි ගල් 12ක් හා 11ක් වශයෙන් අවස්ථා 2 ක දී පරීක්ෂාව සඳහා යොමුකළ ද, දෙවන පරීක්ෂණ | නියමිත පරිදි තත්ත්ව පරීක්ෂණ වාර්තා ලබාගත යුතු අතර වැඩිපුර ගෙවීම් |

| | | | |
|---|---|---|---|
| | රු.364,800ක් ගෙවීම් කර තිබුණි. එමෙන්ම, කොන්ක්‍රීට් ඝනකවල (Concrete Cubes) තත්ත්ව පරීක්ෂණය සඳහා නියැදිය ලබා ගෙන තිබුණේ මාර්ගයේ වැඩ අවසන් කළ දිනට පසු දිනක දී ය. ඒ නිසා තත්ත්ව පරීක්ෂණ වාර්තාවේ වලංගුතාව මතභේදාත්මක විය. තවද, ඉටුනොකළ වැඩ වෙනුවෙන් රු.26,304ක් ගෙවා තිබුණි. | වාර්තාව ගොනුගත කරගෙන නොමැති බව හා වැඩි පුර ගෙවා ඇති මුදල රඳවුම් මුදලින් ආපසු අය කර ගන්නා බව . | ආපසු අයකරගත යුතු වේ. |
| (ii) | කලගහවෙල තුන්වන පටුමග සංවර්ධනය කිරීමේදී එක් වැඩ විෂයයක් සඳහා රු.15,777ක් වැඩිපුර ගෙවා තිබුණි. එමෙන්ම, අවස්ථානුරූපව ගෙවා තිබුණු (Provisional Sum) රු.78,286ක් සඳහා වූ බිල්පත් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. | රේට් ගණනය කර ඇත්තේ ග්‍රාමීය මාර්ග සංවර්ධන අමාත්‍යාංශයෙනි. සියලු බිල්පත් ග්‍රාමීය මාර්ග සංවර්ධන අධිකාරියට යොමු කර ඇති නිසා ගොනුවේ එම බිල්පත්‍ර නොමැති බව. | වැඩිපුර ගෙවීම් ආපසු අයකරගත යුතු අතර කර්මාන්තයට අදාළ සියලු බිල්පත්වල පිටපත් ගොණුගත කළ යුතු වේ. |
| (iii) | කුඹුගොඩආර පුබුදු මාවතට යෙදූ කොන්ක්‍රීට්වල තත්ත්ව පරීක්ෂණය වෙනුවෙන් රු.30,856ක් ගෙවා තිබුණද, වාර්තාව ලැබී නොතිබුණි. එහි නාම පුවරුව සකසා සවිකිරීම සඳහා රු.10,000ක් ගෙවා තිබුණද, නාම පුවරුව සවිකර නොතිබුණි. | එම වාර්තාවේ පිටපතක් අමාත්‍යාංශය මගින් ගෙන්වා ගැනීමට කටයුතු කරනු ඇත. නාම පුවරුවට ගෙවීම් කළ මුදල, රඳවා ගැනීම්වලින් අයකර ගන්නා බව. | තත්ත්ව පරීක්ෂණ වාර්තාවේ පිටපතක් ලබාගත යුතු අතර ඉටු නොකළ වැඩ සඳහා ගෙවා ඇති මුදල ආපසු අයකළ යුතු වේ. |

**1.5.11.7 ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව**

**1.5.11.7.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ----------------------- | --------------------------- | ----------- |

| | | | |
|---|---|---|---|
| (i) | මුද්දර ගාස්තු, මුදල් පදනම මත ගිණුම් තැබීම ගිණුම්කරණ ප්‍රතිපත්තියක් වුවද, ඉකුත් වර්ෂ වෙනුවෙන් ලද රු.16,984,123ක මුද්දර ගාස්තු උපචිත පදනමට ගිණුම්ගත කර තිබුණි. | තවදුරටත් ඇති හිඟ ශේෂය පියවීමෙන් පසු මුදල් පදනමින් ගිණුම් සකස් කිරීමට කටයුතු කරන බව. | ඉදිරියේදී ගිණුම් ප්‍රතිපත්ති අනුව කටයුතු කළ යුතුය. |
| (ii) | පළාත් සභාවෙන් පරිත්‍යාග වශයෙන් ලද රු.950,000ක් වූ බෙලර් යන්ත්‍රයක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ ගිණුම් සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (iii) | ස්ථාවර තැන්පතු දෙකක පොළිය රු.136,941ක් ගිණුම්ගත කර නොතිබුණු අතර තවත් තැන්පතුවක පොළි ආදායම රු.191,062ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | පරික්ෂාකර නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (iv) | ගිණුම් විෂයයන් 06ක 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ සහ උපයෝගී ලේඛන අනුව එදිනට එම ශේෂ අතර රු.155,357,626ක වෙනසක් විය. | නොසැසඳීම් පරික්ෂාකර බලා නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වෙනසට හේතු හඳුනාගෙන නිරවුල් කළ යුතු වේ. |

**(ආ) විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| | විෂයය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------- | -------------------------- | ---------- |
| (i) | එකතුව රු. 1,968,712ක් වූ ගිණුම් විෂයයන් 04ක් තහවුරු කර ගැනීම සඳහා විස්තරාත්මක උපලේඛන හෝ වෙනත් මූලාශ්‍ර ලියවිලි ඉදිරිපත් නොකෙරුණි. | උපලේඛන ඉදිරිපත් නොකිරීම වරදක් ලෙස පිළිගන්නා බව. | විස්තරාත්මක උපලේඛන සකස් කළ යුතු වේ. |
| (ii) | තැන්පතු ගිණුම් 03ක පවතින එකතුව රු.9,337,414ක හර ශේෂ හඳුනාගෙන | නිරවුල් කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරගෙන යන බව. | අදාළ ශේෂ හඳුනාගෙන නිරවුල් කළ යුතු වේ. |

නිරවුල් කර නොතිබුණි. එමෙන්ම, ඊට අදාළ ලිඛිත තොරතුරු කිසිවක් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

### 1.5.11.7.2 අනුකූල නොවීම්

**(අ) නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| අනුකූල නොවීම් | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ----------------------- | ----------------- | -------------- |
| මුදල් රෙගුලාසි 371 (5) ට පටහැනිව, 1995 සිට 2019 වර්ෂ අතර කාලය තුළ අවස්ථා 43ක දී ලබා දුන් රු.2,001,389ක අත්තිකාරම් පියවා නොතිබුණි.<br>එමෙන්ම, 2017 වර්ෂයට අදාළ එකතුව රු.1,517,600ක් වූ කල් ඉකුත් වූ ටෙන්ඩර් හා විවිධ තැන්පතු, මුදල් රෙගුලාසි 571 (2) පරිදි නිරවුල් කර නොතිබුණි. | නොපියවා ඇති අත්තිකාරම් පියවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

### 1.5.11.7.3 ආදායම් පරිපාලනය

**(අ) ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| | ----------------------- | -------------------------- | ----------- |
| (i) | වසර 05කට වඩා පැරණි රු.15,181,158ක හිඟහිටි වරිපනම් ශේෂයක් හා රු.127,459ක හිඟහිටි අක්කර බදු ශේෂයක් 2022 දෙසැම්බර් 31 දිනට පැවැතිණි. | ජංගම සේවා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා නිලධාරීන් දෙදෙනෙකු විසින් ක්ෂේත්‍රයේ කටයුතු කරමින් හිඟ ආදායම් රැස්කරන බව . | හිඟ ආදායම් රැස් කළ යුතු වේ. |
| (ii) | ඇහැලියගොඩ සතිපොළෙන් 2012 වර්ෂය වෙනුවෙන් හිඟහිටි බදු කුළී, | මේ වනවිට නඩුව නැවත කැඳවීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර ඇති | හිඟ ආදායම් රැස් කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| අධිකරණ තීන්දුවකට අනුව 2016 අප්‍රේල් වනවිට ගෙවා නිමකළ යුතු වුවද, රු.180,000ක් තවදුරටත් අය වීමට පැවැතිණි. එමෙන්ම ඉකුත් වර්ෂ 02ක් සඳහා හිඟහිටි කඩකුලී රු.1,097,523ක් අයකර නොතිබුණි. | බවත් හිඟ කඩ කුලී අයකර ගැනීම සඳහා කටයුතු කරන බව. | |

**1.5.11.7.4 මෙහෙයුම් සමාලෝචනය**

**(අ) මතභේදයට තුඩුදුන් ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව සතු පොදු වැසිකිළියකට අයත් භූමිය, දුම්රිය රක්ෂිතය හරහා පුළුල්කළ විකල්ප මාර්ගයට ඇතුළත් වූ බවට 2012 මැයි මාසයේ දී සභාවේ ලේකම්වරයා විසින් ප්‍රකාශ කර තිබුණ ද, ඊට යාබද ඉඩමේ හිමිකරු විසින් එම ඉඩම තමන් විසින් භුක්ති විදින බවට දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කර තිබුණි. එසේ තිබිය දී, එම භූමියේ ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ඔහු විසින් ඉදිරිපත් කළ ගොඩනැගිලි අයදුම්පත, 2014 මැයි මාසයේ දී සභාව විසින් අනුමත කර තිබුණි. එහෙත් අයදුම්කරුට එම ඉඩමට ඇති අයිතිය පිළිබඳ තහවුරුවක් 2022 දෙසැම්බර් දක්වාම ලබා ගෙන නොතිබුණි. | සොයාබලා පිළිතුරක් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | පවතින නීති රීතිවලට යටත්ව කටයුතු කළ යුතුවේ. |

**(ආ) වාහන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|

| | | |
|---|---|---|
| ---------------------- | ------------------- | ------------ |
| අයිතිය සභාව සතු නොවූ වාහන 03ක අයිතිය පවරා ගැනීමට හෝ ආපසු භාර දීමට හෝ කටයුතු කර නොතිබුණු අතර අබලි වාහන 02ක් අපහරණය කර නොතිබුණි. | පවරා ගැනිමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින අතර අපහරණය කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතු වේ. |

**1.5.11.8 ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව**

**1.5.11.8.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ----------------------- | ---------- |
| (i) | එකතුව රු.13,853,282ක් වූ සභාව සතු ඉඩම් 03ක්, ගොඩනැගිලි 06ක් හා රු.2,730,527ක වෙනත් වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ii) | සමාලෝචිත වර්ෂය සඳහා හිඟහිටි බහුකාර්යය ගොඩනැගිලි කුලිය රු.140,000ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණු අතර බෙලිහුල්ඔය සංචාරක ගිමන් හල සඳහා ලැබිය යුතු කුලී රු.781,150ක් ගිණුම්ගත කර නොතිබුණි. | - එම - | - එම - |
| (iii) | ඉකුත් වර්ෂයේ ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කිරීම සඳහා දෝෂ සහගතව ද්විත්ව සටහන් තැබීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට සමුච්චිත අරමුදල රු.1,427,854ක් වැඩියෙන් දැක්වුණි. | - එම - | - එම - |
| (iv) | ගිණුම් විෂයයන් 07ක සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ සහ උපයෝගී ලේඛන අනුව ශේෂ | නොසැසඳීම් හඳුනාගෙන ශේෂ තුලනය කිරීමට මේ වන විටත් කටයුතු කරමින් පවතින බව. | වෙනස නිරවුල් කළ යුතු වේ. |

අතර රු.10,800,813ක වෙනසක් විය.

**(ආ) විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂයය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.113,902,104ක් වූ ගිණුම් විෂයයන් 05ක් තහවුරු කර ගැනීමට විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොවුණි. | අදාළ උපලේඛන 2023 වර්ෂයේ ගිණුමට ඉදිරිපත් කරන බව. | විස්තරාත්මක උපලේඛන ගිණුම් සමඟ ඉදිරිපත් කළ යුතු වේ. |

## 1.5.11.8.2 අනුකූල නොවීම්

**(අ) නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| අනුකූල නොවීම් | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තියේ (අ) සහ (ආ) උපවගන්ති පරිදි සභාව සතු මාර්ග හඳුනාගෙන ගැසට් පත්‍රයේ පළකර නොතිබුණි. | 2023 මැයි මාසය වන විට මාර්ග ගැසට් ලේඛනය නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතින බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 1.5.11.8.3 ආදායම් පරිපාලනය

**(අ) ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|

| | | | |
|---|---|---|---|
| (i) | වරිපනම් දේපළ වසර 05කට වරක් තක්සේරු කළයුතු වුවත්, 2011 වර්ෂයෙන් පසු තක්සේරුවක් සිදුකර නොතිබුණි. එමෙන්ම, 2018 වර්ෂයේදී හඳුනාගත් සංවර්ධිත ප්‍රදේශවලින් වරිපනම් බදු අයකර නොතිබුණි. | සංවර්ධිත ලෙස හඳුනාගත් ප්‍රදේශවල වරිපනම් ඒකක හඳුනාගැනීමේ කටයුතු 2022 වර්ෂයේ දි අවසන් කළ අතර වරිපනම් තක්සේරුව සඳහා ඉදිරි කටයුතු සිදු කරන බව. | ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය පරිදි කටයුතු කළ යුතු වේ. |
| (ii) | ජල ව්‍යාපෘති 10කින් වර්ෂ 01කට වඩා පැරණි රු.8,122,689ක් ද, වසර 03කට වඩා පැරණි අක්කර බදු රු.100,285ක් ද, JCB යන්ත්‍රය කුළියට දීම වෙනුවෙන් රු.610,840ක් ද, අයකර නොතිබුණි. එමෙන්ම, JCB යන්ත්‍රය බැහැර වැඩට ගාස්තු රහිතව ලබා දීම නිසා රු.179,550ක ආදායමක් අහිමි වී තිබුණු අතර නිර්දේශිත ගාස්තුවට පටහැනිව, ගාස්තු අයකිරීම නිසා රු.126,335ක ආදායමක් ද අහිමි වී තිබුණි. | හිඟ මුදල් අයකරගැනීමට කටයුතු කෙරේ. 2023 වර්ෂයේදී යන්ත්‍ර පැයක ඇස්තමේන්තු මුදල සංශෝධනය කර ගැසට් කිරීමේ කටයුතු සිදු කරන බව . | හිඟ ආදායම් අප්‍රමාදව අයකරගත යුතු වේ. |
| (iii) | බෙලිහුල්ඔය සංචාරක ගිමන්හල සඳහා 2021 අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා අයවිය යුතු රු.413,550ක් විෂයය භාර අමාත්‍යවරයාගේ/ ආණ්ඩුකාරවර අනුමැතිය ලබා නොගෙන කපාහැර තිබුණි. | ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා කටයුතු කරන බව. | ආණ්ඩුකාරවර අනුමැතිය ලබාගත යුතු වේ. |

**1.5.11.8.4 මෙහෙයුම් සමාලෝචනය**

**(අ) සන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| --------------------- | -------------------------- | ------------ |

| | | |
|---|---|---|
| දිරාපත් නොවන කසළ විශාල ප්‍රමාණයක් පරිසරයට අහිතකර වන ලෙස බැහැර කර තිබුණි. නොදිරන කසළ මධ්‍යස්ථානයක් සඳහා 2022 ජූනි මාසයේ ලද රු.950,000ක් වූ බෙලර් යන්ත්‍රය, 2022 දෙසැම්බර් වන විටත් අභාවිතව පැවැතිණි. | ඉදිරියේදී නොදිරන කසළ අංගනයක් ඉදිකිරීමට අවශ්‍ය සැලසුම් සකස් කර අදාළ අංශ වෙත යොමු කර ඇති බව. | අවශ්‍ය පහසුකම් ලබාගෙන යන්ත්‍රය උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වේ. |

**(ආ) මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2002 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා කාලයට අදාළ හඳුනා නොගත් අත්තිකාරම් රු.3,193,731ක් කපාහැරීම සඳහා ආණ්ඩුකාරවර අනුමැතියට යොමුකර තිබුණි. එමෙන්ම, 2010 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා නිකුත් කර තිබුණු රු.1,072,697ක් වූ අත්තිකාරම් 10ක් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් පියවා නොතිබුණි. | එම ශේෂ කපා හැරීම සඳහා ආණ්ඩුකාරවර අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කර ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

**(ඇ) වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | පහන්තුඩාව ඇල්ල අසල රු.1,852,279කින් නිමකළ වැසිකිළි පද්ධතිය සහිත භූමිය සභාව වෙත පවරා ගෙන නොතිබුණු අතර සභාව සතු සුසාන භූමි 133ක අයිතිය ද නිරවුල් කරගෙන නොතිබුණි. මේ නිසා එම ඉඩම් අනවසර අත්පත්කර ගැනීම්වලට | එම බිම් කොටස සභාව වෙත පවරා දෙන ලෙස අදාළ ආයතනය වෙත ඉල්ලීම් කර ඇති බව. | අදාළ බිම් කොටස පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. |

ලක්වීමේ අවදානමක් පැවැතිණි.

| | | | |
|---|---|---|---|
| (ii) | සභාව සතු ඉඩම් 24ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | සභාව සතු ඉඩම් තක්සේරු කර ගැනීම සඳහා ලිපි මඟින් තක්සේරු දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇති බව. | ඉඩම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතු වේ. |

**(ඈ) ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| -------------------- | ----------------------- | ------------ |
| දිය පහස ගිමන්හල 2022 නොවැම්බර් 01 දින සිට ඉදිරි මාස 08ක කාලයක් පවත්වාගෙන යාම, ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව හා ගිවිසුම්ගත වීමකින් තොරව පූර්ව බදුකරු වෙතම ලබා දී තිබුණි. | බදු දීම සඳහා මහ සභාව ගත් තීරණය ආණ්ඩුකාරවර අනුමැතියට යොමු කර ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**(ඉ) කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | -------------------------- | ------------ |
| කැපොක්වත්ත කොම්පෝස්ට් අංගනයේ රැඳවුම් බැම්ම ඉදිකිරීමේදී රු.51,290ක් වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවා ඇති මුදල රැඳවුම් මුදලින් අඩු කරන බව. | වැඩිපුර ගෙවා ඇති මුදල අඩු කළ යුතු වේ. |

**(ඊ) වාහන පද්ධතිය කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | --------------------- | ----------- |
| (i) | 2011 වර්ෂයේ දී සභාවට ලද රු.1,550,000ක් වූ ගලි බවුසරය, ලද දින සිට නිෂ්කාර්යව පවතී. | අපද්‍රව්‍ය බැහැර කිරීමට ස්ථානයක් නොමැති නිසා එය වෙනත් පළාත් පාලන ආයතනයකට ලබා දීමට කටයුතු කරන බව. | අවශ්‍යතාව ඇති ආයතනයකට එය පැවැරිය යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ii) | අයිතිය සභාව සතු නොවූ ට්‍රැක්ටර් 05ක හා ටේලර 04ක අයිතිය පවරා ගැනීමට හෝ ආපසු භාර දීමට හෝ කටයුතු කර නොතිබුණු අතර අබලි වාහනයක් අපහරණය කර නොතිබුණි. | එම වත්කම් පවරා ගැනීමට කටයුතු කරන බව හා ගර්භිත කැබ් රථය සබරගමුව පළාත් සභාවට අයත් රථයක් බැවින් ඒ වෙනුවෙන් ප්‍රධාන ලේකම් වෙත ලිපි යොමු කර ඇති බව. | චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතු වේ. |

**1.5.11.9.** **කලවාන ප්‍රාදේශීය සභාව**

**1.5.11.9.1** **මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**(අ)** **ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ------------------------- | ----------- |
| (i) | එකතුව රු. 7,438,621ක් වූ සභාව සතු වාහනයක්, පුස්තකාල පොත් හා ගලි ටැංකිය ගිණුම්ගත කර නොතිබුණු අතර වාහනයක් හා වයිබ්‍රේටර් යන්ත්‍රයක පිරිවැය රු.1,100,000ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ii) | සභාව සතු ට්‍රැක්ටරයක හා බයිසිකලයක පිරිවැය වූ රු.973,750ක් ස්ථාවර වත්කම් යටතේ දෙවරක් ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ අවසන් මූල්‍ය ප්‍රකාශ සකස් කර ගැනීමේ දී නිවැරදි කරන බව. | මෙය නිවැරදි කළ යුතු වේ. |
| (iii) | සමාලෝචිත වර්ෂයට අදාළ කුලී බිල්කිරීම්, රු.450,950ක් වැඩියෙන් ද, රු.327,812ක් අඩුවෙන් ද ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරන බව. | අදාළ වටිනාකම ගිණුම්ගත කළ යුතු වේ. |
| (iv) | පරිත්‍යාග ලෙස ලද බෙලර් යන්ත්‍රයක රු.950,000ක් වූ වටිනාකම මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනයේ ගලපා නොතිබුණි. | ඉදිරියේදී මෙවන් වැරදි සිදු නොවීමට කටයුතු කරන බව | අදාළ වටිනාකම ගිණුම්ගත කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (v) | ගිණුම් විෂයයන් 06ක 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ සහ උපයෝගී ලේඛන අනුව ශේෂ අතර රු.3,885,758ක වෙනසක් විය. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරන බව. | වෙනසට හේතු හඳුනාගෙන නිරවුල් කළ යුතු වේ. |

**(ආ) විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂයය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.65,211,076ක් වූ ගිණුම් විෂයයන් 04ක් වෙනුවෙන් විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කර නොතිබුණි. | පෙර වර්ෂවල මූල්‍ය ප්‍රකාශන හා උපලේඛන පරීක්ෂා කර අවශ්‍ය කටයුතු කරන බව. | විස්තරාත්මක උපලේඛන සකස් කළ යුතු වේ. |

**1.5.11.9.2 අනුකූල නොවීම්**

**(අ) නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2007 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අදාළ එකතුව රු.17,167,333ක් වූ කල් ඉකුත් වූ විවිධ තැන්පතු, මුදල් රෙගුලාසි 571 (2) ප්‍රකාරව නිරවුල් කර නොතිබුණි. | තවදුරටත් සොයා බලා මුදල් රෙගුලාසි 571 (2) ප්‍රකාරව නිරවුල් කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**1.5.11.9.3 ආදායම් පරිපාලනය**

**(අ) ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|

| | | | |
|---|---|---|---|
| | ----------------------- | ------------------------- | ----------- |
| (i) | 2021 වර්ෂයේදී හඳුනාගත් සංවර්ධිත ප්‍රදේශ 04ක් ප්‍රකාශයට පත්කර වරිපනම් බදු අය කර නොතිබුණි. | එම ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීමට අනුමැතිය සඳහා ආණ්ඩුකාරතුමා වෙත යොමු කර ඇති බව. | සංවර්ධිත ප්‍රදේශ ප්‍රකාශයට පත්කර වරිපනම් අය කළ යුතු වේ. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැවති රු.1,812,305ක් වූ හිඟ වරිපනම් ශේෂය තුළ වසර 05ට වඩා පැරණි රු.840,568ක ශේෂයක් පැවැතිණි. | හිඟ වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් නොපමාව රැස් කළ යුතු වේ. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.237,919ක් වූ හිඟ අක්කර බදු ශේෂය තුළ වසර 03කට වඩා පැරණි රු.228,212ක ශේෂයක් පැවැතිණි. | දැනුවත් කිරීම් සිදු කළ ද ලැබීම් අවම වූ අතර බදු අයකිරීම ඉතා අපහසු බව. | හිඟ ආදායම් රැස් කළ යුතු වේ. |
| (iv) | සමාලෝචිත වර්ෂය අවසානය දක්වා හිඟ සතිපොළ ගාස්තු රු.118,559ක් අයකර නොතිබුණි. | අදාළ හිඟ මුදල අය කර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (v) | අලුතින් ඉදිකළ සතිපොළ කඩකාමර 191ක් සඳහා විධිමත් තක්සේරුව ලැබෙන තෙක්, රු.10,000ක් එකවර අයකරගෙන වසර 05ක් සඳහා ගිවිසුම්ගතව ලබාදීමට මහා සභාව තීරණය කර තිබුණ ද, එලෙස කටයුතු නොකර කඩකාමර ලබා දී තිබුණි. | අදාළ ගිවිසුම් අත්සන් කිරීම සිදු කරමින් පවතින බව. | ගිවිසුම් ගතවීමට කටයුතු කළ යුතු වේ. |
| (vi) | පරිසර බලපත්‍ර ලබාගත යුතු ආයතන පිළිබඳ සමීක්ෂණයක් 2022 වර්ෂය තුළ සිදුකර නොතිබුණි. | 2023 වර්ෂයේ දී විධිමත්ව සමීක්ෂණය සිදු කර ආදායම අයකර ගැනීමට කටයුතු කරන බව. | වාර්ෂික සමීක්ෂණ සිදුකර පරිසර බලපත්‍ර නිකුත් කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (vii) | 2022 වාර්ෂික සමීක්ෂණය මගින් හඳුනාගත් දැන්වීම් පුවරු 132ක් සඳහා රු.676,325ක් අයකරගෙන නොතිබුණි. | 2023 වසරේදී නිවැරදි සමීක්ෂණයක් සිදු කර අයකර ගැනීමට කටයුතු කරන බව. | වාර්ෂික සමීක්ෂණ සිදුකර හිඟ ආදායම් අය කළ යුතු වේ. |
| (viii) | ත්‍රීරෝද රථ සංගම් 04කට අයත් ත්‍රීරෝද රථ 65කින් රු.111,000ක ගාස්තු අයකර නොතිබුණි. | ත්‍රීරෝද රථ සංගම් සඳහා හිඟ ගාස්තු යොමු කොට ඇති අතර හිඟ මුදල් අය කර ගැනීමට කඩිනමින් කටයුතු කරන බව. | හිඟ ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

**1.5.11.9.4 මෙහෙයුම් සමාලෝචනය**

**(අ) සන අපද්‍රව්‍ය කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ------------------------- | ----------- |
| (i) | කසළ අංගනයක් සඳහා ඉඩමක් ලබා ගැනීමට 2021 වර්ෂයේ දී කලවාන ප්‍රාදේශීය ලේකම් වෙත රු.50,000ක් ගෙවා තිබුණද, අත්පත් කර ගැනීමේ කටයුතු නිමකර නොතිබුණි. එමෙන්ම, නොදිරන කසළ ප්‍රතිචක්‍රීයකරණය සඳහා 2022 අගෝස්තු මාසයේ පළාත් සභාවෙන් ලද රු.950,000ක් වටිනා බෙලර් යන්ත්‍රය 2023 ජනවාරි වනවිටත් අභාවිතව පැවතුණි. | සභාවේ මුදල් තත්ත්වය යහපත් වූ පසු මෙම කාරණා අවසන් කිරීමට බලාපොරොත්තු වන බව. | ඉඩම පවරා ගැනීම හා තෙකලා විදුලි සැපයුම ලබාගෙන බෙලර් යන්ත්‍රය උපයෝජනය කිරීමට කඩිනමින් කටයුතු කළ යුතු වේ. |
| (ii) | වාර්ෂිකව කසළ මෙට්‍රික් ටොන් 1620ක් පමණ බැහැර කිරීමට සේවකයින් 05 දෙනෙකු සහ වාහන හා යන්ත්‍ර උපකරණ 02ක් වෙනුවෙන් රු.4,187,615ක් වැයකර තිබුණ ද, එම අපද්‍රව්‍ය පරිසර හිතකාමීව බැහැර කර නොතිබුණි. | කසල වෙන් කිරීමේ මධ්‍යස්ථානයක් සඳහා සුදුසු භූමියක් නිරීක්ෂණය කරමින් පවතින බව. | විධිමත් සන අපද්‍රව්‍ය කළමණාකරණ වැඩ සටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු වේ. |

(ආ) **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (i) මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2021 වර්ෂයේදී රැගෙන ගොස් තිබුණු ගල්රෝල ආපසු භාර දී නොතිබුණි. එය මාස 08ක පමණ කාලයක් වැද්දාගල ප්‍රදේශයේ නිවසක රඳවා තිබිය දී එහි බැටරි 02ක් සොරකම් කිරීමෙන් වූ රු.187,260ක හානිය ප්‍රතිපූරණය කර නොතිබුණු අතර, අධිකාරියෙන් අයකර ගත යුතු රු.96,460ක කුලී ගාස්තුව ද 2022 දෙසැම්බර් දක්වාම අයකර නොතිබුණි. | යන්ත්‍රය අලුත්වැඩියා කිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය වෙත දන්වා ඇති අතර රු.265,360 ක කුලී වටිනාකමින් රු.168,900ක් මේ වනවිට අයකරගෙන ඇති බව. | හිඟ ආදායම් රැස්කර ගැනීමටත්, හානිය ප්‍රතිපූරණය කර ගැනීමටත් කටයුතු කළ යුතු වේ. |
| (ii) 2022 ජූලි මාසයේ අනතුරට පත් ගලි බවුසරය 2023 ජනවාරි දක්වාම අලුත්වැඩියාකර නොතිබුණි. මේ නිසා ගලි සේවාව සැපයීමට නොහැකි වීමෙන් ආදායම් මාර්ගයක් ද අහිමි වී තිබුණි. | ගලිබවුසරයේ අලුත්වැඩියා කටයුතු අවසන් අදියරේ පවතින බව. | අලුත්වැඩියා කර සේවා සැපයීම සඳහා යොදා ගත යුතු වේ. |
| (iii) අනවසර ඉදිකිරීම් හඳුනාගැනීම සඳහා විධිමත් වැඩපිළිවලක් සභාවට නොතිබුණි. | අනවසර ඉදිකිරීම් පිළිබඳව වාර්තා ලබා දෙන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කර ඇති බව. | අනවසර ඉදි කිරීම් හඳුනා ගෙන කටයුතු කළ යුතු වේ. |

(ඇ) **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |

| | | |
|---|---|---|
| මළ අපද්‍රව්‍ය බැහැර කිරීමට ඉදිකළ ටැංකියක් සඳහා කුකුලේගම ජල විදුලි බලාගාරය විසින් අවසර නොදීම නිසා ඒ වෙනුවෙන් වැය කළ රු.902,100ක් නිෂ්ඵල වියදමක් වී තිබුණු අතර, මළ අපද්‍රව්‍ය බැහැර ලීමේ ගැටළුව ද විසඳී නොතිබුණි. | කර්මාන්තයේ ඉදිකිරීම් කටයුතු පමණක් සංවර්ධන අංශය මගින් සිදු කළ බව. | අනුමැතිය විධිමත් පරිදි ලබාගෙන ඉදිකිරීම් කටයුතු සිදු කළ යුතු වේ. |

**(ඇ) මතභේදයට තුඩුදුන් ගනුදෙනු**

--------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ------------------------- | ----------- |
| සභාපතිවරයාට සභා බල ප්‍රදේශයෙන් බැහැර ගමන් යාම සඳහා කුලී පදනම මත ලබාගෙන තිබූ වාහන වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 08ක දී රු.502,118ක් ගෙවා තිබුණි. මෙම ගෙවීම තුළ පැල්මඩුල්ල හා දඹුල්ල ප්‍රදේශවල පැවති දේශපාලනික රැස්වීම්වලට යැම වෙනුවෙන් ගෙවන ලද රු.75,405ක් ද ඇතුළත් විය. | ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුකූලව කුලී රථ ලබා ගැනීමට දීර්ඝ කාලයක් ගත වන බැවින් ගරු සභාපතිතුමාගේ රාජකාරී සඳහා දිස්ත්‍රික් මිල කමිටු වාර්තාවට අනුව කාර්මික නිලධාරී මහතාගේ නිර්දේශය මත කුලී රථ ලබා ගැනීම සිදු කර ඇති බව. | වාහන කුලියට ගැනීම සභාවේ රාජකාරී කටයුතු සඳහා පමණක් සිදු කළයුතු වේ. |

**(ඉ) වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ------------------------- | ----------- |
| සභාව සතු නොවූ වාහන 08ක් හිමිකාරීත්වය, පවරා ගැනීමට හෝ ආපසු භාර දීමට හෝ කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීමට කටයුතු කරන බව. | 02/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතු වේ. |

**(ඊ) කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පොතුපිටිය පාසැල අසළ ක්‍රීඩාපිටියේ සංවර්ධන කටයුතු රු.1,474,413කින් නිමකර 2021 දෙසැම්බර් 13 දින වැඩ අවසන් වාර්තාව ලබා දී තිබුණි. එහෙත් 2023 මාර්තු වන විටත් වැසි ජලය නිසි පරිදි ගලායාමට සලස්වා නොතිබීම හා තෘණ අතුරා වැඩ අවසන් කර නොතිබීම නිසා ක්‍රීඩා කටයුතු සඳහා යොදාගත නොහැකි වී තිබුණි. | පස් තුනී කර යතා තත්වයට පත් කර ඇති අතර සියයට 95ක පමණ කටයුතු මේ වන විට අවසන් කර ඇති බව. | ක්‍රීඩා කටයුතු සඳහා යොදාගත හැකි ආකාරයට ක්‍රීඩාපිටියේ වැඩ නිමකළ යුතුවේ. |

**1.5.11.10 කහවත්ත ප්‍රාදේශීය සභාව**

**1.5.11.10.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (i) | සමාලෝචිත වර්ෂය තුළ ඉටු කළ රු.2,265,500ක් වූ සංවර්ධන ව්‍යාපෘති 04ක වියදම සහ රු.1,000,000ක ඉඩමක් ගිණුම්ගත කර නොතිබුණි. | 2023 අවසන් ගිණුම සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ii) | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු විශ්‍රාම වැටුප් දායක මුදල් රු.5,053,041ක් ගිණුම්ගත කර නොතිබුණි. | 2023 අවසන් ගිණුම සකස් කිරීමේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (iii) | සමුච්චිත අරමුදලේ ශේෂය සහ මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය අතර 2022 දෙසැම්බර් 31 | ඉදිරියේ දී නිවැරදිව ගැළපීම් සිදු කිරීමට | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| දිනට රු.1,653,164ක වෙනසක් පැවැතිණි. | කටයුතු කරන බව. | |

**(ආ) විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු. 74,277,172ක් වූ ඉඩම් හා ගොඩනැගිලි, යන්ත්‍ර හා උපකරණ සහ ලී බඩු හා සවිකිරීම් පිරිවැය තහවුරු කර ගැනීමට විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොවුණි. | සියලු විස්තර ඇතුළත් උප ලේඛනයක් පවත්වා ගෙන යාමට ඉදිරියේ දී කටයුතු කරන බව. | විස්තරාත්මක උපලේඛන සකස් කළ යුතු වේ. |

**1.5.11.10.2 අනුකූල නොවීම්**

**(අ) නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| | අනුකූල නොවීම් | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2011 හා 2017 වර්ෂවල දී ලබා දුන් රු.93,175ක් වූ අත්තිකාරම් 02ක් මුදල් රෙගුලාසි 371(5) අනුව නිරවුල්කර නොතිබුණි. | එක් අත්තිකාරමක් සඳහා විමර්ශනයක් පැවැත්වේ. රු.20,000ක අත්තිකාරම පියවන ලෙස හිටපු සභාපතිවරයා ලිඛිතව දැනුවත් කර ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ii) | ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 14ක් වෙනුවෙන් සභාව විසින් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | ප්‍රධාන කාරණා 16 වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා ඇත. අනු බෙදුම් හා ගොඩනැගිලි ඉදිකිරීම් සැලසුම් පරීක්ෂා කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව පරිවර්තනය | ප්‍රාදේශීය සභා පනතේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

සඳහා යොමු කර ඇත.

### 1.5.11.10.3 ආදායම් පරිපාලනය

**(අ) ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | අනුකූල නොවීම් | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.329,167ක් වූ හිඟ වරිපනම් ශේෂය හා රු.23,858ක් වූ හිඟ අක්කර බදු ශේෂය වසර 03කට වඩා පැරණි විය. | වරිපනම් කොටසක් අයකර ඇත. ආර්ථික අර්බුදය නිසා දේපළ තහනම් නොකිරීමට සභාව තීරණය කර ඇත. තොරතුරු සොයා ගෙන හිඟ අක්කර බදු අය කෙරේ. | හිඟ ආදායම් නොපමාව රැස්කළ යුතු වේ. |
| (ii) | 2008 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා කාලයට අදාළ හිඟ සතිපොළ ගාස්තු හා මාළු කඩ කුලී රු.574,320ක් ද, පොදු වෙළඳපොළ කඩකාමරයක් සඳහා මාස 23ක හිඟ කුලී රු.148,570ක් ද අයකර නොතිබුණි. | හිඟ රු.46,667ක් සභා අනුමැතියකින් කපා හැර ඇත. ඉතිරි හිඟ සඳහා ඉදිරි කටයුතු සිදු කරන බව. | හිඟ ආදායම් නොපමාව රැස්කළ යුතු වේ. |
| (iii) | ප්‍රදර්ශිත දැන්වීම් පුවරු සඳහා සමීක්ෂණයක් 2022 වර්ෂයේ සිදු නොකළ බැවින් අයකළ එම ගාස්තුවල නිවැරදිතාව තහවුරු නොවුණි. | කොරෝනා තත්ත්වය හේතුවෙන් සමීක්ෂණ සිදු නොකළ බව. | හිඟ ආදායම් නොපමාව රැස්කළ යුතු වේ. |

### 1.5.11.10.4 මෙහෙයුම් සමාලෝචනය

**(අ) මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|

| | | | |
|---|---|---|---|
| (i) | 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා හඳුනාගෙන තිබුණු අනවසර ඉදිකිරීම් 29ක් සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 47 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අනවසර ඉදිකිරීම් ලේඛනයක් නඩත්තු කිරීමට හා අනවසර ඉදිකිරීම් කළ අයට කිසිදු අවසර පත්‍රයක් නිකුත් නොකිරීමට සභා සම්මත කර ඇති බව. | අනවසර ඉදි කිරීම් හඳුනා ගෙන කටයුතු කළ යුතු වේ. |
| (ii) | ඇන්දාන ප්‍රාදේශීය සභා ජල ව්‍යාපෘතියෙහි පාරිභෝගිකයින් 30 දෙනෙකුගේ ජල මීටර් වසර 02කට වැඩි කාලයක සිට අක්‍රීය වී තිබුණ ද, ඒ සඳහා නව ජල මීටර් සවිකර නොතිබුණි. | නව සබඳතා ලබා දීමට ජල මනු යෙදවූ අතර ඉල්ලා ඇති ජල මනු 100ක් ලද පසු සවිකිරීමට කටයුතු කරන බව. | ජල මනු සවිකිරීමට කටයුතු කළ යුතු වේ. |
| (iii) | හවුපෙ වතුයායේ කසළ බැහැර කරන අක්කර 04ක භූමිය පවරා ගෙන නොතිබුණි. එමෙන්ම, වාර්ෂිකව කසළ මෙට්‍රික් ටොන් 750ක් පමණ බැහැර කිරීමට සේවකයින් 15 දෙනෙකු සහ වාහන හා යන්ත්‍ර උපකරණ 06ක් වෙනුවෙන් රු.11,290,769ක් වැයකර තිබුණ ද, එම අපද්‍රව්‍ය පරිසර හිතකාමීව බැහැරකර නොතිබුණි. | කඩිනමින් මෙම ඉඩම පවරා ගැනීමට කටයුතු කරන බව හා කසළ බැහැර කරන ඉඩම පවරා ගත් පසු කසළ ප්‍රතිචක්‍රීකරණ වැඩසටහන ආරම්භ කරන බව. | ඉඩම පවරා ගැනීම කඩිනම් කළ යුතු අතර සන අපද්‍රව්‍ය කළමණාකරණ වැඩ සටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු වේ. |

**(ආ) නිෂ්කාර්යය වත්කම්**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ---------------------- | ---------- |
| අලුත්වැඩියාවක් සඳහා 2017 වර්ෂයේ දී භාර දුන් ට්‍රැක්ටරයක් වර්ෂ 05ක කාලයක් ගරාජයක් තුළ නිෂ්කාර්යව පැවතීම නිසා එන්ජිම | 2022 වර්ෂයේ දී ට්‍රැක්ටරය රැගෙන එන ලදී. රථය අලුත්වැඩියාව සඳහා ලබා දුන් අත්තිකාරම පියවීම සඳහා මු.රෙ. | කඩිනමින් පරීක්ෂණය නිමකර වගකිව යුතු අය නිශ්චය කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| පණ ගැන්වීමට නොහැකිව මේ දක්වාම අභාවිතව පවතී. | 104 යටතේ පරීක්ෂණයක් සිදු කරමින් පවතින බව. | |

(ඇ) **වාහන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ---------------------- | ------------ |
| අයිතිය සභාව සතු නොවූ වාහන 08ක අයිතිය පවරා ගැනීමට හෝ ආපසු භාර දීමට හෝ කටයුතු කර නොතිබුණු අතර අබලි වාහන 05ක් අපහරණය කර නොතිබුණි. | පැවරීම් සඳහා ලිපි භාර දී මුදල් ගෙවා ඇති අතර ගැටලු විසඳමින් අපහරණය කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතු වේ. |

**1.5.11.11 කුරුවිට ප්‍රාදේශීය සභාව**

**1.5.11.11.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

(අ) **ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ------------------------- | ------------ |
| (i) | කම්කරු විවේකාගාරයේ පිරිවැය රු.637,043ක් ප්‍රාග්ධනිත කර නොතිබුණු අතර සංවර්ධන ව්‍යාපෘති 04ක වියදම රු.5,541,745ක් වැඩියෙන් ප්‍රාග්ධනිත කර තිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වටිනාකම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ii) | වරිපනම් සහ අක්කර බදු හිඟහිටි අධි ගාස්තු රු.480,548ක් ගිණුම්ගත කර නොතිබුණි. | - එම - | - එම - |
| (iii) | දෝෂසහගතව ද්විත්ව සටහන් තැබීමෙන් ලී බඩු හා සවිකිරීම් සහ | - එම - | - එම - |

| | | | |
|---|---|---|---|
| | ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම රු.92,400කින් වැඩියෙන් දැක්වුණි. | | |
| (iv) | ලද ආයුර්වේද ආධාර රු.103,334ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | - එම - | - එම - |
| (v) | ස්ථාවර තැන්පතු ගිණුමේ ශේෂය 2020 වර්ෂයේ සිට රු.51,664,000ක් අඩුවෙන් ඉදිරියට ගෙනවිත් තිබුණු අතර, රු.57,724,871ක ප්‍රාග්ධන ආධාර ලැබිය යුතුව පවතින බවට එම වර්ෂයේදීම සාවද්‍ය ලෙස සටහන් තබා තිබුණි. එහෙත් 2022 වර්ෂය තුළ දී හෝ එම වැරදි නිවැරදි කර නොතිබීම නිසා රු.109,388,871ක නොවිසිඳුණු අවිනිශ්චිත ශේෂයක් මූල්‍ය ප්‍රකාශන තුළ පැවැතිණි. | - එම - | මෙය නිවැරදි කළ යුතු වේ. |
| (vi) | ස්ථාවර තැන්පතු, ප්‍රාග්ධන ආධාර, සේවක ණය, නිරවුල් කරගත නොහැකිව පැවැති අත්තිකාරම් ගිණුම්වලට 2020 සහ 2021 වර්ෂවලදී යොදා තිබුණු රු.114,806,153ක බැර සටහන් හා රු.98,391,679ක හර සටහන් ද, එම සටහන්වල ප්‍රතිවිරුද්ධ සටහන ලෙස සමුච්චිත අරමුදලට යෙදූ සටහන් ද තථ්‍ය ගනුදෙනුවක ප්‍රතිඵලයක් ලෙස සිදුකළ ගිණුම්ගත කිරීම් නොවුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මෙය නිවැරදි කළ යුතු වේ. |
| (vii) | ගිණුම් විෂයයන් 07කට අදාළව සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ සහ උපයෝගී ලේඛන අනුව ශේෂ අතර රු.161,077,208ක වෙනසක් විය. | වරිපනම් බදු අධි ගාස්තු ගිණුම් ගත නොකිරීම එම වෙනසට හේතු වී ඇති බව. | වෙනසට හේතු හඳුනාගෙන නිරවුල් කළ යුතු වේ. |

**(ආ) විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂයය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.214,055ක් වූ ගිණුම් විෂයයන් 03ක් තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකෙරුණි. | විස්තර සොයා ගැනීමට අපහසු බැවින් ලියා හැරීම සඳහා අනුමැතියට පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කර ඇති බව. | විස්තරාත්මක උප ලේඛන ඉදිරිපත් කළ යුතු වේ. |

**(ඇ) අධිකාරී බලය නොලත් ගණුදෙණු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂයේදී එකතු වටිනාකම රු.575,358,836ක් වූ ජ'නල් සටහන් 29ක් අනුමත කර නොතිබුණු අතර ජ'නල් වවුචර් ද පිළියෙල කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ ගිණුම් සැකසීමේදී නිවැරදිව කිරීමට කටයුතු කරන බව. | සියලු ජ'නල් සටහන් විධිමත්ව අනුමත කළ යුතු වේ. |

### 1.5.11.11.2 අනුකූල නොවීම්

**(අ) නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 371 (5)ට අනනුකූලව, 2009 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළ එකතුව රු.2,614,981ක් වූ අත්තිකාරම් පියවා නොතිබුණි. | අත්තිකාරම් ලේඛනයෙන් කපා හැරීමට ආණ්ඩුකාරවර කාර්යාලය වෙත යොමු කර ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ii) | පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස්වලට පටහැනිව සභාවේ පරිපාලන අවශ්‍යතා නොවූ ගමන් වෙනුවෙන් රු.53,000ක් වැයකර තිබුණි. | එම වියදම් නැවත පියවන ලෙස සභාපතිවරයා වෙත ලිඛිතව දැනුවත් කර ඇති බව. | උපදෙස් අනුව කටයුතු කළ යුතු වේ. |

### 1.5.11.11.3 ආදායම් පරිපාලනය

**(අ) ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ------------------------- | ------------- |
| (i) | වසර 05ට වඩා පැරණි රු.825,776ක හිඟහිටි වරිපනම් ශේෂයක් හා වසර 03කට වඩා පැරණි රු.648,097ක හිඟහිටි අක්කර බදු ශේෂයක් 2022 දෙසැම්බර් 31 දිනට පැවතිණි. | ජංගම සේවා මඟින් හා ක්ෂේත්‍ර පරීක්ෂා මඟින් හිඟ අයකරන අතර අක්කර බදු සඳහා ඉඩම් නිශ්චය කිරීම හා ඉඩම් ගැටලු විසඳීමට ඇති බව. | හිඟ ආදායම් රැස් කළ යුතු වේ. |
| (ii) | වර්ෂ 03කට වඩා පැරණි හිඟහිටි කඩකුලී රු.1,149,850ක් හා දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 24කින් ව්‍යාපාර බදු රු.63,000ක් අයකර නොතිබුණි. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් රැස් කළ යුතු වේ. |

### 1.5.11.11.4 මෙහෙයුම් සමාලෝචනය

**(අ) මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------ | ----------------- | -------------- |
| අක්කර 10ක් පවරා ගැනීමට සභාව විසින් 2015 වර්ෂයේදී රු. මිලියන 3.5ක් කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා තිබුණි. එහෙත්, සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් ඉඩම පවරාගත නොහැකි වීමෙන් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ | ඉඩම පවරා ගැනීම සඳහා වූ ලිපිලේඛන අවශ්‍ය ආයතන වෙත යොමු කර එම ආයතනවල ඉල්ලීම් අනුව නැවත නැවතත් ලිපි ලේඛන සකස් කර යොමු කර ඇති බව. | ඉඩම කඩිනමින් පවරා ගෙන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්මකට අනුව කටයුතු කළ යුතු |

| | | |
|---|---|---|
| වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. | | වේ. |

**(ආ) මතභේදයට තුඩුදුන් ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අයිතිය සභාව සතු නොවූ කැබ් රථයක් 2015 වර්ෂයේ සිට අභාවිතව තිබී පසුව 2022 මැයි මාසයේ දී එය ගිනි තබා විනාශ කර තිබුණි. මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 අනුව හානිය හා වගකිව යුතු අය නිශ්චය කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් කටයුතු කර නොතිබුණි. | අධිකරණ කටයුතු අවසන් වී නොමැත. 2018 අංක 34 දරන හානිපූර්ණ කාර්යාල පනත යටතේ අලාභ අය කිරීමට ජනාධිපති කාර්යාලය වෙත යොමුකර ඇත. හානිය පිළිබඳ මු.රෙ.104 යටතේ පරීක්ෂණ සිදුකර පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**(ඇ) වාහන උපයෝජනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2015 වර්ෂයේදී රජයෙන් ලද බැකෝ ලෝඩරයක අයිතිය පවරා ගැනීමට හෝ ආපසු භාර දීමට හෝ පියවර ගෙන නොතිබුණි. අබලි වාහන 03ක අලුත්වැඩියා හෝ අපහරණ කටයුතු, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිමකර නොතිබුණි. | ලියාපදිංචි අයිතිය පවරා ගෙන නොමැති බව හා අදාළ වාහන අලුත්වැඩියා කිරීමට කටයුතු කර ගෙන යන බව. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතු වේ. |
| (ii) | සභාව සතු බොබ්කැට් යන්ත්‍රයක්, කම්පැක්ටර් යන්ත්‍රයක් සහ මෝටර් බෝට්ටුවක් වසර 07ත් වසර 10ත් | බොබ්කැට් යන්ත්‍රය අවශ්‍යතාව පරිදි සේවයේ යොදවන බව, කම්පැක්ටර් යන්ත්‍රය අළුත්වැඩියා කිරීමට | වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| අතර කාලයක සිට අභාවිතව පැවැතිණි. | කටයුතු කරන බව හා මෝටර් බෝට්ටුවේ එන්ජිම සම්බන්ධව පවතින නඩුව අවසන් වී නොමැති බව. | . |

**(ඇ) ආර්ථික නොවූ ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------ | ------------------------- | ------------- |
| සභාවේ නඩු කටයුතු සඳහා රු.25,000ක මාසික දීමනාවකට නීතිඥවරයෙකුගේ සේවය ලබා ගැනීමට 2021 ජූලි 16 දින පැවති මහා සභාවේ දී තීරණය කර එදිනම ප්‍රසම්පාදන කාර්ය පටිපාටියෙන් බැහැරව නීතිඥවරයෙකු සමඟ ගිවිසුම්ගත වී තිබුණි. පසුව, 2021 ජූලි සිට 2022 දෙසැම්බර් දක්වා ඔහු වෙත රු.425,000ක් මාසික දීමනා ලෙස ගෙවා තිබුණි. එහෙත්, ඊට අමතරව එම කාලපරිච්ඡේදය වෙනුවෙන්ම සභාවේ නඩු කටයුතු සඳහා ඔහු වෙත තවත් රු.103,920ක් හා වෙනත් නීතිඥවරුන් වෙත රු.578,627ක් ගෙවා තිබුණි. | විශාල මුදලක් වැය වන නඩු කටයුතු වෙනුවෙන් නීතිඥවරයකු පත්කර ගැනීමට සහ මාසික දීමනාවක් ලබාදීමට මහා සභාවේ යෝජනා ස්ථිර කර ඇති බවත් නීතිඥවරයා සමඟ ගිවිසගත් දිනට පෙර සිට ඔහු විසින් සහ අනෙකුත් නීතිඥවරු විසින් මෙහෙයවන නඩු සඳහා ගාස්තු ගෙවා ඇති බව. | මාසික දීමනාවක් ගෙවා නීතිඥවරයෙකුගේ සේවය ලබා ගන්නේ නම් නඩු කටයුතු සඳහා අමතර ගාස්තු නොගෙවිය යුතු වේ. |

**(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ----------------------- | -------------------------- | ----------- |
| ඉදි කිරීම් 03ක දී රු. 70,622ක් වැඩිපුර ගෙවා තිබුණි. | රු.28,942ක් සඳහා පිළිතුරු දී නොතිබුණි. ඉතිරි වැඩිපුර ගෙවීම් ආපසු ගෙවන ලෙස අදාළ සමිතිය වෙත ලිඛිතව | වැඩිපුර ගෙවීම් අයකර ගත යුතුවේ. |

දැනුම් දී ඇති බව.

**1.5.11.12 කොලොන්න ප්‍රාදේශීය සභාව**

**1.5.11.12.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | -------------------------- | ------------ |
| (i) | එකතුව රු.1,164,487ක් වූ යන්ත්‍ර උපකරණ, ලී බඩු හා සවිකිරීම් හා වාහන නැවැත්වීමේ අංගනයේ පිරිවැය ප්‍රාග්ධනිත කර නොතිබුණි. එමෙන්ම, කොම්පෝස්ට් අංගනය ඉදිකිරීමේ පිරිවැය රු.573,787ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ ගිණුම සකස් කිරීමේදී නිවැරදි කරන බව. | වටිනාකම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයහිමි ශේෂය රු.27,369,952ක් ද කර්මාන්ත ණයගැති ශේෂය රු.25,633,709ක් ද වැඩියෙන් දක්වා තිබුණි. | 2023 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කරන බව. | වටිනාකම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (iii) | සමාලෝචිත වර්ෂයට අදාළ හිඟ දැන්වීම් පුවරු ගාස්තු රු.58,650ක් හා හිඟ සම්ප්‍රේෂණ කුළුණු ආදායම් රු.12,000ක් ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කරන බව. | වටිනාකම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (iv) | සභා අරමුදලින් ගෙවන ලද දෛනික කම්කරු වැටුප් රු.110,889ක් ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර | 2023 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කරන බව. | වටිනාකම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| තැන්පතු සහ ලැබිය යුතු සතිපොළ ගාස්තු රු.134,915ක් වැඩියෙන් දක්වා තිබුණි. | | |

| | | | |
|---|---|---|---|
| (v) | ගිණුම් විෂයයන් 04ක සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ සහ උපයෝගී ලේඛන අනුව ශේෂ අතර රු.5,241,038ක වෙනසක් විය. | 2023 වර්ෂයේ ගිණුම සකස් කිරීමේදී නිවැරදි කරන බව. | වෙනසට හේතු හඳුනාගෙන නිරවුල් කළ යුතු වේ. |

**(ආ) විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂයය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.80,599,514ක් වූ ගිණුම් විෂයයන් 04ක් තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකෙරුණි. | 2023 වර්ෂයේ ගිණුම සකස් කිරීමේදී අදාළ විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කරන බව. | විස්තරාත්මක උපලේඛන සකස් කළ යුතු වේ. |

### 1.5.11.12.2 අනුකූල නොවීම්

**(අ) නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| අනුකූල නොවීම් | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371 (5)ට පටහැනිව 1998 වර්ෂයේදී ලබා දී තිබුණු රු.33,000ක අත්තිකාරමක් පියවා නොතිබුණි. | මුදල ප්‍රතිපූර්ණය කළ නොහැකි බැවින් කපා හැරීමට අනුමැතිය සඳහා පළාත් සභාවට ඉදිරිපත් කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

### 1.5.11.12.3 ආදායම් පරිපාලනය

**(අ) ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (i) 2021 වර්ෂයේදී සංවර්ධිත ලෙස ගැසට් කළ ප්‍රදේශවලින් වරිපනම් බදු අයකිරීමට 2023 මාර්තු වන විටත් කටයුතු කර නොතිබුණි. එමෙන්ම, 1983 වර්ෂයේ සිට ගිවිසුම් රහිතව ලබා දී තිබුණු බිම්බදු ඒකක 30ක තක්සේරු ගාස්තු 2010 වර්ෂයෙන් පසුව ප්‍රතිශෝධනය කර නොතිබුණි. | දේපළ තක්සේරු කිරීමට තක්සේරු දෙපාර්තමේන්තු වෙත යොමු කර ඇති බව. | වරිපනම් බදු අයකිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ii) වෙළඳ බලපත්‍ර ගාස්තු, ව්‍යාපාර බදු හා කර්මාන්ත බදු රු.238,680ක් ද, දැන්වීම් පුවරු ගාස්තු රු.135,145ක් ද, ත්‍රී රෝද රථ සාමාජික ගාස්තු රු.111,000ක් ද, අයකර නොතිබුණි. | ඉන්ධන හා සෞඛ්‍ය අර්බුදය හේතුවෙන් මෙබදු හිඟයක් පවතින බව හා හිඟ දැන්වීම් පුවරු ගාස්තු අයකර ගැනීමට කටයුතු කරන බව. | ආදායම් අප්‍රමාදව අයකරගත යුතු වේ. |

**1.5.11.12.4 මෙහෙයුම් සමාලෝචනය**

**(අ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (i) කොම්පෝස්ට් අංගනයක් ඉදිකිරීම හා ඊට අවශ්‍ය යන්ත්‍ර මිල දී ගැනීම වෙනුවෙන් 2020 හා 2021 වර්ෂවල දී රු.7,612,713ක් වියදම් දරා තිබුණි. එමෙන්ම, 2022 ජූලි මස පළාත් සභාවෙන් රු.950,000ක් වටිනාකමැති බේලර් යන්ත්‍රයක් ද ලැබී තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කොම්පෝස්ට් ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර නොතිබුණි. | විදුලි සම්බන්ධතාවය ලද පසුව ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු සිදු කිරීමට නියමිත බව. | විධිමත් කසළ කළමනාකරණ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු වේ. |

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (ii) | සභා බල ප්‍රදේශය තුළ සමාලෝචිත වර්ෂයේදී අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 840ක් පමණ බැහැර කිරීමට සේවකයින් 06 දෙනෙකු හා වාහන 02ක් වෙනුවෙන් රු.3,145,472ක් වැයකර තිබුණ ද, එම අපද්‍රව්‍ය පරිසර හිතකාමීව බැහැරකර නොතිබුණි. | කොම්පෝස්ට් අංගනයේ මූලික අවශ්‍යතා සපුරා ගනිමින් එහි කටයුතු විධිමත් කිරීමට කටයුතු කරන බව. | කසළ කළමනාකරණ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු වේ. |

**(ආ) වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | -------------------------- | ------------ |
| (i) | සභාව සතු සුසාන භූමි 49කින් 32ක අයිතිය නිරවුල් කර ගෙන නොතිබුණි. | එම ඉඩම් පවරා ගැනීමේ කටයුතු සිදු කරන බව. | අයිතිය පවරා ගැනීමට කටයුතු කළයුතු වේ. |
| (ii) | ටිපර් රථයක අලුත්වැඩියා කිරීමට 2020 වර්ෂයේ භාර දී 2021 වර්ෂයේදී අත්තිකාරම් ලෙස රු.437,475ක් ගෙවා තිබුණ ද, 2022 දෙසැම්බර් දක්වාම අලුත්වැඩියාව නිමකර නොතිබුණි. | 2022 නොවැම්බර් 01 දින වාහනය අලුත්වැඩියා කිරීම පිළිබඳව සොයා බැලීමක් සිදු කළ බව. | අලුත්වැඩියා කටයුතු කඩිනම් කළයුතු වේ. |

**(ඇ) ප්‍රසම්පාදනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ----------------------- | -------------------------- | ----------- |
| හලර් යන්ත්‍රයක් මිල දී ගැනීමට ආයතන 02කින් මිල ගණන් ලැබී තිබුණ ද, එක් ආයතනයකින් පමණක් මිළ ගණන් ලද බවට සාවද්‍ය ලෙස කරුණු දක්වා තිබුණි. මේ නිසා ඇගැයීමකට ලක්නොවූ ආයතනය විසින් ඉදිරිපත් කළ අවම මිල නොපිළිගැනීම නිසා සභාවට රු.644,400ක් මූල්‍යමය හානියක් සිදු වී තිබුණි. | අවම මිල ඉදිරිපත් කළ ආයතනයේ යන්ත්‍රය පිරිවිතර වලට අනුකූල නොවීම නිසා අනෙක් ආයතනයෙන් යන්ත්‍රය මිලදී ගත් බව. | පිළිතුරු සාවද්‍ය වේ. අලාභය වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගත යුතුවේ. |

## 1.5.11.13 ගොඩකවෙල ප්‍රාදේශීය සභාව

### 1.5.11.13.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| (i) එකතුව රු.5,151,365ක් වූ වැඩ නිම කළ ව්‍යාපෘති 02ක් හා ගොඩනැගිලි 03ක් ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේදී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ii) ඉදිකළ ගොඩනැගිලි 02ක වටිනාකම රු.1,100,467ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | - එම - | - එම - |
| (iii) ගිණුම් විෂයයන් 02ක සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ සහ උපයෝගී ලේඛන අනුව ශේෂ අතර රු.886,362ක වෙනසක් විය. | අදහස් දක්වා නොතිබුණි. | වෙනසට හේතු හඳුනාගෙන නිරවුල් කළ යුතු වේ. |

**1.5.11.13.2 අනුකූල නොවීම්**

**(අ) නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) I. මුදල් රෙගුලාසි 371 (5) ට පටහැනිව, 2012 – 2022 වර්ෂ අතර කාලය තුළ ලබා දුන් රු.1,468,165ක අත්තිකාරම් පියවා නොතිබුණි. | I. නොපියවූ අත්තිකාරම් පියවීමට කටයුතු කෙරේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| II. 2007 වර්ෂයත් 2020 වර්ෂයත් අතර කාලයට අදාළ එකතුව රු.734,050ක් වූ කල් ඉකුත් වූ විවිධ තැන්පතු මුදල් රෙගුලාසි 571 (2) පරිදි නිරවුල් කර නොතිබුණි. | II. ගිවිසුම් ඇප තැන්පත් නිරවුල් කළ වහාම කල්ඉකුත් වූ විවිධ තැන්පත් නිරවුල් කරනු ලබයි. | |

| | | | |
|---|---|---|---|
| (ii) | ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 09ක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | 21 වන අතුරු ව්‍යවස්ථාවේ උපලේඛන වාර්ෂිකව ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කරන බව. | පනත අනුව කටයුතු කළ යුතු වේ. |

**1.5.11.13.3 ආදායම් පරිපාලනය**

**(අ) ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------------------- | -------------------------- | ------------ |
| (i) | වසර 05ට වඩා පැරැණි රු.1,210,025ක හිඟහිටි වරිපනම් ශේෂයක් ද, වසර 03ට වඩා පැරැණි රු.152,966ක හිඟහිටි අක්කර බදු ශේෂයක් ද 2022 දෙසැම්බර් 31 දිනට පැවැතිණි. | රතු නිවේදන නිකුත් කළ බව හා ආර්ථික අර්බුදය නිසා දේපළ තහනම් කිරීම අපහසු බව සහ ගොවිජන සභාවට අනුව ඉඩම් පිළිබඳ තොරතුරු නොමැති නිසා අක්කර බදු දේපළ සමීක්ෂණය කළ නොහැකි විය. | හිඟ ආදායම් රැස් කළ යුතු වේ. |
| (ii) | 2022 වර්ෂයේදී ආයතන 09ක් පරිසර බලපත්‍ර අළුත්කර නොතිබීමත්, දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 08කින් ව්‍යාපාර බදු අයකර නොතිබීමත් නිසා රු.68,550ක ආදායමක් අහිමි වී තිබුණි. | පරිසර බලපත්‍ර 04ක් අලුත් කිරීමට යොමුකර ඇති අතර බලපත්‍ර 05ක් අලුත් කිරීමට දන්වා ඇති බව සහ කුළුණු සඳහා බදු ගෙවා නොතිබුණි. | ආදායම් නොපමාව අයකරගත යුතු වේ. |

**1.5.11.13.4 මෙහෙයුම් සමාලෝචනය**

**(අ) මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ------------------------ | ------------ |
| (i) | රු.5,654,649ක් පිරිවැය වූ මාදම්පේ මාළු වෙළඳපොළ නැවත සකස් කිරීමට රු.2,771,927ක් වැයකර තිබුණි. එහෙත්, ඉදි කිරීම් දුර්වලතා දක්වමින් | එම වෙළඳුන්ට එරෙහිව නඩු ගොනු කර ඇත. අනවසර ලැලි ඉවත් කරන බව වෙළඳුන්ට දන්වා | වෙළඳසැල් ඉදිකිරීමේදී මනා අධ්‍යානයකින් හා සැලසුම් සහගතව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වෙළඳුන්ගෙන් කොටසක් වෙළඳපොළ ඉදිරිපිට මාළු අලෙවි කරමින් සිටී. | ඇත. | |
| (ii) | පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ පරිදි, මාදම්පේ මාළු කඩ සඳහා රු.774,000ක් වූ මාස 03ක ඇප තැන්පතු අයකර නොතිබුණි. කාමර 08ක් ගිවිසුම් රහිතව බදු දී තිබුණි. එමෙන්ම, කාමර 31කින් මාස 02-08ත් අතර කාලයක් හිඟහිටිව පවතින රු.2,358,800ක් අයකර නොතිබුණි. | ගිවිසුම් රහිතව පැවරීම් කළ නිසා මාස 03ක ඇප ලබා ගෙන නොතිබුණි. ඉදි කිරීම්වල අඩුපාඩු සකස් කරන තෙක් ගෙවීම් නොකිරීමට එම වෙළඳුන් තීරණයකර ඇති බැවින් හිඟ මුදල් අය කිරීම ද ගැටලු සහගත වී ඇති බව. | අදාළ චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතු අතර හිඟ ආදායම් අය කළ යුතු වේ. |
| (iii) | 2019 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා හඳුනාගත් අනවසර ඉදිකිරීම් 25ක් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 47 වගන්තිය ප්‍රකාරව ඉවත් කර නොතිබුණි. | මේ වනවිට කාර්මික නිලධාරින් විසින් අනවසර ඉදිකිරීම් පිළිබඳ පසු විපරම් සිදු කරන බව. | ප්‍රාදේශීය සභා පනතේ 47 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (iv) | ජල ව්‍යාපෘති සඳහා 2016 වර්ෂයේදී රු.742,500කට ජල මීටර් 270ක් මිල දී ගෙන තිබුණි. ඉන් මීටර් 177ක් අභාවිතව පැවති අතර, නිවාස 185ක් සඳහා මේ දක්වාම ජල මීටර් සවිකර නොතිබුණි. එමෙන්ම, නිවාස ඒකක 12කින් ජල ගාස්තු ලෙස අයවිය යුතු රු.18,128ක් වර්ෂ 03කට වඩා පැරණි විය. | රජයේ නිල නිවාසවල හිඟ මුදල් පිළිබඳ කටයුතු කරන බව හා අනෙකුත් මුදල් ජංගම සේවා මගින් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | අභාවිතව පවතින ජල මීටර් , මීටර් සවිකර නැති නිවාසවල සවි කිරීමටත් හිඟ ආදායම් අයකර ගැනීමටත් කටයුතු කළ යුතු වේ. |
| (v) | ඝන අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 1800ක් පමණ බැහැර කිරීමට සේවකයින් 18 දෙනෙකු හා වාහන 04ක් වෙනුවෙන් රු.17,365,539ක් වැයකළ ද, ඒවා පරිසර හිතකාමීව බැහැර කර නොතිබුණි. එමෙන්ම, නොදිරන කසළ වෙනුවෙන් ඉදිකළ රු.2,718,707ක ගොඩනැගිල්ල හා රු.950,000ක් වූ බෙලර් යන්ත්‍රය (Hydraulic Vertical Baler) 2022 | නිසි ස්ථානයක් නොමැති නිසා කසළ සෘජුවම අංගනය වෙත මුදා හැරේ. ඉදිරියේදී කසළවලින් කොම්පෝස්ට් නිපදවීමටත්, නොදිරන කසළ අලෙවිය හෝ විනාශ කිරීමටත්, විදුලි සැපයුම ලද විට බෙලර් යන්ත්‍රය භාවිතා කිරීමටත් අපේක්ෂිතය. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්මක් සකස්කර ක්‍රියාත්මක කිරීම හා වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | දෙසැම්බර් 31 දින දක්වාම අභාවිතව පැවතුණි. | | |
| (vi) | නිශ්චල දේපළ වසර 05කට වරක් තක්සේරු කළයුතු වුවද, 2013 වර්ෂයේ වරිපනම් තක්සේරුව අනුව වරිපනම් අයකරමින් පැවැතිණි. | තක්සේරු දෙපාර්තමේන්තුවෙන් 2023 වර්ෂයේ දී නව තක්සේරුවක් කිරීමට නියමිතව ඇති බව. | වරිපනම් දේපළ වසර 05කට වරක් තක්සේරු කළ යුතු වේ. |

**(ආ) කොන්ත්‍රාත් පරිපාලනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | බලවින්න කොම්පෝස්ට් අංගනයේ ඉදි කිරීම් අත්හැර දැමීම නිසා ඒ සඳහා ගෙවූ රු.1,223,807ක් අනාර්ථික වියදමක් වී තිබුණි. | එම වැඩ නිමකළ නොහැකි වුවද, කසළ ගැටළුව විසඳීමට මුදල් ලබා දීමට පළාත් ප්‍රධාන අමාත්‍යාංශය එකඟ වී ඇති බව. | ව්‍යාපෘතියේ ඉතිරි වැඩ කඩිනමින් නිම කළ යුතු වේ. |
| (ii) | ඇල්පිටිය පන්සල පාර හා නාඹුලුව යා කරන මාර්ගය වෙනුවෙන් මිල දී ගත් කැටගල් 876ක් මාර්ගයේ අතුරා නොතිබීමෙන් ඊට ගෙවූ රු.56,940ක් නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. | අතුරා නොතිබුණු එම ගල් ප්‍රමාණය සභාවට ලබා ගැනීමට කටයුතු සලසා ඇති බව . | එම කැටගල් ගෙන මාර්ගයේ ඉදිකිරීම් නිම කළ යුතුය. |
| (iii) | ගොඩකවෙල සතිපොළ භූමියේ ඉදි කිරීම්වල දී රු.391,492ක් වැඩිපුර ගෙවා තිබුණු අතර වැසිකිළි පද්ධතිය ඉදිකිරීමේදී සාවද්‍ය තොරතුරු දක්වා වැඩි ලංසුවකට ප්‍රසම්පාදනය පිරිනැමීමෙන් රු.73,686ක පාඩුවක් සිදු වී තිබුණි. | මෙය වැඩිපුර ගෙවීමක් නම්, කොන්ත්‍රාත්කරුගේ රැඳවුම් මුදලින් අයකරන බව සහ අඩුම මිළ ලබාදුන් ආයතනය ඉදිරිපත් කළ සටහන් පොත (Contractors Record Book) යාවත්කාලින කර නොමැති බැවින් පළාත් පාලන කොමසාරිස් කාර්යාලයේ නිලධාරින් විසින් සියලු ලේඛන සම්පූර්ණ කළ ආයතනය තෝරා ගෙන තිබුණ බව. | වැඩිපුර ගෙවීම් ආපසු අයකරගත යුතු වේ. කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (iv) | ගොඩකවෙල ළමා උද්‍යානය ඉදිකිරීමේදී රු.39,913ක් වැඩිපුර ගෙවා තිබුණි. නිසි නඩත්තුවක් නොවීමෙන් රු.94,230ක් වැයකර 2022 මැයි මාසයේ අතුරා තිබුණු තණ පිඩලිවලින් සියයට 80ක් පමණ 2023 පෙබරවාරි වන විට විනාශ වී තිබුණි. | රු.39,313ක් රඳවුම් මුදල් ගෙවීමේදී අඩු කරන බව. ළමුන් විශාල පිරිසක් ළමා උද්‍යානයට පැමිණීම නිසා තණ පිඩලි විනාශ වී ඇති බව. | වැඩිපුර ගෙවීම් ආපසු අයකරගත යුතු අතර උද්‍යානය මනාව නඩත්තු කළ යුතු වේ. |
| (v) | ගොඩකවෙල ආදාහනාගාරයේ කොන්ක්‍රීට් කුලුනු සහ තලාද පමණක් සකසා තිබියදී අන්‍යෝන්‍ය එකඟතාව මත 2022 වර්ෂයේදී කර්මාන්තය අවසන් කර තිබුණි. ඒ වනවිට කළ වැඩ සඳහා රු.1,000,000ක් ගෙවා තිබුණු අතර රු.1,040,460ක් ගෙවීමට ද නිර්දේශ කර තිබුණි. එමෙන්ම, දෙවන බිල්පතෙහි මිල විචලන (Price Adjustment) සඳහා ද රු.385,752ක වැඩිපුර ගෙවීම් නිර්දේශ කර තිබුණි. | ගිවිසුම අවසන් කළේ පැරණි මිළට වැඩ නිම කිරීමට නොහැකි බව කොන්ත්‍රාත්කරු පැවසීම නිසා බව හා වැඩිපුර ගෙවීමක් සිදුවී නම් ඒවා රඳවුම්වලින් අඩු කරන බව . | වැඩිපුර ගෙවීම් අය කරගත යුතු අතර, පවතින නීති රීතිවලට අනුව වැය කළ මුදල් ඵලදායී ලෙස උපයෝජනය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. |
| (vi) | නොදිරන කසළ රැස්කිරීමේ මධ්‍යස්ථානය ඉදි කිරීමේදී පිරිවිතරවලට අනුකූල නොවූ වැඩ සඳහා රු.92,752ක් ගෙවා තිබුණි. | මින් ඉදිරියට මෙවැනි වැරදි සිදු නොවීමට කටයුතු කරන බව. | වැඩිපුර ගෙවීම් ආපසු අයකරගත යුතු වේ. |

**1.5.11.14 නිවිතිගල ප්‍රාදේශීය සභාව**

**1.5.11.14.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ------------------------- | ------------- |
| (i) | ස්ථාවර තැන්පත් පොළී රු.71,342ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ii) | දොළොස්වල කොම්පෝස්ට් අංගනයේ රු.467,580ක් වූ විදුලි සැපයුම් පිරිවැය ප්‍රාග්ධනිත කර නොතිබුණි. | - එම - | - එම - |
| (iii) | ස්ථාවර වත්කම් පරිත්‍යාග රු.1,036,938ක් මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනයට ඇතුළත් කර නොතිබුණි. | - එම - | - එම - |
| (iv) | සමාලෝචිත වර්ෂයේ කඩකාමර කුලී බිල්කිරීම් රු.1,008,000ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම - | - එම - |
| (v) | සමාලෝචිත වර්ෂය අවසානයට මෝටර් රථ හා කරත්ත ගිණුමේ ශේෂය රු.18,448,710ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි. | - එම - | - එම - |
| (vi) | 2021 වර්ෂයේ ලද නඩු තීන්දුවක් නිසා වසර 25ක් වැඩ තහනම් කළ සේවකයෙකු වෙත ගෙවිය යුතු හිඟ වැටුප් හා දීමනා ගිණුම්ගත කර නොතිබුණි. | - එම - | - එම - |

**(ආ) විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂයය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.56,737,900ක් වූ ගිණුම් විෂයයන් 02ක විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකෙරුණි. | උපලේඛන ඉදිරියේදී ඉදිරිපත් කරන බව. | ප්‍රමාණවත් හා යෝග්‍ය සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. |

**1.5.11.14.2 අනුකූල නොවීම්**

**(අ) නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|

| | | |
|---|---|---|
| ----------------------- | -------------------------- | ------------ |
| 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළ එකතුව රු.321,938ක් වූ කල් ඉකුත් වූ විවිධ තැන්පතු, මුදල් රෙගුලාසි 571 (2) ප්‍රකාරව නිරවුල් කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**1.5.11.14.3 ආදායම් පරිපාලනය**

**(අ) ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | -------------------------- | ------------ |
| (i) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.1,092,853ක් වූ හිඟ වරිපනම් ශේෂය තුළ වසර 05කට වඩා පැරණි රු.469,203ක ශේෂ පැවතිණි. | පැවති ආර්ථික අර්බුද හමුවේ මුල් කාර්තුවේ දී දේපළ තහනම් සිදු නොකළ ද අවසන් කාර්තුවේ දී රු.112,102 ක ආදායමක් දේපළ තහනම් කිරීම මගින් අයකර ඇති බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.115,815ක් වූ හිඟ අක්කර බදු ශේෂය තුළ වසර 03කට වඩා පැරණි රු.70,495ක ශේෂ පැවැතිණි. | කඩිනමින් අක්කර බදු සත්‍යයේක්ෂණයක් සිදුකොට අක්කර බදු අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අයකළ යුතුවේ. |
| (iii) | පරිසර බලපත්‍ර ලබාගත යුතු ආයතන හඳුනාගැනීමට සමාලෝචිත වර්ෂය තුළ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | 2023 වර්ෂයේ දී පරිසර බලපත්‍ර ලබා දිය යුතු ව්‍යාපාරික ස්ථාන හඳුනා ගැනීම සඳහා සමීක්ෂණය සිදුකොට ඇති බව. | වාර්ෂිකව සමීක්ෂණයක් සිදු කර හිඟ ආදායම් අයකර ගත යුතුවේ. |
| (iv) | ගාස්තු නොගෙවන දුරකථන සම්ප්‍රේෂණ කුළුණු හඳුනාගෙන ව්‍යාපාර බදු අය කිරීමට කටයුතු කර නොතිබුණි. | 2023 වසරේදී දුරකතන කුළුණු හිමි ආයතන නිශ්චිතව හඳුනාගෙන ගාස්තු අයකර ගැනීමට කටයුතු කරන බව. | සභාවට ලැබිය යුතු ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතු වේ.. |

**1.5.11.14.4 මෙහෙයුම් සමාලෝචනය**

**(අ) මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොම්පෝස්ට් අංගනයක් වෙනුවෙන් 2019 වර්ෂයේ සිට රු.9,329,705ක් වැයකර තිබුණි. එමෙන්ම, 2022 අගෝස්තු 08 දින පළාත් සභාවෙන් රු.950,000ක් වූ බේලර් යන්ත්‍රයක් ද ලැබී තිබුණි. එහෙත් විදුලිය නොමැතිවීමෙන් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් එම ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර නොතිබුණි. | තෙකලා විදුලිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බවත් මේ වනවිට පොහොර හැලීම සිදුකරන අතර, පොහොර කිලෝග්‍රෑම් 1500 ක් පමණ හලා පැකට් කර ඇති බව හා එම කටයුතු දෛනිකව සිදුකරනු ලබන බව. | ඝන අපද්‍රව්‍ය කළමණාකරණ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු වේ. |

**(ආ) වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සභාවේ ප්‍රධාන කාර්යාල භූමිය හා උපකාර්යාල භූමිය තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | තක්සේරු කර ගිණුම්ගත කළ යුතුවේ. |
| (ii) | නිකුත් කළ කොඩිකණු 96ක් ආපසු භාර දී නොතිබුණි. ඉන් කණු 15ක වටිනාකම අයකර ගෙන තිබුණද, රු.1,032,750ක් වූ කොඩිකණු 81ක වටිනාකම, මහා සභා තීරණය පරිදි වගකිව යුතු අයගෙන් අයකිරීමට පියවර ගෙන නොතිබුණි. එමෙන්ම, භාණ්ඩ 35ක ඌනතාවට වගකිව යුතු අය නිශ්චය කර නොතිබුණි. | කොඩි කණු 51ක් ගෙන්වා ගැනීමට නිවේදන නිකුත් කර ඇත. ඉතිරි කණු 30 ගෙන්වා ගැනීමට හෝ ඊට අලාභය අය කිරීමට හෝ කටයුතු කරන බව හා භාණ්ඩ ඌනතා සඳහා වගකිව යුතු අයගේ 2023 අප්‍රේල් මස වැටුපෙන් අයකිරීමට කටයුතු කර ඇති බව. | මේ සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අයකර ගත යුතු වේ. |

(ඇ) වාහන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ---------------------- | ------------------------- | ------------ |
| සභාව සතු නොවූ වාහන 04ක හිමිකාරීත්වය, පවරා ගැනීමට හෝ ආපසු භාර දීමට හෝ කටයුතු කර නොතිබුණි. | ප්‍රධාන ලේකම්ගේ උපදෙස් අනුව පවරා ගැනීමට අදාළ ලේඛන ඉදිරිපත් කර ඇති බව. | 02/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය පරිදි කටයුතු කළ යුතු වේ. |

(ඇ) අවිධිමත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ---------------------- | ------------------------- | ------------ |
| ගලි යැපුම් දීමනාවක් ලෙස සමාලෝචිත වර්ෂය තුළ දී සභාව වෙත ලද රු.88,600ක් විධිමත් අනුමැතියක් රහිතව කිහිපදෙනෙකු වෙත දිරි දීමනා ලෙස ගෙවා තිබුණි. | ප්‍රාදේශිය සභා පනතේ 9.3 වගන්තිය අනුව ලේකම් විසින් තීරණය කර එම දීමනාව 2017 වර්ෂයේ සිට ලබාගෙන ඇති බව. | දිරි දීමනා ගෙවීම සඳහා ආණ්ඩුකාරවර අනුමැතිය ලබාගත යුතු වේ. |

**1.5.11.15 පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව**

**1.5.11.15.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| | ---------------------- | ----------------------- | ------------- |
| (i) | ලැබියයුතු ආයෝජන පොළී රු.47,742ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ii) | 2021 වර්ෂයේදී ආයෝජන ගිණුමට සිදුකළ වැරදි හර සටහනක් නිවැරදි කිරීමට නැවත හර සටහනක් තැබීම | - එම - | - එම - |

| | | | |
|---|---|---|---|
| | නිසා ආයෝජන ගිණුම රු.81,134ක් වැඩියෙන් දැක්වුණි. | | |
| (iii) | උසාවි දඩ හා මුද්දර ගාස්තු මුදල් පදනම මත ගිණුම් තැබීම, ගිණුම් ප්‍රතිපත්තිවල දක්වා නොතිබුණි. එහෙත්, 2022 වර්ෂය අවසානයට උසාවි දඩ හා මුද්දර ගාස්තු ගිණුම්වල රු.12,263,588ක හිඟ ශේෂ පැවැතිණි. | - එම - | - එම - |
| (iv) | ප්‍රාග්ධන වියදම් රු.205,880ක් මෙහෙයුම් වියදම් ලෙස ගිණුම්ගත කර තිබීම නිසා මෙහෙයුම් වියදම් වැඩි වී ප්‍රාග්ධන වියදම් අඩු වී තිබුණි. | - එම - | - එම - |
| (v) | හිඟහිටි රු.67,557ක සේවක අර්ථසාධක අරමුදල් ගිණුම්ගත කර නොතිබුණි. | සමුච්චිත අරමුදලින් ගෙවීම නීත්‍යානුකූල වන බව. | - එම - |
| (vi) | දෝෂ සහගතව ද්විත්ව සටහන් තැබීම නිසා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම හා යන්ත්‍රෝපකරණ ගිණුම රු.941,931ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි කර ගැනීමට සටහන් කර ගත් බව. | - එම - |
| (vii) | සමුච්චිත අරමුදලට බැර කළ රු.1,316,634කට හා හර කළ රු.362,131කට අදාළ ප්‍රතිවිරුද්ධ සටහන් ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී මෙවන් අවස්ථා ඇති නොවන ලෙස කටයුතු කරන බව. | - එම - |
| (viii) | ගිණුම් විෂයයන් 04කට අදාළව 2022 වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ සහ උපයෝගී ලේඛන අනුව ශේෂ අතර රු.16,807,276ක | මෙම වෙනස් වීම් කාලයක් තිස්සේ පැවත එන ඒවා බව හා ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වෙනසට හේතු හඳුනාගෙන නිරවුල් කළ යුතු වේ. |

වෙනසක් විය.

**1.5.11.15.2 මූල්‍ය සමාලෝචනය**

**(අ) බැංකු සැසඳුම් පිළියෙල කිරීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 හා 2004 වර්ෂවල දී බැංකුගත කළ රු.29,963ක් බැංකු ගිණුමට බැර වී නොතිබුණද, ඊට සම්බන්ධ නිලධාරීන්ට එරෙහිව කටයුතු කර නොතිබුණි. එමෙන්ම, බැංකුවට බැර වී තිබුණු රු.653,192ක් සහ 1999 - 2009 වර්ෂ අතර බැංකුවට හර වී තිබුණු රු.109,561ක් හඳුනාගෙන නිරවුල් කර නොතිබුණි. | මෙම කාලපරිච්ඡේදයට අදාළ තොරතුරු නොමැතිවීම නිසා ගැටළුව නිරාකරණය කර ගැනීමට නොහැකි වී ඇති බව. | කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. |

**1.5.11.15.3 ආදායම් පරිපාලනය**

**(අ) ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වසර 03කට වඩා පැරණි රු.141,879ක හිඟහිටි වරිපනම් ශේෂයක් ද, රු.91,847ක හිඟහිටි අක්කර බදු ශේෂයක් ද 2022 දෙසැම්බර් 31 දිනට පැවැතිණි. එමෙන්ම, ආයතන 06ක් විසින් පරිසර බලපත්‍ර ලබා නොගැනීම නිසා සමාලෝචිත වර්ෂය තුළ දී රු.47,700ක ආදායමක් අහිමි වී තිබුණි. | වරිපනම් බදු නොගෙවන අයගේ දේපළ තහනම් කරන බව හා අක්කර බදු අය කිරීමට උත්සාහ කරන බව. දැනුවත් කිරීම් සිදු කළ ද බලපත්‍ර ලබා ගැනීමට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොමැති බව. | හිඟ ආදායම් රැස් කළ යුතු වේ. |

**1.5.11.15.4 මෙහෙයුම් සමාලෝචනය**

**(අ) මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| | ---------------------- | -------------------------- | ------------ |
| (i) | 2020 - 2022 වර්ෂ අතර කාලය තුළ කුලී පදනම මත වූ සේවකයන් 06 දෙනෙකු වෙනුවෙන් අර්ථසාධක අරමුදලට දායක ගෙවා නොතිබුණි. | හිග මුදල් අය කර යැවීමට කටයුතු කරන බව. | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත අනුව කටයුතු කළ යුතුය. |
| (ii) | සන අපද්‍රව්‍ය සැකසීම වෙනුවෙන් 2022 අගෝස්තු මාසයේ දී ලද බේලර් යන්ත්‍රයක්, තෙකලා විදුලි සැපයුම නොමැති වීම හේතුවෙන් ලද දින සිට අභාවිතව පවතී. | ප්‍රතිපාදන සලසා ගෙන යන්ත්‍රය උපයෝජනය කිරීමට අවශ්‍ය පහසුකම් සලසා ගන්නා බව. | යන්ත්‍රය උපයෝජනය කළ යුතු වේ. |
| (iii) | 2018 පළාත් පාලන මැතිවරණයෙන් තේරී පත් වූ සභිකයින් 32 දෙනෙකුගෙන් 2022 නොවැම්බර් වනවිටත් වත්කම් බැරකම් ප්‍රකාශ ලබාගෙන නොතිබුණි. | වත්කම් බැරකම් ප්‍රකාශ ලබා දෙන ලෙසට සියලු සභිකයින් දැනුවත් කළ බව. | වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත අනුව කටයුතු කළ යුතු වේ. |
| (iv) | නිලධාරීන් 19 දෙනෙකුගේ අයවිය යුතු වසර 10කට වඩා පැරණි රු.151,255ක ණය ශේෂයක් පැවතිණි. | ඇපකරුවන්ගෙන් ශේෂ 04ක් අය කෙරේ. රු.140,632ක් කපා හැරීමට ආණ්ඩුකාරවර අනුමැතියට යොමු කර ඇත. | හිග ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

**(ආ) වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| -------------------- | ---------------------- | ------------- |
| විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය රහිතව පැල්මඩුල්ල සතිපොල අසලින් ඉඩමක් ලබාගත් බදුකරුවෙකු විසින් 2006 වර්ෂයේ සිට බිම්බදු නොගෙවීම, ගිවිසුමට පටහැනිව එය අතුරු බදුදීම, | මේ වන විට ඉවත්වන ලෙසට නිවේදනයක් නිකුත් කර ඇති බව. | ගිවිසුම් කොන්දේසි කඩකිරීමට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

| | | |
|---|---|---|
| ලබා දුන් භූමියට වඩා වැඩි කොටසක් භුක්ති විඳීම, අනුමත සැළැසුමට පටහැනිව විශාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම සිදුකර තිබුණ ද, ඒ කිසිවකට එරෙහිව සභාව විසින් කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | | |

(ඇ) වාහන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අයිතිය සභාව සතු නොවූ වාහන 05ක අයිතිය, පවරා ගැනීමට හෝ ආපසු භාර දීමට හෝ පියවර ගෙන නොතිබුණි. | පළාත් පාලන ආයතන වෙත ලබා දුන් වාහනවල අයිතිය පවරා දීමේ වැඩසටහනක් ඉදිරියේදී ක්‍රියාත්මක කරන බව. | අංක 02/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**1.5.11.16 බලංගොඩ ප්‍රාදේශීය සභාව**

**1.5.11.16.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ස්ථාවර වත්කම් වැඩිදියුණු කිරීම සඳහා වැය කරන ලද රු.10,018,820ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වටිනාකම නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ii) | පරිත්‍යාග වශයෙන් ලද ස්ථාවර වත්කම් රු.8,012,045ක් මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය මඟින් ගලපා නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වටිනාකම නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (iii) | සභාව සතු බැකෝ යන්ත්‍රය ජනදිරිය වැඩසටහන හා වෙනත් සුභසාධන කටයුතු සඳහා ලබාදීමට අදාළව | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මෙය නිවැරදි කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | රු.3,612,605ක උපකල්පිත කුළී ආදායමක් හා වියදමක් ගිණුම්ගත කර තිබුණි. | | |
| (iv) | හිඟහිටි ආදායම් රු.770,685ක් වැඩියෙන් දක්වා තිබුණි. | අතපසුවීමකි. ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මෙය නිවැරදි කළ යුතු වේ. |

**1.5.11.16.2 ආදායම් පරිපාලනය**

**(අ) ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | --------------------------- | ------------ |
| (i) | වසර 03කට වඩා පැරණි රු.49,814ක හිඟහිටි අක්කර බදු ශේෂයක් ද, වසර 01ත් වසර 17ත් අතර කාලයක් පැරණි රු.21,300ක බිම් බදු ශේෂයක් ද, 2022 දෙසැම්බර් 31 දිනට පැවැතිණි. එමෙන්ම, යකහළු මූකලාන ඉඩමේ බිම්බදු පදනම මත ලබා දී තිබුණු බිම් කොටස් 19ක් සඳහා තක්සේරු වාර්තා නොතිබුණි. | මේ වන විට අක්කර බදු අයකර ගැනීම සඳහා සතොයක්ෂණයක් සිදු කරමින් පවතින බවත් යකහළු මූකලාන බිම් කොටස්වලට අදාල හිඟ මුදල ඉදිරියේ දී අයකරගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ii) | වෙළිඔය ආර්ථික මධ්‍යස්ථානයේ කඩකාමර 02කින් හා දූවිලි ඇල්ල සංචාරක මධ්‍යස්ථානයේ කඩකාමරයකින් හිඟහිටි රු.64,756ක් ගිවිසුම් ඇප මුදලින් හෝ අයකර නොතිබුණි. | හිඟ කුලිය ඉදිරියේ දී අයකරගැනීමට කටයුතු කරන බව | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (iii) | 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා හිඟහිටි දුරකථන සම්ප්‍රේෂණ කුළුණු ගාස්තු රු.27,000ක් හා 2021 හා 2022 වර්ෂ සඳහා අයවිය යුතු දැන්වීම් පුවරු ගාස්තු රු.169,260ක් අයකර | හිඟ මුදල් ගෙවන ලෙස දන්වා අදාළ ආයතන වෙත ලිපි යොමු කර ඇති බව හා 2023 වසරේ දී සමීක්ෂණයක් සිදු කිරීමට | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | නොතිබුණි. එමෙන්ම, ප්‍රදර්ශිත දැන්වීම් පුවරු හඳුනාගැනීමට සමාලෝචිත වර්ෂය තුළ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | කටයුතු කරන බව. | |

**1.5.11.16.3 මෙහෙයුම් සමාලෝචනය**

**(අ) මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | පොල්වතුගොඩ, මහවලතැන්න ඉඩමේ සමෝච්ඡ රේඛා සිතියම හා භූමි යෝග්‍යතා සහතිකය ලබා ගැනීමට 2021 හා 2022 වර්ෂවල දී රු.183,124ක් ගෙවා තිබුණ ද, 2023 ජනවාරි දක්වාම එම කාර්යයන් ඉටු වී නොතිබුණි. මේ නිසා ඉඩම පවරාගත නොහැකි වීමෙන් රාස්සගල කුඩා නගර සංවර්ධන සැලැසුම ක්‍රියාත්මක කළ නොහැකි වී තිබුණි. | මෙම ඉඩම සභාවට අත්පත් කරගැනීම සඳහා අදාළ ආයතන වෙතින් නිර්දේශ ලබා ගැනීමට ලිපි යොමු කර ඇත. | අදාළ ඉඩම පවරාගෙන නගර සංවර්ධන සැලැස්ම කඩිනමින් ක්‍රියාවට නැංවිය යුතුවේ. |
| (ii) | වෙළිඔය නගරයේ 2015 වර්ෂයේ දී ඉදිකළ රු.27,253,473ක් වූ දෙමහල් ගොඩනැගිල්ල 2022 වර්ෂය අවසන් වනවිටත් අභාවිතව පැවැතිණි. | ගොඩනැගිල්ල සංවර්ධනය සඳහා ණය මුදලක් ලබා ගැනිමට ගිවිසුම් අත්සන් කර දේශීය ණය සහ සංවර්ධන අරමුදල වෙත යවා ඇති බව. | වත්කම් ඵලදායීව උපයෝජනය කළ යුතුවේ. |
| (iii) | අනවසර ඉදිකිරීම් හඳුනාගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් නොතිබුණි. 2021 සහ 2022 වර්ෂ තුළ හඳුනාගත් අනවසර ඉදිකිරීම් 29ක් නියමානුකූල කර ගන්නා ලෙස දන්වා යවා තිබුණ ද, ඒ පිළිබඳ පසුවිපරම් කර නොතිබුණි. | අනවසර ඉදිකිරීම් ලේඛනගත කර ක්‍රියාමාර්ග ගන්නා බවත්, පසුවිපරම් සිදු කර වාර්තා ලබාගැනීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් සකස් කරමින් පවතින බව. | අනවසර ඉදිකිරීම් නියමානුකූල කිරීමට හෝ ඉවත් කිරීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (iv) | සමිති 58ක් වෙත රු.830,300ක හියුම් පයිප්ප ලබා දී තිබුණ ද, ඒවා අරමුණුගත කාර්යයන් සඳහා යෙදවූයේ ද යන්න පිළිබඳ පසුවිපරම් කර නොතිබුණි. | මේ පිළිබඳව පසුවිපරමක් සිදු කරන බව. | නොපමාව පසුවිපරම් කළ යුතු වේ. |
| (v) | රැස්කළ අපද්‍රව්‍ය පරිසර හිතකාමීව බැහැර කර නොතිබුණු අතර 2022 අගෝස්තු මාසයේ දී පළාත් සභාවෙන් ලද රු.950,000ක් වූ  බෙලර් යන්ත්‍රය තෙකලා විදුලිය නොමැති වීමෙන් ලද දින සිට අභාවිතව පැවතුණි. | බෙලර් යන්ත්‍රය තෙකලා විදුලිය නොමැතිවීම මත භාවිතා කිරීමට නොහැකි වී ඇති බව. | ඝන අපද්‍රව්‍ය කළමණාකරණ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු බව. |

**(ආ) ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවට නීතිඥ සේවා ලබා ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රමවේදයෙන් බැහැරව හා විධිමත් ගිවිසුමකට එළැඹීමකින් ද තොරව මහා සභාවේ අනුමැතිය මත නීතිඥවරයෙකු තෝරා පත්කර ගෙන තිබුණි. | ඉදිරියේ දී ප්‍රසම්පාදන ක්‍රමවේදයට අනුව විධිමත් ගිවිසුමකට එළැඹීමෙන් නීතිඥවරයෙකු තෝරා පත් කර ගන්නා බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතු වේ. |

**(ඇ) කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව තුළ ලී වේදිකාවක් සැකසීම සඳහා සබරගමු පළාතේ ලංසුකරුවන්ට පමණක් සීමාවන | සබරගමුව පළාත තුළ සුදුසුකම්ලත් කොන්ත්‍රාත්කරුවන් සිටීම | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | |
|---|---|
| ලෙස පුවත්පත් දැන්වීම් පළකර තිබීමෙන් සුදුසුකම්ලත් සියලු ලංසුකරුවන්ට ඉදිරිපත් වීමේ අවස්ථාව අහිමි වී තිබුණි. | සහ ඉදිකිරීම් කටයුතුවල පහසුව පිණිස පළාතේ ලංසුකරුවන් වෙනුවෙන් දැන්වීම් පළකළ බව. |

**1.5.11.17 රත්නපුර ප්‍රාදේශීය සභාව**

**1.5.11.17.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | -------------------------- | ------------ |
| (i) | මුද්දර ගාස්තු හා උසාවි දඩ ඌන බිල්කිරීම් රු.22,412,447ක් හා අධි බිල්කිරීම් රු.13,789,042ක් සඳහා ගැලපීම් කර නොතිබීමෙන් සමුච්චිත අරමුදල රු.8,623,405කින් අඩුවෙන් දැක්වුණි. | ඉදිරි වර්ෂයේ නිවැරදි කරන බව. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. |
| (ii) | සමාලෝචිත වර්ෂයට අදාළ උපචිත වියදම් රු.137,008ක් ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ නිවැරදි කරන බව. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. |
| (iii) | සමාලෝචිත වර්ෂයේදී අපහරණය කළ ජංගම නොවන වත්කම්වල පිරිවැය එම වත්කම් ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ නිවැරදි කරන බව. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. |
| (iv) | ගිණුම් විෂයයන් 06ක සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ සහ උපයෝගී ලේඛන අනුව ශේෂ අතර රු.5,542,498ක වෙනසක් විය. | දීර්ඝ කාලීනව පවතින මෙම නොසැසඳීම් හඳුනාගෙන නිවැරදි කරමින් යන බව. | වෙනසට හේතු හඳුනාගෙන නිරවුල් කළ යුතු වේ. |

**(ආ) විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂයය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|

| | | |
|---|---|---|
| -------- | -------------------------- | ------------ |
| එකතුව රු.94,071,961ක් වූ ගිණුම් විෂයයන් 12ක් වෙනුවෙන් විස්තරාත්මක උපලේඛන හා ශේෂ තහවුරුකිරීම් ඉදිරිපත් නොකෙරුණි. | වත්කම් තක්සේරු කර එම ගිණුම් යාවත්කාලින කිරිමට අදාළව උපදෙස් ලබාගෙන ඉදිරි කටයුතු සිදු කරන බව. | විස්තරාත්මක උපලේඛන සකස් කළ යුතු වේ. |

**1.5.11.17.2 ආදායම් පරිපාලනය**

**(අ) ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ------------------------- | ------------ |
| වසර 03කට වඩා පැරණි අක්කර බදු රු.28,374ක් හා වර්ෂ 04කට වඩා පැරණි ත්‍රී රෝද රථ ගාස්තු රු.258,000ක් අයකර නොතිබුණි. | අක්කර බදු හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව හා සක්‍රිය ත්‍රීරෝද රථ සාමාජිකයින් පමණක් සාමාජික ගාස්තු ගෙවා ඇති බව. | හිඟ ආදායම් රැස් කළයුතු වේ. |

**1.5.11.17.3 මෙහෙයුම් සමාලෝචනය**

**(අ) මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------- | ------------------------- | ------------ |
| (i) | කට්ටිකර විකුණන ඉඩම්වල වටිනාකමින් සියයට 01ක බදු මුදලක් විකුණුම්කරුගෙන් සභාවට ලැබෙන පරිදි ගිවිසුම්ගත නොවී ඉඩම් වෙන්දේසි 03ක් සඳහා කට්ටි සැලසුම් අනුමත කර තිබුණි. එමෙන්ම, ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙන් ඉඩම් විකිණීමට අදාළ තොරතුරු ලබාගෙන අයවියයුතු ගාස්තු තීරණය කර නොතිබුණි. | ඉදිරියේදී ගිවිසුම්ගත වීමෙන් එම අඩුපාඩුව මඟහරවා ගන්නා බවත් දැනට විකුණා ඇති ඉඩම් පිළිබඳ තොරතුරු ලබා ගෙන ගාස්තු අය කර ගැනීමට කටයුතු කරන බව. | සභාවට අයවිය යුතු ආදායම් රැස් කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ii) | සභා බල ප්‍රදේශය තුළ වාර්ෂිකව ඝන අපද්‍රව්‍ය ටොන් 09ක් පමණ බැහැර කරනු ලැබුව ද, සභාව සතුව විධිමත් කසළ කළමනාකරණ ක්‍රමවේදයක් නොතිබීම හේතුවෙන් දිරන කසළ එකතු කර රත්නපුර මහා නගර සභාවේ කසළ අංගනයට භාර දී තිබුණි. | එකතු කරන දිරන කසළ දැමීම සඳහා ඉඩමක් හඳුනාගෙන ඉදිරියේදී මෙම ගැටළුව විසඳීමට පියවර ගන්නා බව. | ඝන අපද්‍රව්‍ය කළමණාකරණ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු වේ. |

**(ආ) ආර්ථික නොවූ ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භාණ්ඩාගාර චක්‍රලේඛ මඟින් රාජ්‍ය වියදම් දැඩි ලෙස සීමා කර තිබුණ ද, කොග්ගල නිවාඩු නිකේතනයක නේවාසික පුහුණු වැඩසටහනක් පැවැත්වීමට රු.350,000ක් වැයකර තිබුණි. එම ගෙවීම තුළ 19 දෙනෙකුගේ ආහාර හා නවාතැන් වෙනුවෙන් සාවද්‍ය ලෙස රු.142,500ක් ගෙවා තිබුණි. | අදාල ගෙවීම් සම්බන්ධයෙන් පරීක්ෂා කර සාවද්‍ය ගෙවීම්, වගකිව යුතු පුද්ගලයින්ගෙන් අය කර ගැනීම සඳහා ඉදිරි කටයුතු සිදු කිරීමට පළාත් පාලන කොමසාරිස් වෙතින් උපදෙස් ලබා ගැනීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**(ඇ) හඳුනාගත් පාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 වර්ෂයේදී සභාව විසින් අයුතු ලෙස පෞද්ගලික ඉඩමක් හරහා මාර්ගයක් ඉදිකිරීමට එරෙහිව පවරන ලද නඩුවල තීන්දු ලෙස, පැමිණිලිකාරියට එම ඉඩමේ නිරවුල් භුක්තිය නැවත ලබා දී තිබුණු අතර වන්දි මුදල්, නඩු ගාස්තු හා නීතිඥ ගාස්තු ලෙස රු.479,505ක් 2022 වර්ෂයේ දී ගෙවීමට සභාවට සිදු වී තිබුණි. | නඩු තීන්දුව අනුව ගෙවීමට සිදු වූ මුදල වගකිව යුතු පුද්ගලයින්ගෙන් අය කර ගැනිම සඳහා අවසන් නිවේදන යවා ඇති බවත් ලබා දී ඇති කාල සීමාව තුළ අදාළ මුදල් නොගෙවන්නේ නම් නිතිමය කටයුතු සිදු කිරීමටත් බලාපොරොත්තු වන | වගකිව යුතු පාර්ශව නිශ්චය කර අදාළ මුදල අයකර ගත යුතු වේ. |

බව.

**(ඇ) වාහන පාලනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ධාවනය කළ නොහැකි තත්ත්වයේ පැවති වාහන 08ක හා ට්‍රැක්ටර් ටේලර් 04ක අපහරණ කටයුතු, 2022 දෙසැම්බර් මාසය දක්වාම නිමකර නොතිබුණි. | අපහරණය කළ හැකි බවට හඳුනාගත් වාහන ටෙන්ඩර් කළ ද ඉල්ලීම් ඉදිරිපත් වී නොමැති බැවින් නැවත ටෙන්ඩර් කිරීමට යෝජිත බව. | අංක 05/2020 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතු වේ. |
| (ii) | රු.972,700ක වාහන අලුත්වැඩියා වියදමක් සඳහා සුදුසුකම්ලත් යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකුගේ වාර්තාවක් ලබාගෙන නොතිබුණි. | අලුත්වැඩියාව අදාළ නියෝජිත ආයතනයෙන්ම සිදු කර ඇති බැවින් නැවත යාන්ත්‍රික ඉංජිනේරු වෙත යොමු නොකළ බව. | අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි කටයුතු කළ යුතු වේ. |
| (iii) | ඉන්ධන ඇණවුම් අනුව, අවස්ථා 03කදී වාහනයකට යෙදූ ඉන්ධන ලීටර් 120ක් එහි ටැංකි ධාරිතාව ඉක්මවා තිබුණු බැවින් ඒ සඳහා වැයකළ රු.35,053 ක් සහ ඩීසල් කැබ් රථයක් වෙනුවෙන් රු.12,600ක පෙට්‍රල් ලීටර් 30ක් නිකුත් කර තිබීම සාවද්‍ය ගෙවීම් විය. | සභාපතිගේ නිළ රථය සඳහා සභාපතිවරයා විසින් තෙල් සංචිතයක් පවත්වාගෙන යාමට කටයුතු කර ඇති බව හා පෙට්‍රල් ලීටර 30 සඳහා වැය වූ මුදල අයකර ගැනීමට කටයුතු කරන බව. | සාවද්‍ය ගෙවීම් වලක්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (iv) | සභාපතිවරයා විසින් 2021 සහ 2022 වර්ෂවල දී ප්‍රසම්පාදන ක්‍රමවේදයෙන් බැහැරව කුලී පදනම මත ලබාගත් කැබ් රථයක් සඳහා රු. 87,545 ක් වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවීම් අයකර ගැනිමට කටයුතු කරන බව. | සාවද්‍ය ගෙවීම් වලක්වා ගැනීමට කටයුතු කළ යුතුවේ. |

**1.5.11.18 වැලිගෙපොල ප්‍රාදේශීය සභාව**

**1.5.11.18.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ------------------------- | ----------- |
| (i) | සභාව සතු හෙක්ටයාර් 1.1508ක ඉඩම් 05ක් හා කැබ් රථයක් ද, පිරිවැය රු.3,520,706ක් වූ ගොඩනැගිලි 02ක් ද ගිණුම්ගත කර නොතිබුණි. | තක්සේරු කර ගිණුම්ගත කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ii) | ඕපනායක හෙළ බොජුන් හලේ ඉදිකිරීම් පිරිවැය රු.1,418,022ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කරන බව. | - එම - |
| (iii) | රු.206,668ක අයභාර වියදමක් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේදී නිවැරදි කරන බව. | - එම - |
| (iv) | ලැබිය යුතු දැන්වීම් පුවරු ගාස්තු, යන්ත්‍ර කුලී ආදායම් හා ජල සැපයුම් ගාස්තු රු.609,800ක් ගිණුම්ගත කර නොතිබුණි. | - එම - | - එම - |
| (v) | කර්මාන්ත 02ක් වෙනුවෙන් ණයහිමියෝ සහ ණයගැතියෝ රු.4,020,702 බැගින් වැඩියෙන් දැක්වුණි. | - එම - | - එම - |

**(ආ) නොසැසඳුණු පාලන ගිණුම්**

| විෂයය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| -------- | -------------------------- | ----------- |
| වත්කම් විෂයයන් 02ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය සහ උපයෝගී ලේඛනය අනුව එම ශේෂ අතර රු.4,083,900ක වෙනසක් පැවැතිණි. | අදාළ ප්‍රභව ලේඛන නොමැති බැවින් නව තක්සේරුවක් කර නිවැරදි කරන බව. | වෙනසට හේතු හඳුනාගෙන නිරවුල් කළ යුතු වේ. |

**1.5.11.18.2 අනුකූල නොවීම්**

**(අ) නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

| අනුකූල නොවීම් | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| --------------------- | ------------------------- | ------------ |
| (i) මුදල් රෙගුලාසි 371 (5) පටහැනිව, 1988- 2014 වර්ෂ අතර කාලය තුළ නිකුත් කළ රු.2,407,998ක අත්තිකාරම් පියවා නොතිබුණි. එමෙන්ම, 1996- 2020 වර්ෂ අතර කාලයට අදාළ රු.277,046ක් වූ කල් ඉකුත් වූ විවිධ තැන්පතු මුදල් රෙගුලාසි 571 (2) පරිදි නිරවුල් කර නොතිබුණි. | අත්තිකාරම් ගනුදෙනු පිරික්සීමට පත්කළ කමිටුව විසින් වාර්තාව දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ අතර තැන්පත් මුදල් නිරවුල් කෙරේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ii) ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 12ක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | සම්මත අතුරු ව්‍යවස්ථා සහ පළාත් සභාව විසින් පැනවූ අතුරු ව්‍යවස්ථා වැළඳගෙන ඇත. අවශ්‍ය අතුරු ව්‍යවස්ථා සකස් කරමින් පවතී. | ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**1.5.11.18.3 ආදායම් පරිපාලනය**

**(අ) ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ---------------------- | ------------------------- | ------------- |
| (i) වසර 05ට වඩා පැරණි රු.1,969,517ක් හිඟහිටි වරිපනම් ශේෂයක් ද, වසර 03ට වඩා පැරණි රු.71,034ක හිඟහිටි අක්කර බදු ශේෂයක් ද 2022 දෙසැම්බර් 31 දිනට පැවතිණි. | හිඟ වරිපනම් ගාස්තු අය කෙරේ. 2022 වර්ෂයේ සිට අක්කර බදු සතොයක්ෂණය කරන අතර හිඟ මුදලින් රු.35,174ක් අයකර ඇත. | හිඟ ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ii) ප්‍රදර්ශිත දැන්වීම් පුවරු පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. 2022 වර්ෂය සඳහා රු.700,000ක් වූ | 2023 වර්ෂය සඳහා දැන්වීම් පුවරු සමීක්ෂණයක් සිදුකර | හිඟ ආදායම් නොපමාව අයකළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | බිල්කළ ආදායමින් රු.203,775ක් පමණක් ලැබී තිබුණි. | දැන්වීම් පුවරුවලින් හිඟහිටි ආදායම් අය කරන බව. | |
| (iii) | සියලු දුරකථන සම්ප්‍රේෂණ කුළුණු වලින් ගාස්තු අයකර නොතිබුණි. සභා තීරණයක් ගෙන තිබුණද, අනවසර සම්ප්‍රේෂණ කුළුණකට හා ඔවුන් මාර්ගයට සිදුකළ හානියට එරෙහිව නීතීමය පියවර ගෙන නොතිබුණි. | හිඟ මුදල් සඳහා ආයතන වෙත සිහිකැඳවීම් යවන බව හා මාර්ගය පිළියම් කරන ලෙස එම ආයතනයට දන්වා ඇති බව. | හිඟ ආදායම් අයකළ යුතු අතර සභා තීරණය පරිදි නීතිමය පියවර ගත යුතු වේ. |
| (iv) | 2022 වර්ෂයේ පරිසර බලපත්‍ර ලබාගත යුතු ආයතන 55න් 54ක් ම බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | එම ආයතන නැවත දැනුවත් කරන බව | ජාතික පරිසර පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**1.5.11.18.4. මෙහෙයුම් සමාලෝචනය**

**(අ) මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ------------------------- | ------------ |
| (i) | වරිපනම් දේපළ වසර 05කට වරක් තක්සේරු කළයුතු වුවත්, 2013 වර්ෂයෙන් පසු කිසිදු දේපළක් තක්සේරු කර නොතිබුණි. | බදු දේපළ තක්සේරු කිරීමටට ගරු ආණ්ඩුකාරතුමා අනුමතිය ලබා දී ඇත. | 1946 අංක 30 දරන බදු හා තක්සේරු කරන පනතේ 20 වන වගන්තිය පරිදි කටයුතු කළ යුතු වේ. |
| (ii) | 2021 වර්ෂයේ රු.2,031,180කට මිල දී ගත් ජල මීටර් 349ක් 2023 ජනවාරි වනවිටත් අභාවිතව පැවතුණි. එහෙත්, ජල මීටර් 449ක් අක්‍රිය වීම නිසා ස්ථාවර ගාස්තුව පමණක් අයකරමින් පැවතුණි. 2022 දෙසැම්බර් 31 දිනට ජල ගාස්තු | ජල මීටර් තිබුණ ද, ඊට අවශ්‍ය උපාංග වෙළඳපොළේ අවම වීමත් ඒවායේ මිළ ඉහළ යාමත් නිසා යම් ප්‍රමාදයක් සිදු වී ඇත. හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කරන බව. | ජල මනු සවි කිරීමට හා හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | රු.2,700,036ක් අයවීමට තිබුණු අතර ඒ තුළ වර්ෂයකට වඩා පැරණි රු.921,744ක ශේෂයක් පැවතුණි. | | |
| (iii) | වාර්ෂිකව කසළ මෙට්‍රික් ටොන් 41ක් පමණ බැහැර කිරීමට සේවකයින් 10 දෙනෙකු සහ වාහන හා යන්ත්‍ර උපකරණ 04ක් වෙනුවෙන් රු.5,723,324ක් වැයකළ ද, කසළ විවෘත පරිසරයට බැහැර කිරීමෙන් පාරිසරික ගැටළු මතු වී තිබුණි. එමෙන්ම, කොම්පෝස්ට් අංගනයක ඉදිකිරීම් සඳහා 2021 වර්ෂයේදී රු.2,280,804ක් වැයකර තිබුණද, වැඩ නිමකර නොතිබුණු නිසා කොම්පෝස්ට් නිෂ්පාදන කටයුතු ආරම්භ කළ නොහැකිව තිබුණි. නොදිරන කසළ වෙනුවෙන් 2022 වර්ෂයේ ලද රු.950,000ක් වූ බෙලර් යන්ත්‍රය ද තෙකලා විදුලි සැපයුම නොමැති වීමෙන් අභාවිතව පැවැතිණි. | කොම්පෝස්ට් අංගනයක් ඉදිකර කොම්පෝස්ට් නිෂ්පාදනය ඇරඹීමෙන් පසු සන අපද්‍රව්‍ය හා බැඳුණු පාරිසරික ගැටළු විසඳීමට හැකිවන බව. තෙකලා විදුලිය ලබාගැනීම හා ඉදිකිරීම් සඳහා ඇස්තමේන්තුවක් සභාවේ මුදල් කමිටුවට යොමු කර ඇත. | සන අපද්‍රව්‍ය කළමණාකරණ සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතු වේ. |
| (iv) | සේවකයින් තිදෙනෙකුගෙන් වර්ෂ 09කට වඩා පැරණි රු.78,850ක ණය ශේෂයක් අයකර නොතිබුණි. | ණය ශේෂ 02ක් පියවමින් පවතී. ඉතිරි මුදල් ද අය කරන බව. | හිඟ ණය ශේෂ අයකර ගත යුතු වේ. |

**(ආ) වාහන උපයෝජනය**

------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අබලි වාහන 04ක් අපහරණය කර නොතිබුණු අතර වාහන 05ක හිමිකාරීත්වය, පවරා ගැනීමට හෝ | අපහරණය කළ යුතු වාහන පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර ඇති බව හා වාහන පවරා ගැනීම, පළාත් | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ |

| | | |
|---|---|---|
| ආපසු භාර දීමට හෝ කටයුතු කර නොතිබුණි. | පාලන දෙපාර්තමේන්තුවේ නිර්දේශ අනුව කටයුතු කරන බව. | යුතු වේ. |

**1.5.11.19 කෑගල්ල ප්‍රාදේශීය සභාව**

**1.5.11.19.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2019 වර්ෂය සඳහා හිඟහිටි මුද්දර ගාස්තු රු.297,000 ක් දෙවරක් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කරන බව. | ගිණුම නිවැරදි කළ යුතු වේ. |
| (ii) | රු.1,214,289 ක් වූ වයිබ්‍රේටර් රෝල, ප්ලේට් කම්පැක්ටරය, තාර බොයිලේරුව හා විදුලි ජනක යන්ත්‍රය, යන්ත්‍ර උපකරණ යටතේ ගිණුම්ගත නොකර, මෝටර් රථ හා කරත්ත යටතේ ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කරන බව. | -එම- |
| (iii) | භෞතිකව නොපැවැතුණු, රු.79,900ක් වූ තණකොළ කපන යන්ත්‍රයක් ස්ථාවර වත්කමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | සිදුකරන මූලික විමර්ශනයෙන් පසු ඉදිරි කටයුතු සිදු කරන බව. | -එම- |

**(ආ) නොසැසඳුණු පාලන ගිණුම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන අනුව, විවිධ වත්කම් හා ආදායම් ගිණුම් 19 ක ශේෂ, ඒ ඒ ගිණුම් විෂයන්හි උපයෝගී ලේඛන හා සැසඳීමේදී රු.19,101,869ක | එම වෙනස්කම් සැසඳීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල සංඛ්‍යා, උපයෝගී ලේඛන සමග සැසඳිය හැකිවිය යුතුය. |

වෙනසක් පැවතුණි.

### 1.5.11.19.2 ආදායම් පරිපාලනය

**(අ) ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය**

| නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වරිපනම්, අක්කර බදු හා කඩ කුලී යන ආදායම් විෂයයන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට රු.2,430,216ක් අයවිය යුතුව තිබුණි. එම වටිනාකම තුළ වර්ෂ 01ත් වර්ෂ 05ත් අතර රු.1,427,398ක ශේෂයක් ද, වර්ෂ 05කට වඩා පැරණි රු.706,522ක ශේෂයක් ද පැවැතුණි. | හිඟ අයකර ගැනීමට කටයුතු කරන බව හා අයකර ගත නොහැකි ශේෂ කපාහැරීම සිදු කරන බව. | හිඟ හිටි ආදායම් නොපමාව අයකර ගත යුතු වේ. |

### 1.5.11.19.3 මෙහෙයුම් සමාලෝචනය

**(අ) කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (i) | ඉඩම් ගොඩනැගිලි 06 ක්, අක්කර 1 ½ ක ඉඩමක්, කාර්යාල ගබඩා ද්‍රව්‍ය හා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ 1246 ක් තක්සේරු කර මිල හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී ගිණුම්ගත කරන බව. | වත්කම් නිසි වටිනාකමට ගිණුම්ගත කළ යුතු වේ. |
| (ii) | 2015 වර්ෂයේ දී ලද බැකෝ යන්ත්‍රයට 2016 වර්ෂයේ සිට මේ දක්වා ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | ලියාපදිංචි සහතිකය නිවැරදි කර දෙන ලෙස මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇති බව | වත්කම්වල අයිතිය නිරවුල් විය යුතු වේ. |
| (iii) | කර්මාන්ත ණයගැතියන්ගෙන් රු.33,791,348 ක් අයවිය යුතුව | එකඟ වේ. | ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

පැවති අතර ණයහිමියන් වෙනුවෙන් රු.26,543,620ක් ගෙවීමට තිබුණි.

**(ආ) මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | බල ප්‍රදේශය තුළ ත්‍රීරෝද රථගාල් කිරීමට ස්ථාන 55ක් හඳුනාගෙන තිබුණද, එම ස්ථාන ගාස්තු අයකළ හැකිවන පරිදි සකස්කර නොතිබුණි. මේ නිසා, වාහනවලින් ගාස්තු අය කිරීම වෙනුවට නැවතුම් ගාස්තු ලෙස සභාවට ලැබෙන මුදල වර්ෂයේ ආදායම ලෙස සලකා ගිණුම් ගතකර තිබුණි. | ත්‍රීරෝද රථ නැවතුම්පොළවල අයිතිය මාර්ග සංවර්ධන අධිකාරිය සතුවේ. එම අධිකාරිය සමඟ එකඟතාවකට පැමිණ ස්ථාන සකස් කර දී මුදල් අයකර ගන්නා බව. | ලැබිය යුතු සියලු ආදායම් අය කළයුතු වේ. |
| (ii) | 1975 අංක 01 දරන වත්කම් බැරකම් ප්‍රකාශ කිරීමේ පනත ප්‍රකාර සභිකවරුන් 22 දෙනෙකු විසින් පළමුව ලබාදිය යුතු එම ප්‍රකාශ ලබා දී නොතිබුණු අතර සභිකයින් 27 දෙනෙකු විසින් 2019 වර්ෂයේ සිට 2022 දක්වා එම වාර්ෂික ප්‍රකාශ ඉදිරිපත්කර නොතිබුණි. | ලබාදුන් වත්කම් බැරකම් ප්‍රකාශ පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කර ඇති බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**(ඇ) වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ( i) | 2014 වර්ෂයේදී ලද රු.21,095,000 ක් වූ වාහන 03ක් | වාහන 02ක් පවරා ගැනීමට කටයුතු කළ ද, බැකෝ | සභාව සතු අයිතිය නිරවුල් |

| | | | |
|---|---|---|---|
| | සභාවට පවරාගෙන නොතිබුණි. | යන්ත්‍රයේ වැසි අංකයේ වූ වෙනසක් නිසා පවරා ගැනීම ප්‍රමාද වී ඇති බව. | විය යුතු වේ. |
| (ii) | සභාව සතු රු.971,877ක් වූ වාහන 2ක් වසර 10ත් 12ත් අතර කාලයක සිට අක්‍රියව පවතී. | අනුමැතිය ලද පසු ඉන් එක් වාහනයක් අපහරණය කරන බව. | වත්කම් අභාවිතව නොතැබිය යුතු වේ. |
| (iii) | දිවාසුරැකුම් මධ්‍යස්ථානයක් ඉදිකිරීමට රු.1,694,935ක් වැය කළ ද, ඊට පාලිකාවක් බඳවාගත නොහැකි වීමෙන් 2019 ඔක්තෝබර් සිට වසා දමා තිබුණි. එමෙන්ම, එම මධ්‍යස්ථානයට නිකුත් කළ රු.140,650ක් වූ භාණ්ඩ ඒකක 19ක් ඉන්වෙන්ට්‍රිගත කර, නිලධාරියෙකුට භාර දී නොතිබුණි. | අවශ්‍ය කටයුතු ඉටු කරන තෙක් එම ගොඩනැඟිල්ල මත්ද්‍රව්‍ය නිවාරණ උපදේශන මධ්‍යස්ථානයක් හා ස්වයං රැකියා පුහුණු මධ්‍යස්ථානයක් ලෙස භාවිතා කරනු ලැබේ. අදාළ භාණ්ඩ පොදු ගබඩාවේ ආරක්ෂිතව තබා ඇති බව. | අපේක්ෂිත අරමුණු ඉටු විය යුතු වේ. |

**(ඇ) කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අංක 01/2021 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයට පටහැනිව, 2021 හා 2022 වර්ෂ තුළ ඉටු කළ මුළු කොන්ත්‍රාත් සංඛ්‍යාවෙන් පිළිවෙලින් සියයට 78ක් හා සියයට 68ක් එකම කොන්ත්‍රාත්කරුවකු වෙත පිරිනමා තිබුණි. | කොන්ත්‍රාත් සමිති ඉදිරිපත් නොවීම නිසා මහා සභාවේ එකඟතාව මත සිදු කළ බව. | අදාළ චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතු වේ. |

**(ඉ) මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|

| | | |
|---|---|---|
| ස්ථාන මාරුවී ගිය, විශ්‍රාම ගිය, සේවය හැරගිය නිලධාරීන් 4 දෙනෙකුගෙන් අයවිය යුතු රු.276,984 ක ණය ශේෂය, වසර 4 සිට වසර 6 දක්වා කාලයක් පැරණි විය. | හිඟහිටි ණය අයකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කරමින් පවතින බව. | හිඟහිටි ශේෂ අයකර ගත යුතු වේ. |

## 1.5.11.20 අරණායක ප්‍රාදේශීය සභාව

### 1.5.11.20.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ------------------------ | ----------- |
| (i) | සමාලෝචිත වර්ෂයට අදාළව රු.298,863 ක් වූ දිරි දීමනා ගෙවා තිබියදී ගෙවිය යුතු ලෙස නැවත දක්වා තිබුණි. | එය නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ii) | 2021 වර්ෂයේදී වැඩිපුර අයකළ විශේෂ අත්තිකාරම් රු.12,000 ක් සමාලෝචිත වර්ෂයේදී ආපසු ගෙවීම, අයවිය යුතු ශේෂයක් ලෙස නැවත ගිණුම්ගත කර තිබුණි. | අත්වැරදීමකින් පරිගණක ගත වී ඇති අතර එය නිවැරදි කර ඇති බව. | - එම - |
| (iii) | ස්ථාවර වත්කම් ලේඛනය අනුව රු.40,083,712ක් වූ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ 08ක වටිනාකම රු.6,183,967 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | එක් වාහනයක් මාවනැල්ල ප්‍රාදේශීය සභාවට ලබා දී ඇති බවත් ඉතිරිය ගිණුම් ගතකර ඇති බව. | - එම - |
| (iv) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගෙවිය යුතු වියදම් සඳහා රු.32,021 ක් වැඩියෙන් සහ රු.6,000ක් අඩුවෙන් ගිණුම්ගත | තක්සේරු කිරීමට අසීරු නිසා ආසන්න අගයකට ණයහිමි ප්‍රතිපාදන වෙන් කළ බව. | - එම - |

කර තිබුණි.

| | | | |
|---|---|---|---|
| (v) | රු.49,913,700 ක් වූ ගොඩනැගිල්ලක් සහ වටිනාකම තක්සේරු නොකරන ලද ඉඩම් 23ක් ගිණුම්ගත කර නොතිබුණි. | එම ඉඩම් තක්සේරු කර ගිණුම්ගත කරන බව. | - එම - |

**(ආ) නොසැසඳුණු පාලන ගිණුම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි සහ ජංගම වත්කම් විෂයයන් 04ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය, ඒ ඒ ගිණුම් විෂයයන්හි උපයෝගී ලේඛන හා සැසඳීමේදී රු.807,219ක වෙනසක් පැවතිණි. | එකඟ වේ. | මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ශේෂ උපයෝගී ලේඛන සමග එකඟ කළ හැකි විය යුතුය. |

**(ඇ) විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.9,389,129ක් වූ ස්ථාවර වත්කම් ගිණුම් විෂයයන් 02ක් වෙනුවෙන් උපලේඛන ඉදිරිපත් නොවුණි. | අදහස් දක්වා නොතිබුණි. | ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. |

**1.5.11.20.2 අනුකූල නොවීම්**

**(අ) නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|

| | | | |
|---|---|---|---|
| ------------ | ------------------- | ----------------- | --------------- |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | 2011 සිට 2021 වර්ෂය දක්වා කාලයට අදාළ රු.628,194 ක් වූ වර්ෂ 02 ඉක්මවූ තැන්පතු 39ක් නිරවුල් කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වේ. |

**1.5.11.20.3 මූල්‍ය සමාලෝචනය**

**(අ) මූල්‍ය පාලනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ----------------------- | ----------- |
| බැංකු ගිණුමක පැවති රු.8,619,147ක ශේෂය කෙටි කාලීන ආයෝජනයක හෝ යොදවා ආදායම් උපයා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ස්ථාවර තැන්පතු සඳහා අනුමැතියට යොමු කළ ද එය මහ සභාවේදී සම්මත නොකරන ලද බව. | ආයෝජන මඟින් ආදායම් උපයා ගතයුතු වේ. |

**1.5.11.20.4 ආදායම් පරිපාලනය**

**(අ) ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ------------------------ | ------------- |
| (i) | වරිපනම්, අක්කර බදු හා කඩ කුලී යන ආදායම් විෂයයන්ගෙන් 2022 | හිගහිටි මුදල් ඉදිරියේදී අය | හිග ආදායම් නොපමාව අයකළ |

| | | | |
|---|---|---|---|
| | දෙසැම්බර් 31 දිනට රු.391,475ක් අයවිය යුතුව තිබුණි. එම වටිනාකම තුළ වර්ෂ 01ත් වර්ෂ 05ත් අතර කාලයක් පැරැණි රු.164,504ක ශේෂයක් ද, වර්ෂ 05කට වඩා පැරැණි රු.152,989ක ශේෂයක් ද පැවැතිණි. | කරන බව. | යුතු වේ. |
| (ii) | සමාලෝචිත වර්ෂය සඳහා දැන්වීම් පුවරු 35කින් රු.107,686ක් අයකර නොතිබුණි. එමෙන්ම, දැන්වීම් පුවරු ආදායම බිල් නොකිරීම නිසා වර්ෂය තුළ ලැබිය යුතු සම්පූර්ණ ආදායම ගිණුම්ගත වී නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |

**1.5.11.20.5 මෙහෙයුම් සමාලෝචනය**

**(අ) කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ මාර්ගෝපදේශ සංග්‍රහයේ අංක 11/2010 දරන චක්‍රලේඛයේ 3.7 ඡේදය ප්‍රකාරව පළාත් පාලන ආයතන සතු බැකෝ යන්ත්‍ර නොමිලේ ලබාදීම නොකළ යුතු වුවද, ඊට අනුකූල නොවන ලෙස යන්ත්‍ර පැය 291ක් නොමිලේ ලබා දීම නිසා දළ වශයෙන් රු.1,309,500ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි. | මින් ඉදිරියට විෂය නිලධාරීන්ගේ ලිඛිත ඉල්ලීමක් මත පමණක් බැකෝ යන්ත්‍රය යෙදවීමට කටයුතු කරන බවත්, යම් පැය ප්‍රමාණයක් ක්‍රීඩාපිටි, මාර්ග හා පූජනීය ස්ථාන පිළිසකර කරන බවත්, ඉදිරියේදී ඉල්ලීම ලිඛිතව ලබා ගැනීමටත්, ක්‍රීඩා භූමි හා පන්සල් වැනි ස්ථාන සඳහා ප්‍රදේශවාසීන්ගේ මුදලක් ලබා ගැනීමටත් කටයුතු කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ii) | සභාවට එරෙහිව පනවා තිබුණු නඩු 06 | අදහස් දක්වා නොමැත. | අවශ්‍ය හෙළිදරව් |

| | | |
|---|---|---|
| ක් සම්බන්ධ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | | කිරීම් කළ යුතු වේ. |

**(ආ) මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ------------------- | ------------- |
| (i) | වර්ෂ 5කට වරක් සිදුකළ යුතු දේපළ තක්සේරු කිරීම 2011 වර්ෂයෙන් පසු සිදුකර නොතිබුණි. | තක්සේරු කටයුතු ආරම්භ කර ඇත. | නිවැරදිව ආදායම් උපයාගත යුතු වේ. |
| (ii) | ගොඩනැගිලි ඉදිකිරීම සඳහා 2017 – 2022 වර්ෂ අතර කාලය තුළ අනුමත කළ අයදුම්පත්‍ර 253කින් අයදුම්පත්‍ර 24කට පමණක් අනුකූලතා සහතික නිකුත් කර තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ඉදිකළ ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණයක් කළ යුතු වේ. |
| (iii) | ප්‍රදේශවාසීන්ගේ විරෝධතා නිසා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ලබාගත් ඉඩමට කසළ බැහැර නොකර රු.880,000ක වාර්ෂික බදු පදනම මත ඉඩමක් ලබාගෙන කසළ බැහැර කර තිබුණි. 2022 වර්ෂය තුළ කසළ කළමනාකරණය වෙනුවෙන් රු.6,746,686ක් වැයකර තිබුණද, ඉන් පොහොර නිෂ්පාදනය කර ආදායමක් ඉපැයීමට සභාව අපොහොසත් වී තිබුණි. | කොම්පොස්ට් ව්‍යාපෘතියක් සඳහා ඇස්තමේන්තු හා ව්‍යාපෘති වාර්තාවක් සකස් කරන බව. | කසළ බැහැර කිරීම විධිමත් පරිදි සිදුකළ යුතු වේ. |
| (iv) | සමාලෝචිත වර්ෂය අවසානයට රු.5,235,846 ක් වූ විවිධ ණය හිමි ශේෂය තුළ වසර 1 ත් වසර 4 ත් අතර කාලයක් පැරණි රු.579,034 ක ශේෂ පැවැතුණි. | ගෙවීමට සහන ඉල්ලා ඇති අතර කර්මාන්ත ණයහිමි ගෙවීම් සඳහා පළාත් සභාවෙන් මුදල් ලද බව. | ණයහිමි ශේෂ නිරවුල් කළ යුතු වේ. |

**(ඇ) වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ---------------------- | ------------- |
| (i) | සභාව සතු නොවූ රු.518,000 ක් වූ ටේලර් 02 ක හිමිකාරීත්වය පවරා ගැනීමට හෝ ආපසු භාර දීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම, සභාව සතු රු.5,542,128ක් වූ වාහන 05ක අයිතිය නීත්‍යානුකූලව පවරා ගෙන නොතිබුණි. | වාහන පවරා ගැනීමට ලිපි යොමුකර ඇත. | වත්කම්වල හිමිකාරත්වය නිරවුල් විය යුතුය. |
| (ii) | සභාව සතු සුසාන භූමි 03ක් සභා දේපළ ලෙස හඳුනා ගෙන නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | - එම - |
| (iii) | වටිනාකම රු.3,505,000 ක් වූ සභාව සතු ට්‍රැක්ටර් 03ක් හා ටේලර් 2ක් වර්ෂ 2ත් වර්ෂ 10ත් අතර කාලයක සිට අක්‍රියව පවතී. | මෙම වාහන වෙන්දේසි කරන බව. | වත්කම් අභාවිතව නොතැබිය යුතු වේ. |

**(ඇ) මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------- | ------------------------ | ---------------- |
| සභාවේ 83 දෙනෙකු වූ අනුමත කාර්යය මණ්ඩලයෙන් පුරප්පාඩු 08ක් පැවතුණි. එමෙන්ම, ආදායම් එකතු කිරීම, රියැදුරු හා සෞඛ්‍ය පරිපාලක තනතුරුවල රාජකාරි සඳහා කම්කරුවන් යොදවා තිබුණි. | එකඟ වේ. | අවශ්‍යතාව පරිදි පුරප්පාඩු සම්පූර්ණ කර ගත යුතු වේ. |

**1.5.11.21 මාවනැල්ල ප්‍රාදේශීය සභාව**

**1.5.11.21.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|

| | | | |
|---|---|---|---|
| | --------------------- | ----------------------- | ----------- |
| (i) | 2021 වර්ෂයේදී ක්‍රීඩා අමාත්‍යාංශය මගින් සංවර්ධනය කර පවරා දෙනු ලැබූ මාවනැල්ල මහජන ක්‍රීඩාංගනය සඳහා එම අමාත්‍යාංශය දරන ලද රු.5,000,000ක් ණයහිමියන් ලෙස දක්වා තිබුණි. | 2023 අවසන් ගිණුම සකස් කරන විට එය නිවැරදි කරන බව. | ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ii) | ඉඩම් කට්ටි කිරීම් වෙනුවෙන් සියයට 1ක් ලෙස සමාලෝචිත වර්ෂයේදී ලද රු.4,630,530ක් තැන්පතු ලෙස ගිණුම්ගත නොකර, ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම සකස් කරන විට නිවැරදි කරන බව. | - එම - |
| (iii) | 2016 වර්ෂය තුළ නීතිඥ ගාස්තු ගෙවීමට නොතිබියදී ඒ වෙනුවෙන් රු.1,773,000ක් වෙන්කර තිබුණි. | ලිපිගොනු අනුව ගෙවීමක් නොමැති බවට තහවුරු කර ගැනිමෙන් පසු 2023 වර්ෂයේදී අවශ්‍ය ගැලපීම් සිදු කරන බව. | - එම - |
| (iv) | 2021 භාණ්ඩ සමීක්ෂණයෙන් හඳුනාගත් රු.190,077ක ඌනතාව සහ රු.299,755 ක කොඩි කණු ඌනතාව වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකරන තෙක් අයකරගත යුතු ලෙස ගිණුම්වල දක්වා නොතිබුණි. | වගකිව යුතු අයගෙන් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. ඉදිරියේදී අයකර ගතයුතු ශේෂයක් ලෙස අවසන් ගිණුම්වල දක්වනු ලැබේ. | අදාළ ඌනතාව වගකිව යුතු අයගෙන් අය කළ යුතු වේ. |
| (v) | 2020 වර්ෂයේ ගෙවිය යුතු මුද්දර ගාස්තු රු.114,600ක් හා 2020 හා 2021 වර්ෂවල උසාවි දඩ කාර්ය මණ්ඩල දීමනා සඳහා රු.222,288ක් වැඩියෙන් වෙන්කර තිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම සකස් කරන විට නිවැරදි කරන බව. | ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (vi) | සමාලෝචිත වර්ෂය තුළ ලද ලැබිය යුතු ආයෝජන පොලී රු.127,685ක් ලැබිය යුතු ආයෝජන පොලී ගිණුම බැර කිරීම වෙනුවට සමුච්චිත අරමුදලට හරකර ස්ථාවර තැම්පතු ගිණුම බැරකර තිබුණි. | 2021 වර්ෂයේ ආයෝජන පොලී උපලබ්ධි වීමට පෙර ආයෝජනවලට හරකර තිබූ නිසා 2022 වර්ෂයේ ආරම්භක ශේෂයට ගලපමින් නිවැරදි කර ඇති බව. | - එම - |
| (vii) | 2021 වර්ෂයේදී අඩුවෙන් ගිණුම්ගත කළ රු.1,818,978ක ආයෝජන පොලී ආදායම, ලැබිය යුතු ආයෝජන පොලී ගිණුම හර කර සමුච්චිත අරමුදල බැර කළ යුතු වුවත්, සමුච්චිත අරමුදලට හර හා බැර කර තිබුණි. | 2021 වර්ෂයේදීම උපලබ්ධි වී ඇති බැවින් සමුච්චිත අරමුදල් ගිණුමට ගැලපීම් කළබව. | - එම - |

**(ආ) විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු.19,113,662ක ලී බඩු සවිකිරීම් හා කාර්යාල උපකරණවල සහ රු.492,368ක ලැබිය යුතු වරිපනම් බදුවල නිවැරදිතාව තහවුරු කිරීම සඳහා උපලේඛන ඉදිරිපත් නොවුණි. | 2023 අවසන් ගිණුම සමග මෙම උපලේඛන ඉදිරිපත් කරන බව. | උපලේඛන ඉදිරිපත් කළයුතු වේ. |

**1.5.11.21.2 අනුකූල නොවීම්**

**(අ) නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|

| | | | | |
|---|---|---|---|---|
| (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.371 | වසර 02ත් 12ත් අතර කාලය තුළ ලබා දුන් රු.325,632ක අත්තිකාරම්, සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් පියවා නොතිබුණි. | ඉදිරියේදී නිරවුල් කරනබව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු වේ. |
| (ii) | මුදල් රෙගුලාසි 571 | වර්ෂ 03කට වඩා පැරණි රු.2,189,553ක තැන්පතු නියාදනය කර නොතිබුණි. | -එම- | -එම- |

**1.5.11.21.3 ආදායම් පරිපාලනය**

**(අ) ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ---------------------- | ------------- |
| (i) | වරිපනම්, අක්කර බදු, කඩ කුලී, උසාවි දඩ හා මුද්දර ගාස්තු යන ආදායම් විෂයයන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට රු.120,658,749ක් අයවිය යුතුව තිබුණි. එම වටිනාකම තුළ වර්ෂ 01ත් වර්ෂ 05ත් අතර කාලයක් පැරණි රු.57,904,589ක ශේෂයක් ද, වර්ෂ 05කට වඩා පැරණි රු.8,349,630ක ශේෂයක් ද පැවැතිණි. | මෙම ප්‍රකාශය හා එකග වේ. හිඟ මුදල අවම කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | හිඟ ආදායම් අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතු වේ. |
| (ii) | ප්‍රදර්ශිත දැන්වීම් පුවරු 107කින් 2018 | පැරණි හිඟ දැන්වීම් පුවරු | හිඟ ආදායම් නොපමාව |

| | | | |
|---|---|---|---|
| | වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලයට අදාළව රු.7,453,806ක් අයවීමට පැවතුණි. | ගාස්තු කපා හැරීම සඳහා අනුමැතියට යොමු කර ඇත. | අයකළ කළ යුතු වේ. |
| (iii) | 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛය අනුව, වසර 5කට වරක් සිදුකළ යුතු වරිපනම් තක්සේරුව, 2009 වර්ෂයෙන් පසුව සිදුකර නොතිබුණි. | 2009 වර්ෂයෙන් පසු වරිපනම් තක්සේරුවක් සිදු කර නොමැත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**1.5.11.21.4 මෙහෙයුම් සමාලෝචනය**

**(අ) කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------------- | --------------------------- | ------------- |
| (i) | හෙම්මාතගම සාප්පු සංකීර්ණයට අදාළ හිඟහිටි රු. 1,607,774ක පෙර ගෙවුම් (key money) ශේෂය, 2022 දෙසැම්බර් 31 දිනට වර්ෂ 21කට වඩා පැරණි විය. | එවැනි හිඟ ශේෂයක් පවතී. මෙම වෙළඳ සංකීර්ණයේ දෙවන අදියර ඉදි කිරීම සඳහා මෙවර අයවැයෙන් මුදල් වෙන්කර ඇති බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ii) | වර්ෂ 03කට වඩා පැරණි රු.1,654,496ක ණයගැති ශේෂ 02ක් අයකර ගැනීමටත්, රු.3,169,542ක ණයහිමි ශේෂ නිරවුල් කිරීමටත් 2022 දෙසැම්බර් 31 දින දක්වාම පියවර ගෙන නොතිබුණි. | මෙම ප්‍රකාශය හා එකඟ වන බව. | ලැබිය යුතු ශේෂ අයකර ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතු වේ. |

**(ආ) මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ------------------------ | -------------------- |
| නාගරික වූ සභා බල ප්‍රදේශයේ ගලි බවුසර් සේවාව කාර්යක්ෂමව ඉටු | ගලි අපද්‍රව්‍ය බැහැර කිරීමට ක්‍රමයක් සකස් කරගත් පසු | අප ද්‍රවය බැහැර කිරීමේ ස්ථානයක් පිළියෙල කරගත |

| | | |
|---|---|---|
| නොකිරීම නිසා 2022 වර්ෂයේ අගෝස්තු දක්වා උපයාගත් ආදායම රු.24,300ක් පමණක් විය. | ගලි ආදායම වැඩිකරගත හැකි වේ. | යුතුය. |

**(ඈ) වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ---------------------------- | -------------- |
| (i) | සභාව සතු වාහන සහ යන්ත්‍රෝපකරණ 14ක් දීර්ඝ කාලයක සිට ළමා උද්‍යාන භූමියක දිරාපත් වෙමින් පැවැතිණි. | අබලි වාහන 07ක් අපහරණය සඳහා යාන්ත්‍රික ඉංජිනේරු තත්ත්ව වාර්තාව ලබා ගැනීමට ඉල්ලීමක් කර ඇති බව. | 2020 ඔක්තෝබර් 02 දිනැති අංක 05/2020 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය පරිදි කටයුතු කළ යුතු වේ. |
| (ii) | සභාව සතු කම්පැක්ටර් රථයක් වෙනත් රාජ්‍ය ආයතනයකට පැවැරීමට ගත් තීරණය ක්‍රියාත්මක නොවීම නිසා, එම වාහනය 2013 වර්ෂයේ සිට අභාවිතව පැවතුණි. | මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව . | වත්කම් අභාවිතව නොතැබිය යුතු වේ. |
| (iii) | සභාව සතු කඩ කාමර 08ක් වෙනුවෙන් 2022 වර්ෂය සඳහා බදුකරුවන් ඉදිරිපත් නොවීම නිසා රු.12,818,660ක ආදායමක් අහිමි වී තිබුණි. | එම කඩ පිහිටි ස්ථානය ජනාකීර්ණ නොවූ නිසා ව්‍යාපාරික කටයුතු කිරීම පාඩු බැවින් ටෙන්ඩර් මිලට ඒවා ගැනීම ප්‍රතික්ෂේප කර තිබුණු බව | වත්කම් අභාවිතව නොපවතින ලෙසට සුදුසු විකල්ප තීරණයකට එළැඹිය යුතු වේ. |

**(ඇ) කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------- | ------------------------ | ---------------- |
| කොන්ත්‍රාත්තුවක් වෙනුවෙන් අත්තිකාරම් ගෙවීමේදී 2006 | මේ සඳහා මහා සභාවේ අනුමැතිය ලැබී ඇති බව | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතු වේ. |

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 වගන්තියට අනනුකූලව ගිවිසුම්ගත මුදලින් සියයට 70ක් එනම්, රු.4,893,000ක් අත්තිකාරම් ගෙවා තිබුණි.

**(ඉ) මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------- | ---------------- | ----------- |
| පුරප්පාඩු නොතිබුණු ක්ෂේත්‍ර හා සෞඛ්‍ය කම්කරු තනතුරු සඳහා ඍජු ශ්‍රමය මත බඳවා ගැනීමට 2006 වර්ෂයේදී සභාව තීරණය කර ඒ අනුව, 2013 වර්ෂයේ සිට සේවකයින් 31 දෙනෙකු බඳවා ගෙන තිබුණි. එහෙත්, ඉහත සභා තීරණයට අනනුකූලව, වෙනත් කාර්යයන් සඳහා ඔවුන් යොදවා ගෙන 2022 අගෝස්තු දක්වා වැටුප් ලෙස රු.57,524,942ක් සභා අරමුදලින් ගෙවා තිබුණි. එමෙන්ම, ඉන් සේවකයින් 10 දෙනෙකුගේ පත්වීම් ලිපි පෞද්ගලික ලිපි ගොනුවට ඇතුළත් කර නොතිබුණි. | දේශපාලන අධිකාරිය විසින් සේවකයන් බඳවාගෙන වෙනත් ස්ථානවල සේවයේ යොදවා තිබුණි. මේ සම්බන්ධයෙන් මහා සභාවට ඉදිරිපත් කළ ද එම යෝජනාව ඉල්ලා අස් කරගෙන තිබුණි. ඔවුන් වසර 5කට වැඩි කාලයක් සේවයේ යොදවා ඇති නිසා පත්වීම් ලිපි ලබා දීම පිළිබඳව පළාත් පාලන සහකාර කොමසාරිස්ගෙන් විමසා ඇති බව. | සේවා අවශ්‍යතාවය මත තනතුරුවල සංඛ්‍යාව වැඩිකර ගැනීම සඳහා අනුමැතිය ලබාගත යුතු වේ. |

**1.5.11.22 ගලිගමුව ප්‍රාදේශීය සභාව**

**1.5.11.22.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|

| | | | |
|---|---|---|---|
| | ------------------------ | ------------------------- | ------------- |
| (i) | වැඩිපුර ගෙවා තිබුණු ණය වාරික මුදල ණය ශේෂයට හිළව් නොකිරීම නිසා දේශීය ණය සංවර්ධන අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.178,795ක් වැඩියෙන් දක්වා තිබුණි. | එකඟ වේ. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතු වේ. |
| (ii) | ඉඩම් කට්ටි කිරීම් මගින් සභාවට ලද රු.8,995,000 ක ඉඩම්, පොදු ලිං 04 ක් සහ අමතර ඉඩම් හා ගොඩනැගිලි 18 ක් ගිණුම්ගත කර නොතිබුණි. | - එම - | - එම - |
| (iii) | විගණන ගාස්තු රු. 36,900කින් අධි වෙන් කිරීම් සිදුකර තිබුණි. | - එම - | - එම - |
| (iv) | වැඩ නිමකළ කර්මාන්ත 07ක වටිනාකම රු.25,251,119ක් ගිණුම්ගත කර නොතිබුණි. | එම වටිනාකම් ගිණුම්ගත කරන බව. | - එම - |
| (v) | ඉකුත් වර්ෂවල දීමනා රු.197,000ක් 2022 වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ප්‍රතිපාදන සලසා නොතිබීම මීට හේතු වූ බව. | - එම - |
| (vi) | සමාලෝචිත වර්ෂය සඳහා 2023 වර්ෂයේ ලද ආදායම් රු.58,850ක් ගිණුම්ගත කර නොතිබුණි. | අවසන් ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කරන බව. | - එම - |

**(ආ) නොසැසඳුණු පාලන ගිණුම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ----------------------- | ----------------------- | ------------------- |
| ස්ථාවර වත්කම් ලේඛනය අනුව 2022 දෙසැම්බර් 31 දිනට ගිණුම් විෂයයන් 05 ක ශේෂ රු.1,757,606කින් උපලේඛන | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මූලා‍ය ප්‍රකාශන, අදාළ ප්‍රභව ලියවිලි සමග එකඟ විය යුතු වේ. |

සමඟ නොසැසඳුණි. එමෙන්ම, ආදායම් විෂයයන් 03ක උපයෝගී ලේඛන අනුව ශේෂ හා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය අනුව එම ශේෂ අතර රු.51,063ක වෙනසක් පැවතුණි.

**(ඈ) විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| එකතුව රු. 223,360 ක් වූ ගිණුම් විෂයයන් 04ක් වෙනුවෙන් උපලේඛන ඉදිරිපත් කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | විගණනය සඳහා අවශ්‍ය තොරතුරු ලබා දිය යුතු වේ. |

**1.5.11.22.2 අනුකූල නොවීම්**

**(අ) නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

**1.5.11.22.3** **ආදායම් පරිපාලනය**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ මාර්ගෝපදේශ සංග්‍රහය | | | |
| (a) අංක 02/2010 දරන චක්‍රලේඛයේ xiii ඡේදය | වසර 05කට වරක් ප්‍රතිශෝධනය කළයුතු වරිපනම් බදු දේපළ තක්සේරුව 2007 වර්ෂයට පසු සිදුකර නොතිබුණි. | නව තක්සේරුව ලද පසු ඒ අනුව කටයුතු කරන බව. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතු වේ. |
| (b) අංක 01/2010 දරන චක්‍රලේඛයේ 7.4(iv) ඡේදය | සභිකවරුන් 17 දෙනෙකු වෛද්‍ය නොවන හා පළාත් පාලනයට අදාළ නොවන හේතු මත නිවාඩු ලබාගෙන සභාවට නොපැමිණි අවස්ථා 38ක දී රු.570,000ක් සභික දීමනා ගෙවා තිබුණි. | ඉදිරියේදී වෛද්‍ය වාර්තා ලබාගෙන අදාළ දීමනාව ගෙවන බව. | - එම - |
| (ii) 2009 ඔක්තෝබර් 07 දිනැති අංක 2/2009 දරන පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛය | මාසයකට සංයුක්ත දීමනා ගෙවිය හැකි උපරිම දින 06 ඉක්මවා 2022 වර්ෂයේදී දින 58ක් සඳහා රියැදුරන් දෙදෙනෙකුට රු.40,950ක සංයුක්ත දීමනා ගෙවා තිබුණි. | ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන පදනම් කර ගනිමින් ගෙවීම් කටයුතු කර ඇති බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (iii) 1975 අංක 01 දරන වත්කම් බැරකම් ප්‍රකාශ කිරීමේ පනත | සභිකවරුන් 21 දෙනෙකු විසින් පළමු වත්කම් බැරකම් ප්‍රකාශ ලබා දී නොතිබුණු අතර සභිකයින් 32දෙනෙකු විසින් වත්කම් බැරකම් පිළිබඳ වාර්ෂික ප්‍රකාශ 2019 වර්ෂයේ සිට 2022 දක්වා ඉදිරිපත්කර නොතිබුණි. | සියලු සභිකවරුන්ට වාර්ෂිකව මාර්තු 30 දිනට පෙර එම ප්‍රකාශ භාර දෙන ලෙස කිහිප විටක දී දැනුම් දුන් බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**(අ) ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------ | -------------------- | ---------- |
| වරිපනම්, අක්කර බදු, කාමර කුලී හා මුද්දර ගාස්තු යන ආදායම් විෂයයන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට රු.24,442,383ක් අයවිය යුතුව තිබුණි. එම වටිනාකම තුළ වර්ෂ 01ත් වර්ෂ 05ත් අතර කාලයක් පැරණි රු.2,871,378ක ශේෂයක් ද, වර්ෂ 05කට වඩා පැරණි රු.648,896ක ශේෂයක් ද පැවතිණි. | මෙම ප්‍රකාශය හා එකඟ වේ. හිඟ මුදල අවම කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | හිඟ ආදායම් නොපමාව අයකර ගත යුතු වේ. |

**1.5.11.22.4 මෙහෙයුම් සමාලෝචනය**

**(අ) අනාර්ථික ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------ | -------------------- | ------------ |
| භාවිතා නොකළ වාහන සඳහා අභාවිත සහතිකයක් දෙවසරකට වරක් ලබා නොගෙන 2014 හා 2018 වර්ෂවල සිට අභාවිතව පැවැති ට්‍රැක්ටර් 02ක් වෙනුවෙන් 2014 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා ආදායම් බලපත්‍ර වෙනුවෙන් රු.8,685ක් ද, රක්ෂණය වෙනුවෙන් රු.113,307ක් ද ගෙවීම නිෂ්ඵල වියදමක් විය. | අභාවිත සහතික ලබා ගැනීමට කටයුතු කරන බව. | භාවිතා නොකරන වාහන අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

**(ආ) කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|

| | | | |
|---|---|---|---|
| | ---------------------- | ---------------------- | ------------- |
| (i) | වාර්ෂික සමීක්ෂණය අනුව හඳුනාගත් කර්මාන්ත හා ව්‍යාපාර ඒකක 51ක් ලේඛනයට ඇතුළත් කර නොතිබීමෙන් හිඟහිටි ආදායම රු.100,000ක් අඩුවෙන් දක්වා තිබුණි. | වාර්ෂිකව සමීක්ෂණ සිදු කරන බව. | ලේඛන නිසි පරිදි යාවත්කාලීන කළ යුතු වේ. |
| (ii) | 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 21 වගන්තියට අනනුකූලව 2015 වර්ෂයේ සිට 2022 නොවැම්බර් දක්වා ලද සංවර්ධන අයදුම්පත් 839න් අයදුම්පත් 673ක් සඳහා අනුකූලතා සහතික ලබාගෙන නොතිබුණි. එහෙත්, භාවිතා කරමින් පවතින එම සංවර්ධිත දේපළවලට එරෙහිව නීතිමය පියවර ගෙන නොතිබුණි. | එකඟ වන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (iii) | සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව රු.68,922,360 ක් වූ ණයගැති ශේෂය තුළ වසර 01ත් වසර 05ත් අතර කාලයක් හිඟව පවතින රු.1,546,416ක ශේෂ ද, වසර 05 ට වැඩි රු.18,916,936ක ශේෂ ද විය. | නැවත නොලැබෙන බව තහවුරු වේ නම් එම ශේෂ ඉවත් කරන බව. | ශේෂ නිරවුල් කළ යුතු වේ. |
| (iv) | සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව රු.57,461,798 ක් වූ විවිධ ණයහිමි ශේෂය තුළ වසර 01ත් වසර 05 ත් අතර කාලයක් හිඟව පවතින රු.2,744,777ක ශේෂ ද, වසර 05 ට වැඩි රු.2,193,128ක ශේෂ ද විය. | නැවත නොලැබෙන බව තහවුරු වේ නම් එම ශේෂ ඉවත් කරන බව. | ශේෂ නිරවුල් කළ යුතු වේ. |

**(ඇ) මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ---------------------- | ------------- |
| (i) | විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් පරිදි නව වීථි ලාම්පු සවි කිරීමට අවශ්‍ය අනුමැතිය ලබා නොගෙන වීථි පහන් 2,745ක් සවිකර තිබුණි. | මේ සඳහා විදුලි ඉංජිනේරු හා ශාඛා කළමණාකරු වාචිකව දැනුවත් කළ බව. | උපදෙස් පරිදි කටයුතු කළයුතු වේ. |
| (ii) | ඉඩම් වෙන්දේසියක දී පොදු කටයුතු සඳහා සභාව වෙත පැවරිය යුතු රු.4,668,000ක් වූ පර්චස් 31.12ක් පවරා නොතිබුණි. | එම බිම් කොටස තෑගි ඔප්පුවකින් පවරන බව. | නොපමාව පවරාගත යුතු වේ. |
| (iii) | ලියාපදිංචි ත්‍රිරෝද රථ සංගම් 11ක සාමාජිකයින් 301 දෙනෙකුගෙන් 2022 නොවැම්බර් 30 දිනට රු.124,000ක් හිඟව පැවතුණි. | මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ ගිවිසුම් ගත වී රථගාල් සකස්කර ගාස්තු අය කරන බව. | ආදායම් උපයාගත යුතු වේ. |

**(ඈ) වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | -------------------------- | ------------- |
| (i) | 2016 වර්ෂයේදී ලද රු.2,000,000 ක් වූ කම්පැක්ටර් ට්‍රේලරයක් ලද දින සිට නිෂ්කාර්යව පැවතුණි. | එය ට්‍රැක්ටර්යකට සම්බන්ධ කිරීමේ අපහසුතාව මත භාවිතයට ගෙන නොමැති බව. | වත්කම් අභාවිතව නොතැබිය යුතු වේ. |
| (ii) | 2019 වර්ෂයේ ලද රු. 6,221,373 ක් වූ කම්පැක්ටරය පවරා ගැනීමට හෝ ආපසු භාර දීමට කටයුතු කර නොතිබුණි. | එහි අයිතිය එක් දින සේවාවක් මඟින් සිදු කරන බව. | නොපමාව පවරාගත යුතු වේ. |
| (iii) | සභාව සතු රු.1,750,000ක් වූ වාහන 02ක් 2013 වර්ෂයේ සිට අක්‍රියව පවතී. | සභා තීරණය පරිදි අලුත්වැඩියා කළ යුතු වුවද, උපාංග හිඟතාව නිසා එය නොහැකි වී ඇති බව. | නොපමාව අලුත්වැඩියාව කළ යුතු වේ. |

**(ඉ) මානව සම්පත් කළමනාකරණය**

විගණන නිරීක්ෂණය සභාවේ අදහස් දැක්වීම නිර්දේශය

| | | | |
|---|---|---|---|
| | ---------------------- | ----------------------- | ------------- |
| (i) | පුරප්පාඩු 17ක් 2019 වර්ෂයේ සිට පවතී. මේ නිසා වසම් 51කින් යුත් මුළු බල ප්‍රදේශයම එක් ආදායම් පරීක්ෂකවරයෙකුට ආවරණය කිරීමට සිදු වී තිබුණි. | පුරප්පාඩු සඳහා දැන්වීම් සිදුකර ඇති අතර, පුරප්පාඩු පිරවීම අපගේ පාලන විෂයෙන් බැහැර කාරණයක් බව. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වේ. |
| (ii) | මුදල් රෙගුලාසි 880 අනුව ඇප තැබිය යුතු නිලධාරීන් 09 දෙනෙකුගෙන් ඇප අයකර නොතිබුණි. | එකඟ වන බව. | ඇප ලබාගත යුතු වේ. |

**1.5.11.23 දැරණියගල ප්‍රාදේශීය සභාව**

**1.5.11.23.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ----------------------- | ----------- |
| (i) | දියර ඉසින යන්ත්‍ර 05ක, හැමර් යන්ත්‍රයක, දම්වැල් කියතක සහ රු.800,000ක් වූ බ්‍රේලර් යන්ත්‍රයක වටිනාකම් ගිණුම්ගත කර නොතිබුණි. | එකඟ වේ. 2023 වර්ෂයේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ii) | ඉදිකිරීමට අපේක්ෂා කළ ද, ටෙන්ඩර්කරුවන් ඉදිරිපත් නොවූ කඩකාමර 20 ක් වෙනුවෙන් ලබාගත් පෙර ගෙවුම් (Key money) මුදල් රු.22,080,000 ක් 2014 වර්ෂයේ සිට ලැබිය යුතු ලෙස ඉදිරියට ගෙන එමින් තිබුණි. | එකඟ වේ. 2023 වර්ෂයේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (iii) | මාසික කුලියට ලබා දී ඇති සතිපොළ කඩකාමර 4ක් සඳහා ලැබිය යුතු රු.1,728,000ක පෙර ගෙවුම් ශේෂයක් ඉදිරියට ගෙන එමින් තිබුණි. | - එම - | - එම - |

**(ආ) නොසැසඳුණු පාලන ගිණුම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම් විෂයයන් 03ක පැවැති ශේෂ, ඊට අදාළ උපයෝගී ලේඛනවල එදිනට පැවැති ශේෂ හා සැසදීමේදී රු.4,024,127ක වෙනසක් පැවැතිණි. | එකඟ වේ. දීර්ඝ කාලයක සිට පවතින මෙම ශේෂ, ලේඛන පරීක්ෂා කිරීමෙන් පසු ගැලපීමට කටයුතු කරන බව | මූල්‍ය ප්‍රකාශනවල වූ ශේෂ ඊට අදාළ උපයෝගී ලේඛන සමග සැසඳිය හැකි විය යුතු වේ. |

**(ඇ) විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාර්යාල හා පුස්තකාල උපකරණ රු.7,261,856ක නිවැරදිතාව තහවුරු කිරීමට අවශ්‍ය උපලේඛන ඉදිරිපත් නොවුණි. | එකඟ වේ. 2023 ගිණුම් සමග එම උපලේඛන ඉදිරිපත් කරන බව | අදාළ උපලේඛන ඉදිරිපත් කළ යුතු වේ. |

**(ඈ) අධිකාරි බලය නොලත් ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | රු.245,025ක භාණ්ඩ ඌනතාවක් වගකිවයුතු අයගෙන් අයකිරීමට ඇති හැකියාව සොයා බැලීමකින් තොරව හා නිසි අනුමැතියක් ද රහිතව කපා හැර තිබුණි. | එකඟ වන බව. | අදාළ ඌනතා වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකළ යුතු වේ. |
| (ii) | මහජන නියෝජිතයින් වෙත ආපසු අයකිරීමේ පදනම මත සභා අරමුදලින් ණය මුදල් ලබාදීමට කිසිදු ආකාරයක හෝ නෛතික ප්‍රතිපාදන නොතිබියදී, 2022 වර්ෂය තුළ සභිකයින් 10 දෙනකුට රු.200,000ක උත්සව අත්තිකාරම් ලබා දී වාරික වශයෙන් අයකර තිබුණි. | එකඟ වේ. මහ සභාවේ අනුමැතිය ලැබිණි. එම මුදල් 2022 වර්ෂයේ දී අයකර ඇත. ඉදිරියේදී, ආයතන සංග්‍රහය අනුව කටයුතු කරන බව | අදාළ වන නිති රීති අනුව කටයුතු කළ යුතු වේ. |

**1.5.11.23.2 අනුකූල නොවීම්**

**(අ) නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.571 | කල් ඉකුත් වූ රු.345,087ක තැන්පතු 19ක් නියාදනය කර නොතිබුණි. | එකඟ වේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**1.5.11.23.3 ආදායම් පරිපාලනය**

**(අ) ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වරිපනම් හා අක්කර බදු යන ආදායම් විෂයයන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට රු.910,041ක් අයවිය යුතුව තිබුණි. එම වටිනාකම තුළ වර්ෂ 01ත් වර්ෂ 05ත් අතර කාලයක් පැරැණි රු.255,489ක ශේෂයක් ද, වර්ෂ 05කට වඩා පැරැණි රු.319,094ක ශේෂයක් ද පැවැතිණි. | එකඟ වන බව. | හිඟ ආදායම් නොපමාව අය කළ යුතු වේ. |

**1.5.11.23.4 මෙහෙයුම් සමාලෝචනය**

**(අ) කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) 2015 වර්ෂයට වඩා පැරණි රු.357,869 ක් වූ ලැබිය යුතු රජයේ ආධාර ශේෂය නිරවුල්කර නොතිබුණි. | එකඟ වන බව. | ලැබිය යුතු ශේෂ නොපමාව අයකළ යුතු වේ. |
| (ii) සමාලෝචිත වර්ෂය අවසානයට රු.52,596,720 ක් වූ කර්මාන්ත ණයහිමි ශේෂය තුළ වසර 01ත් වසර 05ත් අතර රු.27,966,021 ක ශේෂ ද , වසර 5 ට වැඩි රු. 24,299,000 ක ශේෂ ද පැවැතිණි. | - එම - | ණයහිමි ශේෂ නිරවුල් කළ යුතු වේ. |

**(ආ) මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ මාර්ගෝපදේශ සංග්‍රහයේ අංක 03/2010 දරන චක්‍රලේඛයේ 1.3 ඡේදය පරිදි අනවසර ඉදිකිරීම් පාලනයට කමිටුවක් ස්ථාපිත කර නොතිබුණි. එමෙන්ම, නාගරික සංවර්ධන අධිකාරි පනතේ 21 වගන්තිය ප්‍රකාරව අනවසර ඉදි කිරීම්වලට එරෙහිව අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදුකර අනවසර ඉදිකිරීම් හඳුනාගැනීම වෙනුවට ලැබෙන පැමිණිලි මත නියෝග නිකුත් කර තිබුණි. ඒ සම්බන්ධ පසුවිපරමක් ද | එකඟ වේ. ඉදිරියේදී ක්ෂේත්‍ර පරීක්ෂණ හා පසු විපරම් සිදු කිරීමට කටයුතු කරන බව | අනවසර ඉදිකිරීම් වැළැක්වීමට කටයුතු කළ යුතු වේ. |

නොවුණි.

| | | | |
|---|---|---|---|
| ( ii) | බස්නැවතුම්පළ කඩකාමර ඉදිකිරීම සඳහා 2014 හා 2015 වර්ෂ තුළ දී ටෙන්ඩර්කරුවන් 29 දෙනෙකුගෙන් අයකරගත් පෙර ගෙවුම් මුදල් රු.24,299,000 ක් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් අදාළ කාර්යයට යොදවාගෙන නොතිබුණු අතර එම මුදල් 2014 වර්ෂයේදීම පරිපූරක ඇස්තමේන්තුවක් මගින් වෙනත් කාර්යයන් සඳහා යොදවාගෙන තිබුණි. | එකඟ වන බව. 2014 වර්ෂයේ අයකළ එම මුදල පරිපූරක ඇස්තමේන්තුවක් මඟින් කර්මාන්ත සඳහා වැය දරා ඇති බව | පෙර ගෙවුම් මුදල් අදාළ කාර්යයට යොදවා ගත යුතු වේ. |

**(ඇ) මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය<br>---------------------- | සභාවේ අදහස් දැක්වීම<br>------------------------- | නිර්දේශය<br>--------------- |
|---|---|---|---|
| (i) | 59ක් වූ අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 27ක් හා 05 දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණි. එම පුරප්පාඩු සඳහා සේවා ගිවිසුම් මත හා අනියම් පදනමින් සේවකයින් බඳවා ගෙන තිබුණි. | එකඟ වේ. | අවශ්‍යතාව පරිදි පුරප්පාඩු සම්පූර්ණ කර අතිරික්තය ඵලදායී ලෙස අනුයුක්ත කළ යුතු වේ. |
| (ii) | අනුමත තනතුරට අතිරික්තව හා පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව, 2018 ජනවාරි 01 දින සිට සේවා ගිවිසුමක් මත පෙර පාසල් පාලිකාවක් පත්කර එදින සිට 2022 දෙසැම්බර් දක්වා රු.540,000ක් ගෙවා තිබුණි. | එකඟ වේ. | චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලවකටයුතු කළ යුතු වේ. |
| (iii) | වසර 01 සිට වසර 29 දක්වා කාලයක් ගත වී තිබුණු නිළධාරීන් 09 | එකඟ වේ. | හිඟහිටි ණය ශේෂ නොපමාව අයකළ යුතු වේ. |

දෙනෙකුගෙන් අයවිය යුතු රු.416,699ක ණය ශේෂය සමාලෝචිත වර්ෂය අවසාන වන විටද අයකර නොතිබුණි.

**1.5.11.24 බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාව**

**1.5.11.24.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ( i) | දුරකථන කුළුණකින් හා සංදර්ශන ප්‍රවේශ පත්‍රවලින් ලද රු.160,200ක් තැන්පතු ලෙස ගිණුම්ගත කර තිබුණි. | ආදායමට ගැනීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. |
| (ii) | ප්‍රාදේශීය සභා ගිණුම් සංග්‍රහය අනුව මාර්ග ගිණුම්ගත කිරීම සිදු නොකළද රු.123,795,437 ක් වූ මාර්ග ගිණුම්ගත කර තිබුණි. | මධ්‍යම රජය හා පළාත් සභාව මඟින් කර්මාන්තය නම් කළ පසු මාර්ගය සංවර්ධනය කරන බව හා එහිදී අදාළ පාර සභාව සතු ද යන්න සොයා නොබලන බව. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. |
| (iii) | වටිනාකම රු.800,000 ක් වූ බේලර් යන්ත්‍රයක් හා ලැබිය යුතු කුළී රු.10,060ක් ගිණුම් ගතකර නොතිබුණි. | 2023 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී ඇතුළත් කරන බව | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. |

**(ආ) නොසැසඳුණු පාලන ගිණුම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට අනුව ගිණුම් විෂයයන් 08ක 2022 දෙසැම්බර් 31 දිනට පැවැති ශේෂය, ඊට අදාළ උපයෝගී ලේඛනවල එදිනට පැවැති ශේෂය හා සැසඳීමේ දී රු.99,805ක වෙනසක් පැවැතුණි. | වෙනස් වීම් සොයා බලා නිවැරදි කරන බව | මූල්‍ය ප්‍රකාශනවල අගයන්, උපයෝගී ලේඛන සමග සැසඳිය හැකි විය යුතුය. |

**1.5.11.24.2 ආදායම් පරිපාලනය**

**(අ) ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | වරිපනම්, අක්කර බදු හා කඩ කුලී යන ආදායම් විෂයයන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට රු.630,612ක් අයවිය යුතුව තිබුණි. එම වටිනාකම තුළ වර්ෂ 01ත් වර්ෂ 05ත් අතර කාලයක් පැරණි රු.523.465ක ශේෂයක් පැවැතිණි. | හිගහිටි මුදල් ඉදිරියේදී අය කරන බව. | හිග ආදායම් නොපමාව අයකළ යුතු වේ. |
| (ii) | රජයේ තක්සේරුවට අනනුකූලව සභා තීරණයක් මත කඩ කාමරවලින් කුළී අයකිරීම නිසා 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා රු.2,388,750ක කුළී ආදායමක් අහිමි වී තිබුණි. | දක්වා ඇති තොරතුරු නිවැරදි බව. | සභාවට අහිමි වූ ආදායම වගකිව යුතු අයගෙන් අයකළ යුතු වේ. |

**1.5.11.24.3 මෙහෙයුම් සමාලෝචනය**

**(අ) කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ඉකුත් වර්ෂවල දී කොරෝනා වසංගතය වෙනුවෙන් ලද ආධාර රු.300,000ක් එම කාර්යයට නොයොදවා තැන්පත් ගිණුමේ රඳවා තිබුණි. | මේ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය අතපසුවීමකින් වැය ශිර්ෂ යටතේ මිළ දී ගෙන තිබුණි. එය 2023 වර්ෂයේ දී නිවැරදි කරන බව. | අවශ්‍ය නිවැරදි කිරීම් කළ යුතුවේ. |
| (ii) | රු. 624,554ක් වූ කර්මාන්ත ණයගැති ශේෂ වර්ෂ 01ත් වර්ෂ 03ත් අතර කාලයක් පැරණි වූ අතර වර්ෂ 01ත් වර්ෂ 04ත් අතර කාලයක් පැරණි රු.87,200ක ණයහිමි ශේෂයක් පැවැතුණි. | කොටසක් මේ වන විට ලැබී ඇති බව හා ගෙවිය යුතු ශේෂයෙන් කොටසක් නිරවුල් කර ඇති බව. | ණයගැති ණයහිමි ශේෂ යාවත්කාලීනව පවත්වා ගෙන යා යුතු වේ. |

**(ආ) මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හාතාගොඩ, පන්නල පූනැහැල ඔය හරහා දමා තිබූ පැරණි යකඩ පාලම ගලවා ඉවත්කිරීමේ දී එහි වූ යකඩ කොටස් සම්බන්ධයෙන් තොරතුරු සැපයීමට සභාව අපොහොසත් විය. | මේ සම්බන්ධව ප්‍රාදේශීය සභාව සතුව ලිපි ගොනුවක් නොමැති බව. | මේ සම්බන්ධයෙන් විමර්ශනයක් කළ යුතු වේ. |

**(ඇ) වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2019 වර්ෂයේදී සභාවට ලද රු.6,221,373 ක් වූ කම්පැක්ටරය ලද දින සිට නිෂ්කාර්යව පැවතුණි. | මෙම යන්ත්‍රය ගොඩකවෙල ප්‍රාදේශීය සභාවට භාර දීමට නියමිත බව. | වත්කම් ඵලදායීව උපයෝජනය කළ යුතු වේ. |
| (ii) | සභාව සතු රු. 5,045,318 ක් වූ වාහන 03ක් වසර 02ත් 05ත් අතර කාලයක සිට අක්‍රියව පවතී. | සභාවේ මූල්‍ය තත්ත්වය අයහපත් නිසා මෙම වාහන අලුත්වැඩියාව ප්‍රමාද වී ඇති බව. | අප්‍රමාදව අලුත්වැඩියාව කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (iii) | සභාව භාවිතා කරන රු.20,551,373ක් වූ වාහන 10 ක් හා රු. 523,000 ක් වූ ට්‍රේලර් 02 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පැවති මූල්‍ය අර්බුදය හමුවේ පවරා ගැනීමේ කටයුතු ප්‍රමාද වූ අතර රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ වාහනවල අයිතිය පවරා දීමට කටයුතු කරන බව ලිඛිතව දන්වා ඇති බව. | නොපමාව පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (iv) | වාහන 02ක් වර්ෂ 02 කට වැඩි කාලයක සිට අභාවිතව පැවැති අතර, ට්‍රැක්ටර් 02ක් ඌන උපයෝජිතව පැවැතුණි. | වාහන ඵලදායී යෙදවීමට කටයුතු කරන බව. | වත්කම අභාවිතව නොතැබිය යුතු වේ. |

**1.5.11.25 දෙහිඕවිට ප්‍රාදේශීය සභාව**

**1.5.11.25.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ------------------------ | ----------- |
| (i) | සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු ආදායම් රු.139,640ක් ගිණුම්ගත කර නොතිබුණි. | එය රු.149,360 ක් ලෙස අගරු චෙක්පත් ගිණුමේ සටහන් කර ඇති බව. | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතු වේ. |
| (ii) | 2021 වර්ෂයේදී පරිත්‍යාග ලෙස ලද රු.800,000ක බේලර් යන්ත්‍රයක් ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුමෙන් ගැලපීම් කරන බව. | - එම - |
| (iii) | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කළයුතු මුද්දර බදු තැන්පතු රු.691,752ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | - එම - | - එම - |

| | | |
|---|---|---|
| (iv). 2022 වර්ෂය වෙනුවෙන් 2023 වර්ෂයේදී ගෙවා තිබුණු රු.55,200 ක් ගිණුම්ගත කර නොතිබුණි. | - එම - | - එම - |
| (v) ඉකුත් වර්ෂයේ දීමනා වෙනුවෙන් ගෙවූ රු.88,424ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | - එම - | - එම - |
| (vi) රු.12,365ක පොත් ඌනතාව අයකරගත යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | - එම - | - එම - |

**(ආ) නොසැසඳුණු පාලන ගිණුම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 04ක මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව 2022 දෙසැම්බර් 31 දිනය පැවැති ශේෂය, ඊට අදාළ උපයෝගී ලේඛනවල එදිනට පැවැති ශේෂ හා සැසඳීමේදී රු.9,583,483ක වෙනසක් පැවැතිණි. | නිවැරදි ශේෂය තහවුරු කර ගැලපීම් සිදු කරන බව | මූල්‍ය ප්‍රකාශනවල වූ ශේෂ, ඊට අදාළ උපයෝගී ලේඛන සමග සැසඳිය හැකි විය යුතු වේ. |

**(ඇ) විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.8,786,337 ක් වූ ස්ථාවර වත්කම් විෂයයන් 02ක් සහ ජංගම වත්කම් විෂයයන් 02ක් තහවුරු කර | වත්කම් සත්‍යාක්ෂණයක් සිදුකර නිවැරදි ශේෂය ගැලපීමට කටයුතු කරන බව. | විගණනය සඳහා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කළ යුතු වේ. |

ගැනීමට අවශ්‍ය උපලේඛන ඉදිරිපත් නොවුණි.

### 1.5.11.25 .2 අනුකූල නොවීම්

**(අ) නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.571 | 2015 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලයට අදාළ රු. 1,035,058ක් වූ තැන්පතු 60ක් නියාදනය කර නොතිබුණි. | අවශ්‍ය තැන්පත් රඳවා ගැනීම හා ඉතිරිය ආපසු ගෙවන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

### 1.5.11.25 .3 ආදායම් පරිපාලනය

**(අ) ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | වරිපනම්, අක්කර බදු හා කඩ කුලී යන ආදායම් විෂයයන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට රු.10,069,305ක් අයවිය යුතුව තිබුණි. එම වටිනාකම තුළ වර්ෂ 01ත් වර්ෂ 05ත් අතර කාලයක් පැරැණි රු.5,959,466ක ශේෂයක් ද, වර්ෂ 05කට වඩා පැරැණි රු.2,288,046ක ශේෂයක් ද පැවැතිණි. | හිඟ අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් නොපමාව අයකර ගත යුතු වේ. |
| (ii) | දෙහිඕවිට වෙළඳ සංකීර්ණයේ 2015 වර්ෂයේ බදු දුන් කඩ කාමර 06කින් හා 2021 වර්ෂයේ බදු දුන් කඩ කාමර 03කින් රු.6,418,500ක එකවර මුදල් (key money) | එක්වර මුදල් අයකර ගැනීමට හා ගිවිසුම්ගත වීමට කටයුතු කරමින් සිටින බව. | එකවර මුදල් අයකර ගැනීමටත්, බදු ගිවිසුම් වෙත එළැඹීමටත් |

| | | | |
|---|---|---|---|
| | අයකර නොතිබුණි. එමෙන්ම, එහි පැවැති කඩකාමර 27න් 26ක්ම වාර්ෂික බදු ගිවිසුම්වලට එළැඹ නොතිබුණි. | | කටයුතු කළ යුතු වේ. |
| (iii) | ස්ථිර දැන්වීම් පුවරු 09කින් හා ප්‍රචාරන දැන්වීම් පුවරු 89කින් රු.203,650 ක ගාස්තු අයකර නොතිබුණි. | 2023 දැන්වීම් පුවරු සඳහා ලේඛනයක් සකස් කර ගාස්තු අය කරන බව. | දැන්වීම් පුවරු ගාස්තු අය කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (iv) | ත්‍රිරෝද රථ ගාල් 13කින් 2021 හා 2022 වර්ෂ සඳහා රු.236,500ක ආදායමක් අයකර ගැනීමට 2021 ඔක්තෝබර් 22 දිනැති අංක 2251 දරන ගැසට් පත්‍රයේ (iv) (ආ) කොටස අනුව කටයුතු කර නොතිබුණි. | ත්‍රීරෝද රථ ගාල් සඳහා සභාව සතු ඉඩම් නොමැති ප්‍රදේශවල එම ගාස්තු අය කිරීමට නොහැකි වී ඇති බව. | ගැසට් පත්‍රය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**1.5.11.25 .4 මෙහෙයුම් සමාලෝචනය**

**(අ) කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ------------------------ | -------------- |
| (i) | එකතුව රු.18,008,107ක් වූ ස්ථාවර තැන්පත් ගිණුම් 06ක් කල් පිරීමට දින 08ත් 70ත් අතර කාලයක් තිබියදී වැඩි ස්ථාවර තැන්පත් පොලී ප්‍රතිශතයක් යටතේ ආයෝජනය කිරීමට තීරණය කිරීම නිසා සභාවට රු.281,098ක පොලී ආදායමක් අහිමි වී තිබුණි. | ඉදිරියේදී මේ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන බව. | ලැබිය යුතු ආදායම් අය කළ යුතු වේ. |
| (ii) | ගිණුම් අතර මුදල් මාරු කිරීම යනුවෙන් සඳහන් කර රු.235,897 ක හර ශේෂයක් 2018 වසරේ සිට ද, රු.2,130,953 ක ගෙවිය යුතු වැට් බදු මුදලක් 2013 වසරේ සිට ද ගිණුම්වල දක්වා තිබුණ ද, ඒවා නිරවුල් කර නොතිබුණි. | ශේෂ නිරවුල් කිරීමට කටයුතු කරන බව. | ශේෂ නිරවුල් කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (iii) | රු.43,088ක ශේෂයක් සහිත බැංකු ජංගම ගිණුමක් වසර 20කට අධික කාලයක සිට අක්‍රියව පැවතුණි. | - එම - | - එම - |
| (iv) | 2012 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ හඳුනාගත් අනවසර ඉදිකිරීම් 68ක් සම්බන්ධයෙන් 1982 අංක 04 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 23(5) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අතර, ඉදි කිරීම් 61කට අදාළව ඉවත්කිරීමේ නියෝග නිකුත් කර තිබුණද, පසු විපරම් කටයුතු සිදුකර නොතිබුණි. | අධිකරණ කටයුතු සඳහා වියදම් දැරීමට නොහැකි බැවින් අනවසර ඉදිකිරීම්කරුවන් වෙත නිවේදන නිකුත් කරන බව. | අදාළ පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (v) | කර්මාන්ත ණයගැති ශේෂය තුළ වසර 01ත් 05ත් අතර කාලයක් හිඟව පවතින රු.8,735,253ක ශේෂ අයකර නොතිබුණු අතර විවිධ ණයහිමි ශේෂය තුළ වසරකට වැඩි රු.9,428,645ක ශේෂ නිරවුල් කර නොතිබුණි. | එකඟ වන බව. | ශේෂ නිරවුල් කළ යුතු වේ. |
| (vi) | 1975 අංක 01 දරන වත්කම් බැරකම් ප්‍රකාශ කිරීමේ පනත ප්‍රකාරව සභිකවරුන් 16 දෙනෙකු විසින් පළමු වත්කම් බැරකම් ප්‍රකාශය ලබා දී නොතිබුණු අතර සභිකයින් 15 දෙනෙකු විසින් එම වාර්ෂික ප්‍රකාශ ලබා දී නොතිබුණි. | එම මන්ත්‍රීවරුන්ට සිහිකැඳවීම් යොමු කළ බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (vii) | අංක 11/2010 දරන පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛයේ 3.7 ඡේදයට පටහැනිව, ප්‍රාදේශීය සභාවේ ශ්‍රවණාගාරය 2015 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා අවස්ථා 10ක දී බාහිර පාර්ශව වෙත නොමිලේ ලබා දී තිබුණි. | සභාපතිගේ අනුමැතිය මත නොමිලේ ලබා දී ඇත. අනෙකුත් සියලු අවස්ථාවල දී ගාස්තු අයකරනු ලබයි . | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

(ආ) **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ----------------------- | -------------- |
| (i) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වගන්තියට අනනුකූලව, ප්‍රාදේශීය සභාව සතු මාර්ග 194 ක් ගැසට් කර නොතිබුණි. මාර්ග ඉන්වෙන්ට්‍රි ලේඛනය ද 2014 වර්ෂයෙන් පසු යාවත්කාලීන කර නොතිබුණි. | GIS තාක්ෂණයෙන් සිතියම්ගත කර මාර්ග ඉන්වෙන්ට්‍රිගත කිරීම හා මාර්ග ගැසට් කිරීම සිදු කරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ii) | 2013 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා අනුබෙදුම් කිරීමට අනුමැතිය ලබාදුන් ඉඩම් 12කට අදාළව අක්කර 21ක පමණ මාර්ග ප්‍රාදේශීය සභාව වෙත පවරාගෙන නොතිබුණි. | - එම - | - එම - |
| (iii) | ඉඩමක් කට්ටිකර විකිණීම සඳහා අනුමැතිය ලබා දීම වෙනුවෙන් ඉඩමක් පරීක්ෂාවේදී එහි පැවැති අනවසරයෙන් ඉදි කළ නිවාස 12කට එරෙහිව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙය අනුමැතියක් රහිතව අනුබෙදුම් කළ ඉඩමකි. අයදුම් පත්‍රයේ අඩුපාඩු සම්පූර්ණ කරන ලෙස ඉඩම් හිමිකරුට දන්වන බව. | අනවසර ඉදිකිරීම් පිළිබඳ පනත අනුව කටයුතු කළ යුතු වේ. |

**(ඇ) මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාහනයක එන්ජිම අලුත්වැඩියාව සඳහා තෝරා ගත් ආයතනයේ මිළ ගණන් නිර්දේශ කිරිමට ඩිපෝ ඉංජිනේරුවරයෙකු වෙත ඉදිරිපත් කර තිබුණි. එහෙත්, ඔහුගේ නිර්දේශය ලැබීමට පෙර තෝරා ගත් ආයතනයට රු.520,000ක් වූ ප්‍රසම්පාදනය පිරිනමා තිබුණි. | ඩිපෝ ඉංජිනේරුගේ නිර්දේශ නොමැති වුවද, ඔහුගේ නිර්දේශවලට අනුකූලව අළුත්වැඩියාව සිදුකර ආයතනයට ගෙවීම් කර ඇත. | ප්‍රසම්පාදන රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**(ඈ) වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2015 වසරේ පරිත්‍යාග ලෙස ලද රු.2,594,999 ක් වූ කම්පැක්ටර් ටේලරය ලද දිනයේ සිට නිෂ්කාර්යව පවතී. | කම්පැක්ටරයට කසළ වෙන්කර එකතු කළ නොහැකිවීම හා ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානය වෙත එය ධාවනය කිරීමේ අපහසුතාව නිසා භාවිතයට නොගැනේ. | වත්කම් අභාවිතව නොතැබිය යුතු වේ. |
| (ii) | ගිලන්රථයක් හා බොබ් කැට් යන්ත්‍රයක් 2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 2.1 ඡේදය පරිදි පවරා ගෙන නොතිබුණි. | මෙම වත්කම් පවරා ගැනීමට කටයුතු කරමින් පවතී. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (iii) | අබ්බාසි වත්ත ඉඩමෙන් පොදු කටයුතු සඳහා වෙන් කළ අක්කර 07ක පමණ කොටස සභාව වෙත පවරා ගෙන නොතිබුණි. | එම ඉඩම් කොටස පවරා ගැනීමට කටයුතු කරන බව. | එම පවරා ගැනීම කළ යුතු වේ. |

**(ඉ) කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ------------------------ | --------------------------- | -------------- |
| ගමක් හරහා ජල ව්‍යාපෘතියක් ඉදිකිරීමේ පළමු අදියර ලෙස ඉදිකළ ළිඳෙහි ජලය භාවිතයට නුසුදුසු විය. මේ නිසා ළිඳ ඉදිකිරීමට දරන ලද රු.909,710 ක් නිෂ්ඵල වියදමක් වී තිබුණු අතර ජල ව්‍යාපෘතියේ ඉතිරි කටයුතු කිසිවක් 2022 සැප්තැම්බර් දක්වාම සිදුකර නොතිබුණි. | ඉංජිනේරුවරයෙකුගේ උපදෙස් මත ළිඳ වටා වැලි පෙරණයක් (Sand Filter) සකස් කර එහි ජල සාම්පල පරීක්ෂාව සඳහා යොමු කර ඇති අතර මෙම ගිවිසුම දෙපාර්ශවයේ එකඟතාව මත අවලංගු කර ඇති බව. | වැය කළ මුදලට ප්‍රමාණවත් උපයෝජනයක් ලැබිය යුතු වේ. |

**(ඊ) මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| | ------------------------ | --------------------------- | --------------- |
| (i) | සභාවේ රියැදුරන් ලෙස වෙනත් තනතුරුවල සේවයේ නියුක්ත වූවන් 09 දෙනෙකු යොදවා තිබුණි. | රියදුරු තනතුරු අනුමත කර ගැනීම සඳහා ඉල්ලීම් කළ ද අනුමැතිය ලැබී නොතිබුණි. | අවශ්‍යතාව පරිදි පුරප්පාඩු සම්පූර්ණ කරගත යුතු වේ. |
| (ii) | ආදායම් පරීක්ෂක තනතුරේ පුරප්පාඩු 02ක් සඳහා 2020 වර්ෂයේ සිට කම්කරුවන් දෙදෙනෙකු යොදවා තිබුණි. | ආදායම් පරීක්ෂක තනතුරේ පුරප්පාඩු සම්පූර්ණ කර දෙන ලෙස ඉල්ලා ලිපි යොමු කර ඇති බව. . | - එම - |
| (iii) | කාර්ය මණ්ඩලය වැඩිකර ගැනීමට නොහැකි වීම නිසා 2014 - 2022 වර්ෂ අතර කාලය තුළ සේවා ගිවිසුම් මත 25 දෙනෙකු බඳවා ගෙන තිබුණි. | නව තනතුරු අනුමත කර ගැනීම සඳහා අනුමැතිය නොලද බැවින් සේවා අවශ්‍යතා මත ඔවුන් බඳවා ගෙන ඇති බව. | - එම - |

**1.5.11.26 යටියන්තොට ප්‍රාදේශීය සභාව**

**1.5.11.26.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | -------------------------- | ----------- |
| (i) | පරිගණක මිළ දී ගැනීමක් සඳහා ගිවිසුම්ගතව නොතිබිය දී රු.900,000ක වෙන් කිරිමක් ගිණුම්වල සිදුකර තිබුණි. | 2023 වර්ෂයේ නිරවුල් කරන බව. | ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ii) | ආදායම් වියදම් ගිණුමට මාරු කළ යුතු රු.1,583,588ක් වූ සමාලෝචිත වර්ෂයේ පොහොර නිෂ්පාදන ඌනතාව සමුච්චිත අරමුදලට හර කර තිබුණි. | - එම - | - එම - |
| (iii) | එකතුව රු.55,119,772ක් වූ ඉඩම් හා ගොඩනැගිලි 15ක් ගිණුම්ගත කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීක කරන බව. | - එම - |
| (iv) | කට්ටිකර විකිණීම නිම කළ ඉඩමකින් ලද රු.784,000ක් තැන්පත් ගිණුමෙන් ඉවත්කර ආදායමට බැරකර නොතිබුණි. එමෙන්ම, එම සත්‍ය විකුණුම්වලින් අයවිය යුතු රු.100,990ක් ලැබිය යුතු ආදායමක් ලෙස ගිණුම් ගතකර නොතිබුණි. | එම වටිනාකම් ඉදිරියේදී ලබා ගැනීමට නියමිත බව. | - එම - |

**1.5.11.26.2 අනුකූල නොවීම්**

**(අ) නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| ------------ | -------------------- | ------------------ | ---------------- |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | වසර 2 ක් ඉක්ම වූ රු.98,600ක ටෙන්ඩර් ඇප තැන්පතු නියාදනය කර නොතිබුණි. | සොයා බලා නිරවුල් කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**1.5.11.26.3 මූල්‍ය සමාලෝචනය**

**(අ) මූල්‍ය පාලනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ----------------------- | ---------------------- | -------------- |
| සමාලෝචිත වර්ෂයේ බැංකු ගිණුම් 2ක පැවති රු.13,723,816ක ශේෂය කෙටිකාලීන ආයෝජනයක හෝ යොදවා ආදායම් උපයාගැනීමට කටයුතු කර නොතිබුණි. | කෙටිකාලීන ආයෝජන යෙදවීමට සොයා බලා කටයුතු කරන බව. | අතිරික්ත මුදල් ආයෝජනය කර ආදායම් උපයා ගත යුතුය. |

**1.5.11.26.4 ආදායම් පරිපාලනය**

**(අ) ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | ---------------- | -------- |
| (i) | 2003 - 2010 වර්ෂ අතර කාලය තුළ කට්ටි කළ ඉඩම් 08ක සත්‍ය විකුණුම් මත ලැබිය යුතු මුදල 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ (1) වගන්තිය පරිදි අයකර නොතිබුණි. | විගණන මහ පෙන්වීම සැලකිල්ලට ගනිමින් අවශ්‍ය කටයුතු සිදුකරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ii) | වරිපනම්, අක්කර බදු, හා කඩ කුලී යන ආදායම් විෂයයන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට රු.1,358,488ක් අයවිය යුතුව තිබුණි. එම වටිනාකම තුළ වර්ෂ 01ත් වර්ෂ 05ත් අතර කාලයක් පැරණි රු.640,898ක ශේෂයක් ද, වර්ෂ 05කට වඩා පැරණි රු.22,060ක ශේෂයක් ද පැවැතිණි. | හිඟ මුදල් නොපමාව අය කිරීමට කටයුතු කරන බව. | හිඟ හිටි ආදායම් නොපමාව අය කර ගත යුතු වේ. |
| (iii) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති අංක 59 හා 67 අනුව 2021 හා 2022 වර්ෂවල දී ව්‍යාපාර බදු හා බලපත්‍ර ගාස්තු වෙනුවෙන් සමීක්ෂණයක සිදුකර නොමැති නිසා රු.860,326 ක් වූ එකතු කළ ආදායම වර්ෂයේ ආදායම ලෙස සලකා තිබුණි. | ඉදිරි වර්ෂය තුළ සමීක්ෂණයක් සිදු කරන බව. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (iv) | ප්‍රදර්ශිත දැන්වීම් පුවරු සමීක්ෂණය කර බිල් කිරීම වෙනුවට වර්ෂය තුළ එකතු කළ රු.97,075ක් වර්ෂයේ ආදායම ලෙස සලකා තිබුණි. | 2021 වර්ෂයේ දී සිදු කළ සමීක්ෂණය අනුව ලැබිය යුතු ආදායම් නිශ්චය කර ඇත. සංශෝධන ද කාලීනව සිදු කරන බැවින් 2022 වර්ෂයේදී ලද ආදායම එම වර්ෂයේ ඇස්තමේන්තුව ලෙස සැලකීම සාධාරණ බව. | සමීක්ෂණ සිදුකර දැන්වීම් පුවරු ආදායම් නිවැරදිව හඳුනා ගත යුතු වේ. |

**1.5.11.26.5 මෙහෙයුම් සමාලෝචනය**

**(අ) කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | --------------------- | ------------- |
| (i) | වසර 01ත් වසර 04ත් අතර පැරණි රු.6,820,484ක ශේෂ ණයහිමි ශේෂය තුළ පැවැතිණි. | නිරවුල් කිරීමට කටයුතු කරන බව. | ශේෂ නිරවුල් කළ යුතු වේ. |
| (ii) | පරිත්‍යාග ලෙස 2019 වර්ෂයේ ලද මාර්ග පිරිසිදු කිරීමේ යන්ත්‍රයක | එම යන්ත්‍රය සභාවේ අවශ්‍යතා හා නොගැළපේ. යන්ත්‍රයේ | සභාවේ අවශ්‍යතාවයට නොගැළපේ නම් සුදුසු පරිදි |

| | | |
|---|---|---|
| වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | ආරක්ෂාවට ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් කළ බව. | අපහරණය කළ යුතුය. |

**(ආ) මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | -------------------------- | -------------- |
| (i) | කිතුල්ගල ප්‍රදේශයේ 2021 වර්ෂයේ දී ඉදිකළ රු.1,950,822ක් වූ වෙළඳ කුටි 14ක් 2022 ඔක්තෝබර් වනවිටත් අභාවිතව පැවතුණි. | වෙළඳ කුටි 11ක බදු දීමේ කටයුතු අවසන් කර ඇති බවත්, ඉතිරි වෙළඳ කුටි 3 බදු දීමේ මූලික කටයුතු ආරම්භ කර ඇති බව. | වත්කම් අභාවිතව නොතැබිය යුතු වේ. |
| (ii) | යටියන්තොට හා කිතුල්ගල මාළු වෙළඳසැල් 03ක් බදු දීමේ දී අවශ්‍ය තක්සේරුව, පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් අනුව රජයේ තක්සේරුකරු මගින් ලබා ගෙන නොතිබුණි. එමෙන්ම, කිතුල්ගල මාළු වෙළඳසැල 2015 වර්ෂයේ සිට සිට 2021 වර්ෂය දක්වා අඛණ්ඩව එකම ලංසුකරුවකු වෙත බදු දී තිබුණි. | මේ පිළිබඳ ලබාදුන් මග පෙන්වීම අනුව ඉදිරි කටයුතු සිදු කරන බව. | ලද උපදෙස් අනුව කටයුතු කළ යුතු වේ. |

**(ඇ) මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ------------------------ | ----------- |
| (i) | සභාවේ පුරප්පාඩු 27 ක් පැවැති අතර, ඉන් තනතුරු 10ක් සඳහා සේවා ගිවිසුම් මත බඳවා ගෙන තිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කරගැනීම සඳහා පත්වීම් බලධරයා දැනුවත් කර ඇති බව. | අවශ්‍යතාව මත පුරප්පාඩු සම්පූර්ණ කළ යුතු වේ. |
| (ii) | සභාවේ සේවකයින් 33 දෙනෙකුගෙන් 1985 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලයට අදාළව රු.169,423ක් අයවිය යුතුව පැවතුණි. | හිඟ හිටි මුදල නිරවුල්කර ගැනීමට කටයුතු අරඹා ඇති බව. | හිඟ ණය නොපමාව අයකර ගත යුතු වේ. |

**(ඇ) වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ----------------------- | --------------- |
| (i) | සභාව සතු දේපළ 02ක් 2020 - 2022 වර්ෂ අතර කාලය තුළ බදු දී නොතිබීම නිසා එහි අවම ලංසු වටිනාකම වූ රු.302,500ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි. | ලබාදුන් මග පෙන්වීම අනුව කටයුතු කරන බව. | බදු දිය හැකි වත්කම්වලින් ආදායම් උපයා ගත යුතුය. |
| (ii) | රු.16,455,000ක් වූ වාහන 09ක සහ රු.3,200,000 ක් වූ බොබ්කැට් යන්ත්‍රයක අයිතිය පවරා ගෙන නොතිබුණි. | අබලි වාහන 9න් 02ක් අපහරණය කිරීමටත් ඉතිරි වාහන පවරා ගැනීමටත් කටයුතු ආරම්භ කර ඇති බව. | වත්කම්වල අයිතිය නිරවුල් කරගත යුතු වේ. |
| (iii) | රු.11,302,500 ක් වූ වාහන 07 ක්, බැකෝ යන්ත්‍රයක් හා ජල බවුසරයක් වසර 01 සිට වසර 13 දක්වා කාලයක සිට අක්‍රීයව පවතී. | අපහරණය කිරීමට අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇති බව. | වත්කම් අභාවිතව නොතැබිය යුතු වේ. |
| (iv) | සභාව සතු ඉඩම් 18 ක් 2017 අගෝස්තු 16 දිනැති අංක 04/2017 දරන සබරගමුව පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛයට අනුකූල නොවන ලෙස කමිටුවක් මගින් කළ රු.69,636,100ක තක්සේරුවක් මත ගිණුම්ගත කර තිබුණි. | රජයේ තක්සේරුව ලබාගෙන 2023 වර්ෂයේදී මෙම ගැටලුව නිරාකරණය කරගන්නා බව. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතු වේ. |

**1.5.11.27 රඹුක්කන ප්‍රාදේශීය සභාව**

**1.5.11.27.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ලැබිය යුතු උසාවි දඩ රු.65,500ක් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි. | 2023 ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කරන බව. | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතු වේ. |
| (ii) | රු.8,990,000 ක්වූ අක්.03, පර්. 27ක ඉඩම් 02ක්, අක්.03, රූඞ1, පර්. 3ක් වූ ඉඩම් 8ක් සහ මිනුම්කර නොතිබුණු ඉඩම් 02ක් ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (iii) | සමාලෝචිත වර්ෂයේ සිදුකළ ඉදිකිරීම්වල රු.1,845,176 ක් වූ සහතික කළ වැඩ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | - එම - | - එම - |

**(ආ) නොසැසඳුණු පාලන ගිණුම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයන් 05ක ශේෂ, උපලේඛන සමග සැසඳීමේදී රු.2,525,986 ක වෙනසක් පැවතුණි. | 2023 ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල සඳහන් සංඛ්‍යා, ප්‍රභව ලියවිලි සමග සැසඳිය හැකි විය යුතුය. |

**(ඇ) විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.57,034,945 ක් වූ ගිණුම් විෂයන් 15ක් වෙනුවෙන් උපලේඛන ඉදිරිපත් නොවුණි. | තවදුරටත් පරීක්ෂා කර නිවැරදි කරන බව. | විගණනය සඳහා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කළ යුතු වේ. |

**1.5.11.27.2 ආදායම් පරිපාලනය**

**(අ) ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | වරිපනම්, අක්කර බදු, කඩ කුලී, උසාවි දඩ හා මුද්දර ගාස්තු යන ආදායම් විෂයයන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට රු.48,412,864ක් අයවිය යුතුව තිබුණි. එම වටිනාකම තුළ වර්ෂ 01ත් වර්ෂ 05ත් අතර කාලයක් පැරණි රු.14,693,849ක ශේෂයක් ද, වර්ෂ 05කට වඩා පැරණි රු.1,914,427ක ශේෂයක් ද පැවැතිණි. | හිඟ මුදල අවම කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | හිඟ ආදායම් අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතු වේ. |
| (ii) | ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ කොටසක් වර්ෂ 02කට වැඩි කාලයක සිට බදු දීමට කටයුතු නොකිරීම නිසා රු.3,750,000ක ආදායමක් අහිමි වී තිබුණි. | බැංකුවකට බදු දීමට මහා සභාවේදී තීරණය වී ඇති බව. | වත්කම් අභාවිතව නොතැබිය යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (iii) | දැන්වීම් පුවරු 50ක් වෙනුවෙන් වර්ග අඩියකට රු.150 බැගින් රු.202,725ක ගාස්තු අයකර නොතිබුණි. | කඩිනමින් අය කරගන්නා ලෙස ආදායම් පරීක්ෂකවරුන් වෙත උපදෙස් ලබා දී ඇති බව. | හිඟ ශේෂ අයකිරීමට කටයුතු කළ යුතු වේ. |

**1.5.11.27.3 මෙහෙයුම් සමාලෝචනය**

**(අ) කළමනාකරණ අකාර්යක්ෂමතා**

| නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 05 කට වැඩි කාලයක සිට පැවත එන රු.256,462 ක ණයගැතියන් සහ රු.9,865,456 ක ණයහිමියන් නිරවුල් කර නොතිබුණි. | තවදුරටත් පරීක්ෂා කර නිවැරදි කරන බව. | දීර්ඝ කාලයක සිට පවතින ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. |

**(ආ) වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | රු.30,407,075ක් වටිනා වාහන 20ක් සහ වටිනාකම සඳහන් නොවූ බොබ්කැට් යන්ත්‍රයක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | පවරා ගැනීමේ කටයුතු අප්‍රමාදව සිදුකළ යුතු වේ. |
| (ii) | රඹුක්කන, කිරිවල්ලාපිටියේ 1986 වර්ෂයේ ඉදිකර තිබුණු මහල් 04ක ගොඩනැගිල්ලක් සඳහා කිසිදු අනුමැතියක් | මෙම ගොඩනැගිල්ල අයත් ඉඩම අපගේ වරිපනම් බල ප්‍රදේශයට අයත් නොවේ. එසේ වුවත්, ඉදි කිරීම් සම්බන්ධයෙන් පරීක්ෂා කර | අනවසර ඉදි කිරීම් හා මහජන අපහසුතා පිළිබඳ සැළකිලිමත් විය යුතු වේ. |

| | | |
|---|---|---|
| නොතිබුණි. එහි පැවැති අක්‍රමවත් වූ ජල අපහරණය හා මලපවහනය ප්‍රදේශවාසීන්ට පීඩාවක් ඇතිකර තිබුණි. | අවශ්‍ය කටයුතු සිදු කරන බව. | |

**(ඇ) කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බතඹුරය ක්‍රීඩා පිටියක තණකොල සිටුවීමේ කර්මාන්තය අවසන් වූ විගස, මාස 03ක නඩත්තු කාලයකින් පසු ගෙවිය යුතු රු.378,315ක් ද ගෙවා තිබුණි. මේ නිසා නඩත්තු කටයුතු ඉටු නොවීමෙන් බොහෝ ස්ථාන බොරලු සහිතව පැවැති අතර, තණකොළ කහ පැහැයෙන් යුක්ත විය. එමෙන්ම, ක්‍රීඩාපිටිය තුළ ජල සැපයුම් පැවැතිය දී පිටතින් ජලය රැගෙන ඒම සඳහා ගෙවීම් කිරීම ද ගැටළු සහගත විය. | අවසන් බිලට රැඳවුම් මුදල් ඇතුළත් වී නැති බවත්, නිසි පරිදි නඩත්තුව සිදුකර ඇති බවත්, නඩත්තු කාල සීමාවෙන් පසු නැවත කුළියට ලබා දීම සිදු වූ නිසා මෙම තත්ත්වය ඇති වූ අතර , ඉදිරියේදී නඩත්තු කිරීමට කටයුතු කරන බව දන්වමි. ක්‍රිඩාපිටිය තුළ ජල සැපයුම ප්‍රමාණවත් නොවූ බැවින් ජලය පිටතින් රැගෙන ඒම ඇස්තමේන්තුවට ඇතුළත් කළ බව. | කර්මාන්තය ගිවිසුම් ප්‍රකාරව ඉටු කිරීමෙන් පසුව ගෙවීම් කිරීමට කටයුතු කළ යුතු වේ. |

**(ඇ) මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 32 ක් පැවති අතර ක්ෂේත්‍ර කම්කරුවන් 04 දෙනෙකු ආදායම් පරීක්ෂක හා | පුරප්පාඩු සම්පූර්ණ නොවීම මෙයට හේතු වී තිබුණි. | අවශ්‍යතාව මත පුරප්පාඩු පිරවීමත්, අතිරික්තය ඵලදායි ලෙස අනුයුක්ත කිරීමත් කළ |

| | | |
|---|---|---|
| රියදුරු වැනි තනතුරුවලට අනුයුක්ත කර තිබුණි. සංවර්ධන නිලධාරීන් 04 දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණි. | | යුතු වේ. |

**1.5.11.28 වරකාපොළ ප්‍රාදේශීය සභාව**

**1.5.11.28.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ------------------- | ----------- |
| (i) | 2022 වර්ෂයට අදාළව 2023 වර්ෂයේ ගෙවන ලද රු.15,705 ක් සඳහා වෙන්කිරීම් සිදුකර නොතිබුණි. | නිවැරදි කිරීමට නොහැකි වූ බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ii) | කර්මාන්ත 97ක් සඳහා පළාත් සභාවෙන් ලැබිය යුතු හා කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු රු.50,654,679 ක්, ණයගැතියන් හා ණයහිමියන් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ දී නිවැරදි කරන බව. | - එම - |
| (iii) | 2021 වර්ෂයේ ප්‍රාග්ධනිත කර තිබුණු රු.16,600,229ක් වූ වත්කමක් 2022 වර්ෂයේ ගිණුම්වලින් අතහැර තිබුණි. | නැවත ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව. | - එම - |
| (iv) | මාර්ග සංවර්ධනය වෙනුවෙන් ලද රු.552,344 ක් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබිය දී තවදුරටත් තැන්පත් යටතේ දක්වා තිබුණි. | 2023 අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව. | ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (v) | සමාලෝචිත වර්ෂයේදී ඉටුකර නොතිබුණු රු.6,098,247ක් වූ කර්මාන්ත 12ක් හා අවලංගු කළ රු. 781,346ක කර්මාන්තයක් | ණයහිමි ලේඛනයෙන් ඉවත් කරන බව. | - එම - |

ණයහිමියන් යටතේ දක්වා තිබුණි.

| | | | |
|---|---|---|---|
| (vi) | පෙර වර්ෂවල හා සමාලෝචිත වර්ෂයේ ලද රු.2,299,593ක් ඒ ඒ වර්ෂවල ආදායමට නොගෙන පොදු තැන්පත් ලෙස ගිණුම්ගත කර තිබුණි. | හිමිකරුවන් ඉදිරිපත් නොවේ නම් ආදායමට ගන්නා බව . | - එම - |
| (vii) | රු. 27,023ක භාණ්ඩ ඌනතාව අයකරන තෙක්, ලැබිය යුතු ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | අයකිරීමට කටයුතු කළ යුතු වේ. |

**(ආ) නොසැසඳුණු පාලන ගිණුම**

| නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් 15 ක ශේෂ උපයෝගී ලේඛන සමඟ සැසඳීමේදී රු.59,128,143 ක වෙනසක් පැවතුණි. | දීර්ඝ කාලයක සිට පවතින මෙම වෙනස්කම් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන, ප්‍රභව ලියවිලි සමග සැසඳීමට හැකි විය යුතුයි. |

**(ඇ) විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු. 63,564,893 ක් වූ ගිණුම් විෂයයන් 06 ක් වෙනුවෙන් උපලේඛන ඉදිරිපත් කර නොතිබුණි. | උපලේඛන සකස් කරමින් පවතී. තැන්පතු විෂයයන් 3කට උපලේඛන නොමැති බව. | උපලේඛන ඉදිරිපත් කළ යුතු වේ. |

**(ඈ) ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

| | නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------- | ------------------------ | ------------- |
| (i) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19 වගන්තියට පටහැනිව, සභා අරමුදලින් මන්ත්‍රී ලිපි ශීර්ෂ සඳහා රු.74,800ක් වැයකර තිබුණි | ඔවුන්ගේ මහජන සේවාව පහසුවෙන් කර ගැනීම සඳහා එලෙස ලබා දෙන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ii) | සභා අරමුදලින් මහජන නියෝජිතයින් වෙත ණය මුදල් ලබා දීමට නෛතික ප්‍රතිපාදන නොතිබියදී, 2022 වර්ෂය තුළ සභිකයින් 14දෙනකුට රු.350,000 ක් ණය ලෙස ලබා දී තිබුණි. | 2022 වර්ෂයේ අත්තිකාරම් ලබා දී වාරික පහකින් 2022 වර්ෂය තුළදීම අයකළ බව. | ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**1.5.11.28.2 අනුකූල නොවීම්**

**(අ) නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ------------------------ | | ------------------ | ------------------- | ------------ |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ | | | | |
| (i) | මු.රෙ.371 | 2021 සහ 2022 වර්ෂවල ලබා දුන් රු.72,845 ක අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් පියවා නොතිබුණි. | එම අත්තිකාරම් පියවා නොතිබුණු බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ii) | මු.රෙ.571 | 2017 හා 2020 වර්ෂවලට අදාළ රු.304,822 ක තැන්පතු 10 ක් නියාදනය කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

### 1.5.11.28.3 ආදායම් පරිපාලනය

**(අ) ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වරිපනම්, අක්කර බදු, කඩ කුලී යන ආදායම් විෂයයන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට රු.5,094,991ක් අයවිය යුතුව තිබුණි. එම වටිනාකම තුළ වර්ෂ 01ත් වර්ෂ 05ත් අතර කාලයක් පැරැණි රු.2,297,337ක ශේෂයක් ද, වර්ෂ 05කට වඩා පැරැණි රු.2,507,454ක ශේෂයක් ද පැවැතිණි. | දේපළ තහනම් කිරීම, වරෙන්තු නිකුත් කිරීම, ආදී දෑ මගින් හිඟ අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අයකර ගැනීමට නොපමාව කටයුතු කළයුතුය. |

### 1.5.11.28.4 මෙහෙයුම් සමාලෝචනය

**(අ) කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | බැංකු ගිණුම් 02ක දෝෂ සහගතව සටහන් කර තිබුණු රු.74,747ක් නිරවුල් කර නොතිබුණු අතර ඉන් රු.70,897ක් වර්ෂ 11කට වඩා පැරණි විය. | නිවැරදි කිරීමට කටයුතු කර ඇති බව. | දෝෂ නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ii) | අංක 05/ 2010 දරන පළාත් පාලන චක්‍රලේඛය පරිදි ප්‍රජා අවශ්‍යතා මත වූ ප්‍රමුඛතා ලේඛනයේ අනුපිලිවෙළට මාර්ග තෝරා නොගෙන සමාලෝචිත වර්ෂය තුළ රු.740,562 ක් වැයකර මාර්ග 07ක් සංවර්ධනය තිබුණි. | ග්‍රාමීය මට්ටමින් මහජන නියෝජිතවරුන්ගේ ප්‍රමුඛතාව මත ඉදිරිපත් කරන යෝජනා සභාගත කර සංවර්ධනය කර ඇති බව. | අදාළ චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (iii) | සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව රු.25,999,860 ක් වූ ණයහිමි ශේෂය තුළ වසර 01ත් වසර 05ත් අතර රු.15,305,093 ක ශේෂද, වසර 5 ට වැඩි රු.1,011,286ක ශේෂ ද පැවතුණි. | පවතින ණයහිමි ශේෂ ඉවත් කිරීම සුදුසුද යන්න විමසීම් කර වහාම ගිණුමෙන් ගලපා ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කරන බව. | හිඟ ණයහිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (iv) | ස්ථාවර වත්කම් ලේඛනයේ ඇති ඉඩම් 17ක්, ට්‍රැක්ටරයක්, ට්‍රේලරයක් සහ බොබ්කැට් යන්ත්‍රයක් ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (v) | කොඩි කණු 30ක ඌනතාව හා කොඩි කණු 529ක වටිනාකම ගිණුම්ගතකර නොතිබුණි. | 2023 වර්ෂයේදී ගිණුම්ගත කරන බව. | ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. |

**(ආ) මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------- | --------------------------- | -------------- |
| (i) | සභාව සතු ත්‍රී වීල් රථයේ මයිලෝ මීටරය අක්‍රීයව පැවැති 2021 ජනවාරි මාසයේ සිට 2022 මාර්තු මාසය දක්වා කාලය තුළ ධාවනය කළ කි.මී. 7825ක නිවැරදිතාව තහවුරු කරගත නොහැකි විය. | මේ වනවිට නව මීටරයක් සවිකිරීමට කටයුතු කර ඇති බව. | කි.මී.7825ක නිවැරදිතාව තහවුරු කරගත යුතුය. |
| (ii) | පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ 11/2010 අනුව, ආදායම් ඉපයීමට හැකි යන්ත්‍රසූත්‍ර නොමිලේ ලබා නොදිය යුතු වුවද, සභාපතිවරයාගේ උපදෙස් පරිදි දළ වශයෙන් රු.3,361,500ක ආදායමක් උපයාගත හැකි යන්ත්‍ර පැය 747ක් නොමිලේ ලබා දී තිබුණි. එමෙන්ම, | විගණනයෙන් පෙන්වාදුන් පසු ඇස්තමේන්තුවක් අනුව වටිනාකම ගණනය කිරීමෙන් පසු ආදායමට ගැලපීමටත්, බැකෝ යන්ත්‍රයේ පිටවීම හා පැමිණීම පිළිබඳ ගේට්ටු වාර්තා නඩත්තු කිරීමටත් | චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | බැකෝ යන්ත්‍රයේ පිටවීම හා පැමිණීම පිළිබඳ ගේට්ටු වාර්තා නඩත්තු කර නොතිබුණි. | කටයුතු කරන බව. | |
| (iii) | අපද්‍රව්‍ය ඉවතලීමට සුදුසු ස්ථානයක් නොතිබීම නිසා 2016 වර්ෂයේ ලද ගලි බවුසරය 2022 දෙසැම්බර් දක්වාම ආදායම් උපයාගත නොහැකිව අභාවිතව පවතී. | ගලි බැහැර කිරීමේ ස්ථානයක් සභාව සතුව මේ දක්වා නොමැති බව. | ගලි අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ ස්ථානයක් ඉදිකළ යුතුය. |

**(ඇ) වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ----------------------- | ----------- |
| (i) | ට්‍රැක්ටරයක් වසර 10කට වැඩි කාලයක සිට අක්‍රීයව පවතී. | අපහරණය කරන බව. | අපහරණ කටයුතු ඉටු කළ යුතු වේ. |
| (ii) | රු.267,300ක් වූ කසළ බඳුන් ඇතුළු භාණ්ඩ 653ක් වර්ෂ 02කට වැඩි කාලයක සිට නිෂ්කාර්යව පැවැතිණි. | කසළ බඳුන් බෙදා දෙන බවත්, අනෙක් භාණ්ඩ නඩත්තු අවශ්‍යතා සඳහා ගබඩාවේ රඳවා ඇති බව. | භාණ්ඩ ඵලදායිව ප්‍රයෝජනයට ගත යුතු වේ. |
| (iii) | අක්කර 01ක් සහ පර්චස් 10ක් වූ ඉඩම් 02ක අනවසරයෙන් ඉදිකළ නිවාස සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | මේ පිළිබඳ ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | සභාව සතු වත්කම්වල ආරක්ෂාව තහවුරු කරගත යුතු වේ. |
| (iv) | වරකාපොළ ඔරලෝසු කණුව හා ඩිජිටල් නාම පුවරුව ඇති සභාව සතු ඉඩම් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. | රජයේ තක්සේරුව ලද වහාම වත්කම් ලේඛනයට ඇතුළත් කරන බව. | සභාව සතු ඉඩම් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කළ යුතු වේ. |

**(ඇ) ප්‍රසම්පාදනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කිසිදු ටෙන්ඩර් කැඳවීමක් රහිතව සභා අනුමැතිය මත රු.348,000කට ටයර් 04ක් මිල දී ගෙන තිබුණි. | ඉදිරියේදී සිදුකරන සියලු මිලදී ගැනීම් නියමිත ටෙන්ඩර් කැඳවීම් මත පමණක් සිදුකරන බවත්, | ටෙන්ඩර් පටිපාටි අනුව කටයුතු කළ යුතු වේ. |

**(ඉ) මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (i) | පෙර පාසල් පාලිකාවන්ගේ බඳවා ගැනීමේ පරිපාටිය අනුව සුදුසුකම් සහිත පාලිකාවන් සේවයේ යොදවා ගැනීම වෙනුවට කම්කරුවන් දෙදෙනෙකු එම තනතුරුවලට අනුයුක්තකර තිබුණි. | පෙර පාසල් පාලිකා තනතුරු 02හි පුරප්පාඩු සම්පූර්ණ කර නැති බව. | සුදුසුකම් මත පෙර පාසැල් පාලිකාවන් සේවයේ යෙදවිය යුතු බව. |
| (ii) | අනුමත කාර්යය මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු 25ක් හා එක් අයෙකුගේ අතිරික්තයක් පැවතුණි. අනුමත කම්කරු සේවක සංඛ්‍යාව ඉක්මවා කම්කරුවන් 22දෙනෙකු බඳවාගෙන තිබුණු අතර අනුමත කම්කරු සංඛ්‍යාවට ඇතුළත් 18දෙනෙකු යෙදවිය යුතු නියමිත කාර්යය වෙනුවට වෙනත් කාර්යයන්හි යොදවා තිබුණි. | අවශ්‍ය අනුමැතිය සහිතව ශ්‍රම පදනම මත සේවකයන් බඳවා ගෙන ඇත. කම්කරුවන්ගෙන් විශේෂ දක්‍ෂතා හා සුදුසුකම් ඇති අය පුරප්පාඩු වී ඇති තනතුරු සඳහා අනුයුක්ත කර ඇත්තේ නියමිත කාර්යයන් අඛණ්ඩව බාධාවකින් තොරව කරගෙන යාම සඳහාය. | අවශ්‍යතාව පරිදි පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (iii) | 2022 දෙසැම්බර් 31 දිනට මියගිය, ස්ථාන මාරු වී ගිය, සේවය අත්හිටුවන ලද හා සේවය අත්හැරගිය නිලධාරීන් 08 දෙනකුගෙන් අයවිය යුතු වසර 01ත් වසර 24ත් අතර කාලයක් පැරණි රු.117,339ක ණය ශේෂය අය වී නොතිබුණි. | මෙම ණය ශේෂය අයකර ගැනීම සඳහා කටයුතු කරමින් පවතින බව. | හිඟ සේවක ණය ශේෂ අය කළ යුතු වේ. |

**1.5.11.29 රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව**

**1.5.11.29.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ------------------------ | ----------- |
| (i) | සමාලෝචිත වර්ෂය අවසානයට ජංගම නොවන වත්කම් ශේෂය හා ප්‍රාග්ධන ගිණුමට ආදායමෙන් දායකවීමේ ශේෂය අතර රු.4,206,770 ක වෙනසක් පැවතුණි. | ගිණුම් ශේෂවල වෙනස සොයා නිවැරදි කරන බව . | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතු වේ. |
| (ii) | පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් 2022 දෙසැම්බර් මාසය සඳහා ප්‍රතිපූරණය කළ වැටුපට වඩා රු.276,550ක් වැඩියෙන් එම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | පිළිගන්නා බව. | - එම - |
| (iii) | ස්ථාවර තැන්පත් ගිණුමක සමාලෝචිත වර්ෂයට අදාළ පොළිය රු.1,713,973ක් ආදායමක් ලෙස සැලකීම වෙනුවට | ස්ථාවර තැන්පත් ගිණුම වැසීමත් සමග අදාළ මුළු පොළී වටිනාකම මුදල් පොත හරකර ආයෝජන ගිණුම බැර කළ බව. | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | සමුච්චිත අරමුදලට හරකර තිබුණි. | | |
| (iv) | ස්ථාවර තැන්පතු පොලී රු. 1,409,884ක් මුදල් පොතේ අඩුවෙන්ද, ආදායම් ණයගැති ස්ථාවර තැන්පත් පොලී ගිණුමේ වැඩියෙන්ද දක්වා තිබුණි. | - එම - | - එම - |
| (v) | 2021 වර්ෂයට අදාළ විගණන ගාස්තු ඌන වෙන් කිරීම් රු.119,200ක් සමාලෝචිත වර්ෂයේදී සමුච්චිත අරමුදලට ගැලපීම වෙනුවට වියදමට හරකර තිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුමෙන් ගැලපීම් කරනබව. | - එම - |
| (vi) | මූලධන ස්වරූපයේ රු.243,000 ක වියදම්, පුනරාවර්තන වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | දෝෂ සහිත වේ නම් මින් ඉදිරියට එම වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකා කටයුතු කරන බව | - එම - |
| (vii) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් 2023 වර්ෂයේ ගෙවූ රු.59,450ක් සඳහා වෙන් කිරීම් කර නොතිබුණි. | ඉදිරියේ දී මෙම ගෙවීම් සඳහා වෙන් කිරීම් කරන බව. | - එම - |
| (viii) | ගෙවූ නීතිඥ ගාස්තු රු. 50,000ක් විදේශීය ගමන් වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේ දී එසේ නොකිරීමට කටයුතු කරන බව. | - එම - |
| (ix) | රු.173,714ක් වූ ආයුර්වේද ඖෂධ තොගයක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට ගෙන නොතිබුණි. | පිළිගන්නා බව. | - එම - |
| (x) | 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ආධාරයක් රු.5,409,897ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | පිළිගන්නා බව. | - එම - |

(ආ) **නොසැසඳුණු පාලන ගිණුම්**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ----------------------- | ------------------------ | ----------- |
| (i) සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් ශේෂ 03 කට අදාළව මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂය හා භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව එම ශේෂය අතර රු.4,978,484 ක වෙනසක් පැවතුණි. | 2023 වර්ෂයේදී නිවැරදි කරන බව. | නොසැසඳීම් නිවැරදි කළ යුතු වේ. |
| (ii) සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් 07 ක ශේෂ උපයෝගී ලේඛන සමඟ සැසඳීමේදී රු.17,534,459ක වෙනසක් පැවතුණි. | ගිණුම් විෂයයන් 04ක් සඳහා අවසන් ගිණුම් වෙනුවෙන් ලබාදුන් තොරතුරු අනුව නිවැරදි බව හා ඉතිරි වෙනස්කම් පිළිගන්නා බව | - එම - |

(ඇ) **අධිකාරී බලය නොලත් ගනුදෙනු**

| නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------ | ------------------------- | ------------- |
| විශ්ව විද්‍යාල පාඨමාලාවක් හැදෑරීමට සභිකයෙකු වෙත රු.30,000ක් ගෙවා තිබීම, ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තියට අනුකූල නොවූ ගෙවීමක් විය. | මහ සභාවේ තීරණය මත ගෙවීම් කර ඇති බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**(ඇ) විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ------------------------ | ----------- |
| එකතුව රු.21,412,889 ක් වූ ස්ථාවර වත්කම් විෂයන් 02 ක නිවැරදිතාව තහවුරු කිරීම සඳහා උපලේඛන කිසිවක් ඉදිරිපත් නොවුණි. | පිළිගන්නා බව. | උපලේඛන ඉදිරිපත් කළ යුතු වේ. |

**1.5.11.29.2 අනුකූල නොවීම්**

**(අ) නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| ------------------------------ | ----------------- | ------------------ | ------------ |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.571 | රු.4,020,966ක තැන්පතු වර්ෂ 02ත් වර්ෂ 09 ත් අතර කාලයක් පොදු තැන්පත් නියාදනය නොකර රඳවා තිබුණි. | තැන්පත් ආදායමට ගැනීමට හෝ ආපසු ගෙවීමටත්, ආපසු නොගන්නා තැන්පත් රාජ්‍ය ආදායමට ගන්නා බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

**1.5.11.29.3 ආදායම් පරිපාලනය**

**(අ) ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ------------------------ | ------------- |
| වරිපනම්, අක්කර බදු, කඩ කුලී හා වෙනත් ආදායම් විෂයයන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට රු.12,132,855ක් අයවිය යුතුව තිබුණි. එම වටිනාකම තුළ වර්ෂ 01ත් වර්ෂ 05ත් අතර කාලයක් පැරණි රු.7,488,183ක ශේෂයක් ද, වර්ෂ 05කට වඩා පැරණි රු.4,113,342ක ශේෂයක් ද පැවැතිණි. | හිඟ මුදල අවම කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | හිඟ ආදායම් නොපමාව අයකළ යුතුය. |

**1.5.11.29.4 මෙහෙයුම් සමාලෝචනය**

**(අ) කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ----------------------- | -------------- |
| (i) | යාවත්කාලීනව දේපළ තක්සේරු නොකිරීම නිසා අක්කර 6 පර්චස් 21ක් වූ ඉඩම් 10ක වටිනාකම රු.68,947ක් ලෙස ගිණුම්වල දක්වා තිබුණි. | 2023 වර්ෂයේ දී තක්සේරුවක් සිදුකරන බව. | දේපළ තක්සේරු කර ගිණුම්ගත කළ යුතු වේ. |
| (ii) | වාහන ආදායම් බලපත්‍ර ලබා ගැනීමට ප්‍රමාද වීම නිසා රු.28,105ක් දඩ ලෙස ගෙවා තිබුණි. | වගකිව යුතු අයගෙන් එම මුදල් අය කරන බව . | වගකිව යුතු අයගෙන් අය කළ යුතු වේ. |
| (iii) | ඉඩම් 07 ක වටිනාකම් තක්සේරුකර ගිණුම්වලට ගෙන නොතිබුණි. | සමීක්ෂණ සිදුකිරීමෙන් පසු ඉදිරි කටයුතු සිදුකරන බව. | නිවැරදිව ගිණුම් ගත කළ යුතු වේ. |

**(ආ) මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ----------------------- | -------------- |
| (i) | පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ උපදෙස් පරිදි තෙවසරකට වරක් මස් හා මාළු වෙළඳ සැල් සඳහා අවම ලංසු මුදල රජයේ තක්සේරුකරු ගෙන් ලබා ගෙන නොතිබුණි. | රජයේ තක්සේරුව ලබා ගැනීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතු වේ. |
| (ii) | කඩ කාමර 40ක් සඳහා 2022 වර්ෂයට ගිවිසුම්ගත වී නොතිබුණි. | පැහැදිලිව පිළිතුරු සපයා නොතිබුණි. | ගිවිසුම්ගත විය යුතු වේ. |
| (iii) | විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් ගේ උපදෙස්වලට අනුකූල නොවන ලෙස අනුමැතියක් රහිතව 2020 සිට 2022 දක්වා වර්ෂවල දී නව වීථි ලාම්පු 940 ක් සවිකර තිබුණි. | මේ සම්බන්ධව අප ආයතනය දැනුවත් වී නොමැති බව . | අනුමැතිය මත වීථි ලාම්පු සවිකළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (iv) | අනවසර ඉදිකිරීම් පිළිබඳ 2014 වර්ෂයේ සිට 2022 සැප්තැම්බර් දක්වා ලද පැමිණිලි 78කින් 63ක් විසඳා නොතිබුණි. | එම අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් සොයා බලා කටයුතු සිදුකරන බව. | අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් නොපමාව ක්‍රියාකළ යුතු වේ. |

**(ඇ) වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | -------------------------- | ----------------------- | ----------- |
| (i) | 2021 මූල්‍යා ප්‍රකාශන අනුව සභාව සතු ඉඩම් 94ක් හා ළිං 170ක් පැවැතිය ද, 2022 වර්ෂයේ වත්කම් සමීක්ෂණය අනුව සභාව සතු වත්කම් ලෙස ඉඩම් 45ක් හා ළිං 13ක් පමණක් හඳුනාගෙන තිබුණි. | 2023 වර්ෂයේ දී වත්කම් සමීක්ෂණයක් කරන බව. | වත්කම් සමීක්ෂණය කළ යුතු වේ. |
| (ii) | ලියාපදිංචි අංක රහිතව අක්‍රීය තත්ත්වයේ පවතින වාහන 7ක් සහ වටිනාකම රු.2,104,027ක් වූ අබලි වාහන 5ක් සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | අපහරණ ක්‍රියාවලිය මේ වන විට සිදු කරමින් පවතින බව . | සුදුසු පරිදි අපහරණය කිරීම හෝ අලුත්වැඩියා කිරීම කළ යුතුය. |

**(ඇ) මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | -------------------------- | -------------- |
| (i) | සභාවේ 133 දෙනෙකු වූ අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 31ක් හා අතිරික්ත 06ක් පැවතුණි. අනුමත කාර්ය මණ්ඩලයේ 23 දෙනෙකුගේ තනතුරු දරන්නාට පෞද්ගලික වන සේ අනුමත කළ තනතුරු විය. | අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට මු.රෙ.71 අනුව ඉල්ලීම් කළ ද, ඊට අනුමැතිය ලැබී නොමැති බව. | අනුමත පුරප්පාඩු සම්පූර්ණ කර අතිරික්තය ඵලදායී ලෙස අනුයුක්ත කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ii) | නිලධාරීන් 04 දෙනකුගෙන් අයවිය යුතු රු.342,211ක ණය ශේෂය වසර 03ත් වසර 24 ක් අතර කාලයකින් පැරණි විය. | ණය මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිග ණය මුදල් නොපමාව අය කළයුතු වේ. |

**(ඉ) කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

**-------------------------------------**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------ | -------------------------- | -------------- |
| රුවන්වැල්ල මධ්‍යම පුස්තකාලයේ අලුත්වැඩියා කටයුතු නිම වී නොතිබීම නිසා එම පුස්තකාලය ඩිජිටල්කරණය සඳහා ලබා දී තිබුණු රු.1,173,419 ක උපකරණ අභාවිතව පැවතිණි. | මෙම කර්මාන්තයට අදාළ ගිවිසුම අවලංගු කර ඇති අතර නැවත ඇස්තමේන්තු සකස් කර සහය වීමේ කමිටුව වෙත ඉදිරිපත් කර ඇති බව. | වත්කම් අභාවිතව නොතැබිය යුතු වේ. |